# බුදු දහමේ අධ්‍යාත්මය

## (කරණීය මෙත්ත සූත්‍රය)



ශ්‍රී කල්‍යාණධම් ග්‍රන්ථකාර මණ්ඩලය

# බුදු දහමේ අධ්‍යාත්මය

(කරණීය මෙත්ත සූත්‍රය)

ශ්‍රී කල්‍යාණධම්ම ග්‍රන්ථකාර මණ්ඩලය

ග්‍රන්ථ මාලා අංක 1

# බුදු දහමේ අධ්‍යාත්මය

(කරණීය මෙත්ත සූත්‍රය)

සැකසුම හා ප්‍රකාශනය

**ශ්‍රී කල්‍යාණධර්ම ග්‍රන්ථකාර මණ්ඩලය**

මුද්‍රණය

SRIDEVI

ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
27, පැපිලියාන පාර
නැදිමාල
දෙහිවල

| | | | |
|---|---|---|---|
| පළමුවැනි | මුද්‍රණය | 1979 | ජූලි |
| දෙවැනි | මුද්‍රණය | 1988 | මැයි |
| තෙවැනි | මුද්‍රණය | 1998 | මාර්තු |
| සිව්වැනි | මුද්‍රණය | 2001 | මැයි |
| පස්වැනි | මුද්‍රණය | 2004 | අප්‍රේල් |
| සයවැනි | මුද්‍රණය | 2006 | ජනවාරි |

ISBN 955 - 8414 - 04 - 2

සියලු හිමිකම් ප්‍රකාශකයන් සතු ය.

**ශ්‍රී කල්‍යාණධම්ම ග්‍රන්ථකාර මණ්ඩලය**

417, බෞද්ධාලෝක මාවත,

කොළඹ - 7.

දු. ක. - 2696494

# අපේ ගෞරවය

ජීවිතය පිළිබඳ තතු පහද දීම සඳහා බුදු දහමේ පෙන්වන කරුණු නිවැරැදි ව වටහා ගෙන ඊට අනුව පිළිපැදීම ජීවිත රසය භුක්ති විඳීම සඳහා උපකාර වන එක ම මග බව නුවණැති ලෝකයා තුළ ස්ථිර වූ මතයකි. බුදු දහමේ පවසා ඇති කරුණු තේරුම් ගෙන ඇති ප්‍රමාණය ජීවිත රසය භුක්ති විඳින ප්‍රමාණයට අනුව පැහැදිලි වන්නකි.

මිනිසා සැනසිල්ලෙන් ඈත් වූ අසහනකාරී ජීවිත පරිහරණය කරන්නකු බවට පත් වී සිටී. එයට හේතුව බුදු දහමෙහි පෙන්වන සැනසිලිදායක ධර්ම ජීවිතය සමග යොද ගන්නා ක්‍රම හා ඒවා මැනවින් පැහැදිලි ව දන ගැනීමට නිසි සහාය නැති කම විය හැකි ය. බුදු දහමෙහි ඇතුලත් ධර්ම ජීවිත සැනසිල්ල සඳහා යොද ගත යුතු ආකාර සරල බසින් පැහැදිලි වන්නේ නම් එම අඩුව පිරිමසා ගැනීමට සහායක් වනු ඇත.

මෙම සත්පුරුෂ අදහස සිතේ මතු වූ **ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ආදි කර්තෘ රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මාහිමි පාණන්වහන්සේ** විසින් ශ්‍රී කල්‍යාණධර්ම ග්‍රන්ථකාර මණ්ඩලය මෙම කරුණෙහි ලා යොමු කරවන ලදී. එම ඇරයුම ගෞරව පෙරදැරිව පිළිගත් අප මණ්ඩලය විසින් එම පොත් පෙළේ මුල් පොත අවසන් කර උන්වහන්සේට පිළිගන්වන ලදී.

ගෞරවණීය හිමිපාණෙනි, "බුදුදහමේ අධ්‍යාත්මය" නමින් පොත් පෙළක් ලිවීම සඳහා අපගේ සිත් අවදි කළ ඔබ වහන්සේට පින් සිදු වේවා. මිනිස් කමෙන් ඉටුවිය යුතු යුතුකමක් ඉටුකර ගැනීම සඳහා එම කෘත්‍යය අපි උපකාර කර ගතිමු.

මෙම ධර්ම පාඨක පින්වතුන්ගේ සිත්වලට කාවැදී ඔවුන්ගේ සිත්වලින් මතුවන සැනසිලිදායක චිත්ත රැල්ලක් පාසා ඔබ වහන්සේගේ ජීවිතයට පුණ්‍යමය අයිතිය ලැබේවා යනු අප මණ්ඩලයේ ප්‍රාර්ථනයයි.

මෙයට,

**ශ්‍රී කල්‍යාණධර්ම ග්‍රන්ථකාර මණ්ඩලය.**

අංක : 417
බෞද්ධාලෝක මාවත,
කොළඹ - 7
1979 ජූලි 1

## පොත ගැන...

බුදුරජාණන් වහන්සේගේ තෙසැත්තෑ ඤාණ අතර අර්ථසංදර්ශන ඥානය සබ්බඤ්ඤුත ඤාණයට අනුගත ඥානමහිමයෙකි.

**"නානාධම්මප්පකාසනතා පඤ්ඤා අත්ථ සංදස්සනෙ ඤාණං"** යනුවෙනි ඒ නිර්දේශ වී ඇත්තේ. එහි ධම්ම නම් කරුණුය. තේරුම්ය. එනම් පරිඥෙය්‍ය තත්ත්වයයි. යම් දෙයක දත යුතු තාක් කරුණු ඇත්නම් ඒ සියල්ල නිරවශේෂයෙන් එක් පැහැර පෙනීයන ගතිය මේ අර්ථසංදර්ශන ඥානයෙහි ස්වලක්ෂණය වේ. එහි කිසි ගැටළුවක් පැටලුමක් බුදුරජාණන් වහන්සේට නැත. නො පෙනී සැඟවී ගත් අතිරික්තයක් නැත. ලොව පවත්නා වස්තු ජාතිය සැලකිය යුත්තේ නානාවිධ අර්ථයන් පුරාගත් අර්ථ මඤ්ජුසා වශයෙනි. අර්ථකෝෂ වශයෙනි. සාමාන්‍ය පෙනුමට එහි පෙනී යන්නේ ඒකදේශයකි. අසනීපකාරයා කෙඳිරි ගාන්නේ තමන්ට දැනෙන රිදුමක් - වේදනාවක් - අමාරුවක් ගැනය. ඔහුගේ දැනීම රිදීම පමණය. වෛද්‍ය විශාරදයා ඥාතපරිඥා වශයෙන් එහි නිදානයේ පටන් හේද උපාදේය සියලු තත්ත්වයන් දක්නේය. වෙදතුමා ප්‍රතික්‍රියා නියම කරන්නේ රිදෙන තැන බලාගෙන නොවේ. නිදානය බලාගෙනය. දෝෂ කෝපය දකිමිනි. ඒ සඳහා කළයුතු දෙය මෙන්ම හළයුතු දෙයද ඥානගතිකව නියම වෙයි. ආවස්ථික වශයෙන් තීරණ පරිඥා ද, ප්‍රහාන පරිඥා ද මෙහි ඇත.

බුදුරජාණන් වහන්සේගේ අර්ථසංදර්ශන ඥානයට අනුයාත වෙමින් අපත් බැහැවිය යුත්තේ යම්තමින් හෝ මේ එළිය දල්වා ගැනීමට ය. පෙට්ටියක - බඳුනක තැන්පත් වී වැසී ඇති දේ මේ මේ යයි වටහාගත හැක්කේ එහි වැසුම් ඉවත්කොට පිරික්සුමෙනි. ගතයුතු දේ මේය, කළයුතු දේ මේ යයි ඒ පරීක්ෂණයේදී ප්‍රත්‍යක්ෂ වන්නේය. හැම දෙයකම ඇතුල්තතු නියමයෙන් දැනගත හැක්කේ ඥානමනසිකාරයෙනි. හළයුතු දේ හැරීමටත් කළයුතු දේ කිරීමටත්, අර්ථසාධක එළිය එයින් ලැබෙයි.

**ශ්‍රී කල්‍යාණධර්ම ග්‍රන්ථකාර මණ්ඩලය** සම්බන්ධයෙන් නිකුත් කිරීමට අදහස් කළ **"බුදු දහමේ අධ්‍යාත්මය"** යන අර්ථපූර්ණ උපන්‍යාශයෙන් යුත් ග්‍රන්ථය මට කියවන්නට ලැබුණේ යම්තමින්

එක් වරෙකි. එසේ වූයේ එයට ලැබුණු කාලය සීමිත වූ හෙයිනි. එක්වරක් කියවීමෙන් මෙහි කරණප්‍රකාරය වටහා ගැනීම අපහසු බව මා කියන්නේ විශිෂ්ඨ ප්‍රතිභාණයකින් ග්‍රන්ථනය වූ අපූර්ව පොතක් හෙයිනි. එහි අර්ථරසය විඳ ගැනීමට මතු ලැබේවා. අර්ථසංදර්ශන ඥානයට බැහැවී ගැන්මේ ආනිසංස ඵලයක්සේය, මේ පොත කියවද්දී මගේ සිතට ඇතිවූ හැඟීම. මෙහි ධර්ම විවරණයේදී ධර්මවිශාරදයන්ගේ සිත් ගවනා වාක් ප්‍රයෝග හා ධර්ම විග්‍රහ දක්නට ලැබීම පොතේ නමට අනුරූප කරණප්‍රකාරය විය හැකිය. **"බුදු දහමේ අධ්‍යාත්මය"** යන නමම එසේ නැගෙන ප්‍රශ්ණයන්ට විසඳුම වනු ඇතැයි සිතමි.

ශ්‍රී කල්‍යාණධර්ම ග්‍රන්ථකාර මණ්ඩලය යන පොදු නමකින් පොතේ නිෂ්පාදකත්වය හඳුන්වා ඇත්තේ මෙහි අගය පොදු බවට පත් කිරීමේ ධර්ම ප්‍රාර්ථනාවෙන් විය යුතුය. ඒ එසේ වුවත් ශ්‍රී කල්‍යාණ ධර්ම පෙරමුණ අනුබද්ධ සියල්ලෙහි නිර්මාතෘ නියාමකවරයා මා පෙහෙළිකරන්නේ උතුරණ සතුටිනි. එහි කිසි ඇවතක් නොවේවා. මේ ධර්ම වාසනා පෙරහැර තව තව විසිතුරු වේවා. මේ සත්පුරුෂ එකතුව යාව නිබ්බාණ වේවා.

මෙයට - කාරුණික

**කඩවැද්දුවේ ජිනවංශ ස්ථවිර**

ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රමය,
ගල්දූව - කහව.
1979 ජුනි 14 වැනි දින

# පටුන


| පරිච්ඡේදය | පිටුව |
|---|---|
| 1. හැඳින්වීම හා නිදනය | 1 |
| 2. සැනසිල්ල මතුකරන අත්ථ කුසලය | 9 |
| 3. අත්ථ කුසලය සකස් වූ සිතේ පහළවන ලකුණු | 31 |
| 4. අත්ථ කුසලය සකස් වූ සිත බාහිර ලෝකයා සමග ක්‍රියා කරන අයුරු | 45 |
| 5. අත්ථ කුසලය සකස් වූ සිතේ පවතින මෛත්‍රී ශක්තිය | 53 |
| 6. අත්ථ කුසලය පදනම් වී සැදුන මෛත්‍රී ගතිය සත්වයන් පිළිබඳ පොදුවේ යොමුවන අයුරු | 65 |
| 7. අත්ථ කුසලය සකස්වන සිතේ ලෝකයා පිළිබඳ පහළවන පැතුම | 77 |
| 8. අත්ථ කුසලය සිතේ සකස් වීමෙන් පසුව ලෝකය තුළින් ඔහු බලාපොරොත්තුවන පැවතුම් ස්වරූප | 85 |
| 9. අත්ථ කුසලය සකස් වූ සිත තුළින් ලෝකයා දෙසට යොමුවන ආසිරි | 91 |
| 10. අත්ථ කුසලය සකස් වූ සිතේ මතුවන පරිශුද්ධ භාවයේ ලක්ෂණ | 97 |
| 11. අත්ථ කුසලය සකස් වූ සිතට හිමිවන සැපයේ ස්ථිරත්වය සකස්වන ආකාරය | 107 |

# බුදු දහමේ අධ්‍යාත්මය

(කරණීය මෙත්ත සූත්‍රය)

## 1 වැනි පරිච්ඡේදය

සියල්ලෙහි පැවැත්මට උපකාර වෙමින් මතුවන ශක්ති ස්වරූප හැඳින්වීම සඳහා 'ස්වභාව ධර්මය' යන වචනය ව්‍යවහාරයට ගෙන තිබේ. බෞද්ධයන් විසින් **"බුද්ධ ධර්මය"** යනුවෙන් ව්‍යවහාර කරනු ලබන්නේ බුදුපියාණන් වහන්සේ විසින් දේශනා කරන ලද "ස්වභාව ධර්මය" පිළිබඳ විග්‍රහය යි. මේ වචන දෙකෙහි ඇති වෙනස පිළිබඳ නිවැරැදි අවබෝධය ලබාගැනීමට ධර්ම යන වචනයට අයත් නිවැරැදි අර්ථය පැහැදිලි කරගත යුතු ය. වස්තුවක පවතින ගති ස්වරූප හැඳින්වීමට ධර්ම යන පදය යොදා ගෙන තිබීම වැරදි නො වේ. එහෙත් එහි පැහැදිලි අර්ථය දැනගැනීම සඳහා එයින් ලැබෙන උපකාරය අල්පය. විවිධ ආකාරවල ශක්ති ස්වරූප, ඒ ඒ වස්තුවල විවිධ ප්‍රමාණවලින් යුක්තව ගොනු වී තිබෙන බව අපි දනිමු. යකඩයේ ස්වභාවය තද ගතියයි. එම තද ස්වභාවය යකඩයට හිමි ශක්තියක් වශයෙන් අපි පිළිගෙන සිටිමු. ව්‍යවහාරයට අනුව යකඩය පිළිබඳ එම තීරණය ගැනීමට සිදු වී තිබේ. එහෙත් බුද්ධ ධර්මයට අනුව කෙරෙන වෙනස් ස්වරූපයක් මතුවන්නේ ය. යකඩය නමැති සම්මුති නාමය තද ගතිය නමැති ධර්ම ස්වරූපයේ

උපකාරයෙන් දරා සිටින බව බුදු දහමට අනුව කළ යුතු විග්‍රහය යි. මෙයින් පෙන්වූයේ යකඩයේ තද ගතිය තිබෙනවා නොව තද ගතිය නිසා යකඩය යන නාමය ලැබී තිබෙන බව ය. එහි ඇති තද ගතිය ඉවත් කළ විට යකඩය කියා යමක් එහි නැති බව දක්ක හැකිය. මෙහි දක්වූ තද ගතිය යකඩය යන සම්මුති නාමය ලැබීමට හේතු වී ඇති බැවින් තද ගතිය යකඩය යන සම්මුති නාමය දරා සිටින ධර්මය බව පිළිගත යුතු ය. මෙයට තව නිදසුනක් ගන්නේ නම් සොරකු යයි සම්මත වූ පුද්ගලයා තුළ අන්‍යයන් සතු දේ අනවසරයෙන් ගැනීමේ ස්වරූපය තිබෙන බව දක්විය හැකි ය. ලෝභය මුල් වී කෙරෙන එම ක්‍රියාව සියල්ලන් විසින් ම පිළිකුල් කැරෙන බැවින් සොරා සමාජයෙන් ඉවත් කර ගැනීමට සුදුසු ලකුණු ලැබූ පුද්ගලයෙකි. සොරාගේ ස්වභාවය සොරකම් කිරීම යයි පිළිගෙන තිබෙන බැවින් ශිෂ්ට සමාජය ඔහුව පිළිකුල් කරනු ඇත. බුදු දහමට අනුව පුද්ගලයාව පිළිකුල් කිරීමට ඉඩක් නො ලැබේ. පුද්ගලයා සොරාය යන සම්මුතිය මත රඳවා දරා සිටින්නේ ඔහුගේ සිතේ ක්‍රියා කරන අධික ලෝභය නමැති ධර්මය යි. අන්සතු දේ ගැනීම සඳහා ඔහුගේ සිත කුලුගන්වන ලෝභය නිසා සොරා යන සම්මුති නාමය ලැබී ඇත. එම ගතිය ඉවත් කළ විට ඒ පුද්ගලයා ශිෂ්ට සමාජයට ගැලපෙන නිදෙස් කෙනකු වනු ඇත.

මේ ආකාරයෙන් සිතන විට සොරාය කියා වෙන් කර ඉවත් කළ හැකි කෙනකු නැති බව පෙනෙන අතර ඔහු සොරකු බවට පත්කළ ධර්ම ස්වරූපය පමණක් ඉවත් විය යුතු බව පැහැදිලි වේ. සිහි කටයුතු තවත් කරුණෙකි. සොරා යන සම්මුති නාමය ඔහුට හිමිවිය යුත්තේ එම ක්‍රියාවේ යෙදෙන අවස්ථාවට පමණි. එක් අවස්ථාවක සොරකමක යෙදුණු පුද්ගලයකු තවත් අවස්ථාවක දන්දීමේ ක්‍රියාවක යෙදෙනවා ඇත. එම ක්‍රියාව සිදුවන අවස්ථාවේදී "සොරා දනයක් දෙනවා" ය කියා හැඳින්වීමට කිසිදු ඉඩක් නැත. එම අවස්ථාවේ ඔහුව හැඳින්වෙන්නේ "දායකයා" යනුවෙනි. එහෙත් ඔහු නිතර ම එම නාමයට හිමිකරුවෙක් ද නො වේ. දායකයා යන සම්මුති නාමය හිමිවීමට හේතු වූයේ ශ්‍රද්ධාව - ත්‍යාගශීලී භාවය යන ධර්ම මතු වී ක්‍රියාවේ යෙදෙන බැවිනි. යමකු හැඳින්වීමේ සම්මුති නාමය මතුවන්නේ එම ක්‍රියාවට

උපකාර වන ධර්ම ස්වරූපවල උපකාරයෙන් බව දත් පැහැදිලි යයි සිතමු. මෙම නිදසුන්වල උපකාරයෙන් පැහැදිලි වන්නේ "ස්වභාව ධර්මය" යන පදයෙන් ආත්මීය හැඟීම් මතුකර දක්වන බව හා "බුද්ධ ධර්මය විසින්" ස්වභාව ධර්මයේ යථා තත්වය පැහැදිලි කර මතුකර පෙන්වන බව ය.

බුද්ධ ධර්මය යනුවෙන් ධර්ම හැඳින්වීමට උපකාර වූ හේතුව ද සොයා බැලිය යුතු ය. සැනසිල්ල සාද දෙන අර්ථවත් ජීවිතයක් සකස් කර ගැනීමේ ක්‍රම නිවැරදිව වටහාගෙන තිබීම, බුද්ධිය යනුවෙන් පිළිගත යුතු ය. ජීවිතයක් තුළ පවතින අනර්ථවත් ධර්ම ස්වරූප පැහැදිලි වන්නේ දුක් විඳීම වැඩි වී තිබෙන පමණට ය. සැනසිල්ලේ ජීවත්විය හැකි ශක්තිය පවතින පමණට එම ජීවිතය අනර්ථයෙන් බේරී ක්‍රියා කිරීමට උපකාර වන ධර්ම ස්වරූපවලින් යුක්ත වූවක් බව පිළිගත හැකි ය. සත්වයාට දුක් දීමට හෝ සැප දීමට හෝ ලොව පහළ වී ඇති කිසිවක් නැත. ඒ ඒ වස්තූන්වල පවතින ක්‍රියා, හැඩරුව ආදිය ඒවායේ පැවැත්මට උපකාර පිණිස එක් වී තිබේ. එම වස්තූන් තමාගේ සැනසිල්ලට හේතුවන අයුරින් ඇසුරු කිරීමේ හැකියාව යමෙකුට තිබේ නම්, ඔහු බුද්ධියෙන් යුක්ත වූවෙකි. යම් වස්තුවක් හොඳ හෝ නරක හෝ වශයෙන් තීරණය වී තිබේ නම් බුද්ධිය ඉදිරියේ එම තීරණය වෙනස් කිරීමට සිදුවන්නේ ය. කෙනකු හොඳ වශයෙන් පිළිගන්නා වස්තුව තව කෙනෙකුට නරක්විය හැකි ය. යමක් හොඳනම් එය කාටත් සාධාරණ විය යුතු ය. කෙනකුට එය නරක් විය නො හැකි ය. හොඳ නරක වශයෙන් ඒ ඒ පුද්ගලයන් වස්තු බෙදන්නේ, ඒ ඒ වස්තුවල තිබෙන හොඳක් හෝ නරකක් හෝ නිසා නොව එම වස්තුවේ තිබෙන ස්වභාවික ධර්ම ස්වරූප ඒ ඒ පුද්ගලයන් විසින් පිළිගත් ආකාරවල වෙනස් ස්වරූප නිසා ය. යමක් නරක් වන්නේ එම වස්තුව තමාට හොඳක් වන අයුරින් පරිහරණය කිරීමට නො දන්නා කම නිසා බව බුද්ධියෙන් දෙන තීරණයයි. සිතට සම්බන්ධ වන නිමිත්ත සමග පීඩාවට පත් නො වන අයුරින් සිත ක්‍රියා කරවා ගැනීමට යෙදිය යුතු උපක්‍රම දැනීම බුද්ධිය බව කලින් සඳහන් කළෙමු. ඒ උපකාරයෙන් මතුවන හැඟීම් කිසිවක් දුක් වින්දනයට හේතු නො වනවා ඇත. එබැවින් බුද්ධියෙන් පැහැදිලි කෙරෙන්නේ දුක් හා සැප, පරිහරණයේ හරි

වැරදි කමින් මතුවනවා විනා, වරද පැවරිය හැකි වස්තුවක් නැති බව යි. බුද්ධිය යනු එම තීරණය යි. ලෝකයට අයත් සියලු ධර්ම ස්වරූප තමාට දුක් නො දෙන ආකාරයෙන් පරිහරණය කිරීම සඳහා පිළිපැදිය යුතු ක්‍රම හා එක්කර ගතයුතු ධර් පෙන්වා කළ දේශනාව "බුද්ධ ධර්මය" නමින් හැඳින්වේ. එකී ක්‍රම ඇසුරු කරන්නා තුළ බුද්ධිමත් ජීවිත ස්වරූපය සකස් වන්නේ ය. ඔහු බෞද්ධයෙකි.

බුදු දහමේ අධ්‍යාත්මය යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද? බුද්ධ දේශනාව සම්මුති පරමාර්ථ වශයෙන් කොටස් දෙකකට බෙදී තිබෙන බව අපි දනිමු. සම්මතයෙන් තීරණය වී ඇති ශිෂ්ට පැවතුම්වලට පටහැනි නො වී, ජීවිතය පවත්වමින් ශිෂ්ට සමාජයක් ගොඩනැංවීම සඳහා බුදු පියාණන් වහන්සේ විසින් වදරා ඇති අදහස් සියල්ල සම්මුති දේශනාව නමින් හැඳින්වේ. ලෝක ශිෂ්ටත්වයට පමණක් සීමා නො වී පෞද්ගලික ජීවිත සැපවත් ආකාරයෙන් පවත්වා සද සැනසිල්ලේ හිමිකරුවකු වීම සඳහා උපයෝගී කරගත යුතු මානසික ධර්ම ස්වරූප හා ඒවා පරිහරණය කළයුතු ආකාර පිළිබඳව කළ විස්තර සියල්ල පරමාර්ථ දේශනා නාමයට ඇතුළත් වන්නේ ය. එකී පරමාර්ථ කොටස් බුදු දහමේ අධ්‍යාත්මය වශයෙන් සලකමු. බුදු රජාණන් වහන්සේ විසින් කරන ලද සියළු දේශනා තුළ සම්මුති අර්ථය හා පරමාර්ථය ගැබ් කර තිබේ. එය උන්වහන්සේගේ ප්‍රඥා මහිමය යි. මෙහි ඉදිරිපත් කැරෙන කරණීය මෙත්ත සූත්‍රය පිළිබඳ විස්තරයෙන් එය මැනවින් ඔබට පෙන්වා දීමට උත්සාහවත් වෙමු.

## කරණීය මෙත්ත සූත්‍ර නිදානය

කරණීය මෙත්ත සූත්‍රය, භාවනා වැඩීම පිණිස වනගත වූ භික්ෂූන් වහන්සේලා පිරිසක් අරභයා බුදු පියාණන් වහන්සේ විසින් දේශනා කරන ලද්දකි. මේ දේශනාවේ ගැබ් වී ඇත්තේ නිවනට අදාලවන අත්ථ කුසලය සපුරාලීමට තුඩුදෙන ධර්ම ගොනුවකි. වනයට පිවිසි භික්ෂූන් වහන්සේලාගේ ගති පැවතුම් පිළිබඳව සැක උපදවාගත් අමනුෂ්‍ය කොටස් භික්ෂූන් වහන්සේලාට නොයෙක් අන්දමේ පීඩා පැමිණවීමෙහි යෙදුණා හ. ඉවසිය නො හැකි දුර්ගන්ධය ද, ලොමු ඩැහැ ගන්වන බිහිසුණු ශබ්ද ද,

බිය එලවන අද්භූත දර්ශන ද, මවමින් භික්ෂූන් වහන්සේලා පෙළන්නට වූහ. මෙයින් පීඩාවට පත් භික්ෂූන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ වෙත පෙරළා පැමිණ මේ බව සැළකර සිටිය හ.

ඇතැම් තාපසවරු ධ්‍යාන උපදවා අභිඥ බලයෙන් පානා ලද ප්‍රාතිහාර්යජනක ක්‍රියාවලින් පීඩාලත් අමනුෂ්‍ය කොටස්, භාවනාවට යෝග්‍ය පර්යංකය ගොතා භාවනාවට හුන් භික්ෂූන් වහන්සේලා ද එවැනි කරදරකාරී පිරිසක් යයි සිතා මෙසේ පීඩා කිරීමට ඉදිරිපත් වී ඇති බව දැනගත් බුදුපියාණන් වහන්සේ එම බිය සිඳලනු සඳහා ද, අත්ථ කුසලය මුදුන්පත් කරගැනීමට ඉවහල් වන ධර්ම හා ධර්මතා නොදත සිටි භික්ෂූන් වහන්සේලා තුළ එම ධර්මතා පිළිබඳ වැටහීම ඇතිකර ගැනීම සඳහා ද, මේ සූත්‍රය දේශනා කළ සේක. මේ දේශනාව ඇසූ භික්ෂූන් වහන්සේලා විසින් අත්ථ කුසලය සපුරා ගැනීම සඳහා උපකාර වන සියළු ධර්ම ප්‍රගුණ කරන ආකාරය තේරුම් ගන්නා ලදී. එසේ ම උන් වහන්සේලා විසින් මෙම සූත්‍රය සජ්ඣායනා කර ශබ්දය ඇසීමට සැලැස්වීමෙන් උන්වහන්සේලා පිළිබඳව අමනුෂ්‍යයන් තුළ තිබූ සැක බිය දුරු විය. ඉන්පසු උන්වහන්සේලාට ඔවුන්ගෙන් කිසිදු අවහිරයක් නො වීය. මෙසේ බුදුරජාණන් වහන්සේ විසින් දෙපක්ෂයේ ම යහපත සඳහා මෙම දේශනාව කරන ලද බව පැහැදිලි ය.

ජීවිතය තුළින් මතුවිය යුතු සැනසිල්ල නැති කිරීම සඳහා ඉදිරිපත් වන සියළු හේතූන් නැතිකර දමා සැනසිල්ලේ ගතකළ හැකි ජීවිත රටාවක් සාද ගැනීමට උපකාර වන මාර්ගය පාදගත හැකි ආකාරය කරණීය මෙත්ත සූත්‍රය ඉදිරිපත් කරන විස්තරයෙන් පැහැදිලි වන්නේ ය.

* * *

**කරණීයමත්ථ කුසලෙන**
**යං තං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කො උජූ ච සුජූ ච**
**සුවචො චස්ස මුදු අනතිමානී**

සැනසිලිදයක ජීවිත අයිතියක් අපේක්ෂා කරන්නා, අත්ථ කුසලය සකස් කර දෙන යහපත් ක්‍රියා මාර්ගයකට බැස ගත යුතු ය. එම මාර්ගය සාද ගැනීමට උප කාර වන දක්‍ෂතාවය සාද ගත යුත්තේ සෘජු කම, සුජුකම, සුවචකම, මුදුකම හා නිහත මානිකම යන ගති ජීවිතය තුළට හුරුකර ගැනීමෙන් බව මෙහි දක්වේ.

# 2 වැනි පරිච්ඡේදය

අත්ථ කුසලය නමැති මානසික ස්වරූපය සකස් කිරීම සඳහා උපකාර වන ධර්ම සමූහයට අයත් කොටස් වෙන් කර කරණීය මෙත්ත සූත්‍රයෙහි දක්වා තිබේ. මෙහි අඩංගු ධර්ම කොටස් ජීවිතයට සම්බන්ධ කර, සිත - කය - වචනය ක්‍රියා කරවීම නිවැරැදිව ධර්ම භාවිතා කිරීම වන්නේ ය. මෙම සූත්‍රයට අයත් ගාථා උදේ හවස සජ්ඣායනා කිරීම වැරදි යයි අපි නො කියමු. එහෙත් මෙම සූත්‍රයෙන් ජීවිතයට ගත හැකි උසස් ප්‍රයෝජන සජ්ඣායනා මාර්ගයෙන් පමණක් ලැබීම අපහසු ය. යම් උපකරණයක් දෙස බැලීමෙන් හෝ එහි නම කීමෙන් හෝ උපකරණය පාවිච්චි කළා නො වන්නේ ය. එම උපකරණය ගෙන, යම් ප්‍රයෝජනවත් ක්‍රියාවකට උපයෝගී කර ගැනීම එහි නිවැරැදි පරිහරණය යි. එමෙන් ම බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම දෛනික ජීවිතය සමග ගළපා ක්‍රියා කිරීම, ධර්ම තුළින් මතුවන රසාස්වාදය මතුකර ගැනීම සඳහා උත්සාහයක යෙදීම, ධර්මයෙන් ප්‍රයෝජන ගැනීමේ නිවැරදි ක්‍රමය බව තේරුම් ගත යුතු ය. ධර්ම පරිහරණය කළ යුත්තේ එලෙසිනි. කියවීමෙන් හෝ ඇසීමෙන් හෝ සෑහීමකට පත් නො විය යුතු ය. එයින් ලැබෙන්නේ ඇසීමෙන් ලැබිය හැකි දැනීම හෙවත් "සුතමය ඥානය" පමණි.

බුදු දහමේ ඇතුලත් ධර්ම ස්වරූපය පිළිබඳ විස්තර අසා ධාරණය කර නිතර මෙනෙහි කිරීමෙන් හා විස්තර සහිතව සිතීමෙන් **"චින්තාමය ඥාණය"** දියුණු වනු ඇත. මෙ පමණකින් නො නැවතිය යුතු ය. ජීවිතයට අයත් සියළු ක්‍රියා සමග එම ධර්ම මිශ්‍ර කළ යුතු ය. ප්‍රගුණ කළ යුතු ය. දියුණු කළ යුතු ය. මේ අභ්‍යාසය **"භාවනාමය ඥාණය"** දියුණු වීමට හේතු වේ. එවිට ඔහු ධර්මචාරියෙක් වන්නේ ය. මෙසේ ජීවිතය ධර්මයෙන් පණ පොවන්නාට එයින් මතුවන සැනසිලි රසය භුක්ති විඳීමට හැකි වේ. ලබන්නා වූ සැනසිලි රසය ස්ථිර පදනමක් මත ගොඩනගා ගැනීම අත්ථ කුසලය සම්පූර්ණ කිරීමෙන් පසු ලැබෙන අයිතියකි. එවිට ජීවිතය තුළ නොයෙක් ආකාරවලින් ඇවිල ගන්නා ගිනි නිවාලන්නේ ය. සදකාලික නිවීමකට පත් වන්නේ ය.

## අත්ථ කුසලය හා අනත්ථ කුසලය

අත්ථ කුසලය පිලිබඳව සිත යොමු කිරීමේදී අර්ථ හා අනර්ථ ප්‍රතිඵල ලබාදෙන දෙවර්ගයක කුසල් පිළිබඳ හැඟීම් මතුවිය හැකි ය. කුසලය අර්ථ හා අනර්ථ සැටියෙන් බෙදෙන්නේ එහි උපදවන ඵලයේ පවතින දුක් නිවාලන ශක්තිය අනුව ය. ජීවිතය දුකට, පීඩාවට පත් කරන ධර්ම කෙලෙස් නමින් හඳුන්වමු. එහි කෙළෙස් සහමුලින් ම ඉවත් කිරීමෙන් ලබන ජීවිත සැනසිල්ල උදකර ගැනීම සඳහා උපකාර වන විශේෂ ක්‍රියා ගොනුව සම්පූර්ණ වීමෙන් ලැබෙන චිත්ත මට්ටම **"අත්ථ කුසල"** නමින් හැඳින්වෙයි. එම සැනසිල්ල ලබා ගැනීමට අසමර්ථ කුසල් සියල්ල හැඳින්විය යුත්තේ **"අනත්ථ කුසල"** නමිනි. දෙව් මිනිස් හා බ්‍රහ්ම සැප හිමි වීම අනත්ථ කුසලයෙන් ලැබෙන තාවකාලික සැපදයක ජීවිත පරිච්ඡේදයන් ය. එකී තාවකාලික ජීවිත පරිච්ඡේද ගෙවී යාමෙන් පසු නැවතත් පීඩා සහිත තත්ත්වයකට පත්විය හැකි ය. නැවතත් පෙර තිබූ දුක් සහිත සංසරණයට ඇද වැටීමට ඉඩ තිබේ. ඊට හේතුව දුක් සහිත අයිතිවාසිකම් ලබා දීමට සමත් රාග - ද්වේෂ ආදි කිළිටි ධර්ම සම්පූර්ණයෙන් ම නැති නො වීම ය. අත්ථ කුසලයෙහි ගැබ් වන්නේ එවැනි තාවකාලික අසම්පූර්ණ සැනසීමක් නොව සදකාලික සුවය ලබා දෙන ශක්තියකි. එම උසස් කුසල ස්වරූපය සාද ගැනීමට හැකි වන්නේ ජීවිතය පිළිබඳව විස්තර දැකගත හැකි විදර්ශනා නුවණ මතු කරගත් විට ය. සිතෙන්

සිදුවන ක්‍රියා දෙස විමසිලිමත්ව බැලීමෙන් තමා පිළිබඳ ගුප්ත කරුණු සියල්ල දත හැකි ය. එවිට දුකෙහි හා පීඩනයෙහි සිත රඳවා තිබුණු සියළු මානසික පදනම් බිඳ දමා පීඩා දෙන සියළු ධර්මවලින් ජීවිතය බේරා ගැනීමට හැකි වන්නේ ය. මෙයින් වන්නේ දුකෙහි රඳවන අත්තිවාරම් මත රැදී තිබුණු සංසරණයෙන් මිදීමකි. සංසරණය සමග පසුපස එන ජාති - ජරා - මරණ ආදි සියළු අයිතිවාසිකම්වලින් මිදීමකි. සදකාලික සැනසීම ලැබීමකි. අත්ථ කුසලය සම්පූර්ණවීමකි.

## අත්ථ කුසලයේ හා අනත්ථ කුසලයේ ස්වරූප

දෙවර්ගයක විපාක දෙන කුසල් තිබෙන බව ඉහත පැහැදිලි විය. එකී වර්ග දෙක අතුරින් තාවකාලික සැප ලබා දෙන කොටස "ලෞකික කුසල්" නමින් හැඳින්වේ. සදකාලික සැනසිල්ලට පත් කිරීමේ කුසල් "ලොකෝත්තර කුසල්" නමින් හැඳින්වේ. සමාධිය හා ධ්‍යානය යනු කුසල් ස්වරූපයට සිත පත්වීමෙන් මතුවන චිත්ත මට්ටම් දෙකකි. සමාධිය හා ධ්‍යානය යන චිත්ත ස්වරූප දෙක ලෞකික හා ලෝකෝත්තර ස්වරූප මතු කිරීමේ හැකියාවලින් යුක්ත ය. ලෝභ - ද්වේෂ - මෝහ යන අකුසල් මුල් යටපත් වූ විට සිත හඳුන්වන්නේ කුසල් සිත නමිනි. කුසල් සිතේ පවතින සන්සුන් ස්වභාවය හඳුන්වන්නේ සමාධිය නමිනි. මෙම තත්ත්වයට සිත පත් කිරීම සඳහා උපකාර වන ධර්ම ක්‍රියා කරන ආකාරය හා සිතේ කෙලෙස් යටපත් වී පවතින ස්වරූපය හඳුන් වන්නේ "තදංගප්‍රහාණය" නමිනි. සිතේ පැවති කුසල් අරමුණ වෙනස් නො වී බාහිර ඉන්ද්‍රියයන් උපකාර වී සිදුවන ක්‍රියා නැවතී සිත අරමුණේ බලවත්ව එකඟ වී පවතින තත්වය උද වූ විට "ධ්‍යානය" නමින් හැඳින්වේ. මෙම සිතට සබඳව තිබූ කෙලෙස් යටපත්ව මතු නො වන තත්ත්වයට පත් වී වැඩි කාලයක් තිබීම "විෂ්කම්භනප්‍රහාණ" යයි.

ධ්‍යානයට සමවදින අවස්ථාවේ කෙලෙස්වල නිහඬතාව බලවත් බව මෙයින් පැහැදිලි ය. බාහිර ඉන්ද්‍රියයන්ගේ ක්‍රියා කාරිත්වය නැවතී අභ්‍යන්තරව ක්‍රියා කරන මනින්ද්‍රිය (මොළය) ඇසුරු කරමින් සිත ක්‍රියා කිරීම හේතුකොට ගෙන සිත ධ්‍යානයට පත් වන්නේ ය. එහෙත් බාහිර ඉන්ද්‍රියයන් ක්‍රියා කරවීමට තරම්

ශක්තිමත් හේතුවක් පැමිණි විට සිතේ පැවති ධ්‍යාන ස්වරූපය වෙනසකට පත් විය හැකි ය. නිද්‍රෝපගත කෙලෙස් ධර්ම අවදි වීමට අවස්ථාව ලත් කල්හි ඒවායේ ක්‍රියා මතුවීම මෙහිදී සිදු වෙයි. ධ්‍යාන ස්වරූපය සිතේ මතු කිරීමට හේතු වූ ධර්මවල උපකාරයෙන් කෙලෙස් යටපත් වී වැඩි කාල සීමාවක් එලෙසින් ක්‍රියා කිරීම "ලෞකික ධ්‍යාන" නමින් හැඳින්වේ. රූප-ශබ්ද-ගන්ධ රස-ස්පර්ශ යන පංචකාම වස්තූන් ඉදිරිපත් වී සිත සමග සබඳකම් ඇති වූ විට වෙනස් කළ හැකි හේතූන් මෙම ධ්‍යාන හා සමාධි සිතේ යටපත් වී පවතින බැවින් ලෞකික කුසල් නමින් මෙම චිත්ත මට්ටම් හඳුන්වනු ලැබේ. අනත්ථ කුසල නමින් හැඳින්වෙන්නේ ද එම සිත් ස්වරූප බව කලින් සඳහන් කර ඇත. ලෝකෝත්තර කුසල් ඊට හාත්පසින් වෙනස් ස්වරූපයෙන් යුක්ත ය. විදර්ශනාවෙන් ලබන දර්ශන ශක්තියෙන් හා වැටහෙන ශක්තියෙන් තොරව, අත්ථ කුසලයට අයත් ලොකෝත්තර කුසල් ස්වරූප සිතේ මතුවිය නො හැකි ය. සියළු ධර්ම පිළිබඳ අනිච්ච (නිත්‍ය නො වන) දුක්ඛ (දූෂණය වෙමින් නිතර වෙනසකට පත්වෙන) අනාත්ම (ස්ථිර අයිතියෙන් තොර වූ) යන සත්‍ය තුනට අයත් තීරණ දීමට සමත් ප්‍රඥාව මතුවන විට, ලෝක සම්බන්ධයෙන් ඇත් වීමේ හේතු පැහැදිලි වී, කිසිවක් නො අල්ලන තත්ත්වයට සිත පත් වන්නේ ය. එවැනි සාරවත් ස්වරූපයකට සිත පත්වීම සඳහා යොදන ක්‍රියා සියල්ල ලෝකෝත්තර කුසල ක්‍රියා නමින් හඳුනාගත යුතු ය. එම ක්‍රියා පදනම් කොට සිතේ ඇතිවන සංසුන්කම "ලෝකෝත්තර සමාධි" නම් වේ. එම සමාධිය උපකාර කරගෙන සකස්වන චිත්ත ඒකග්‍රතාව "ලෝකෝත්තර" ධ්‍යාන නම් වන්නේ ය.

## අත්ථ කුසලය සපුරා ගැනීම සඳහා උපකාර වන දක්ෂතාව කුමක් ද?

අත්ථ කුසලය මුදුන් පමුණුවා ගැනීම සඳහා උපකාර වන ධර්ම ස්වරූප පිළිබඳ විස්තර මෙම සූත්‍රයේ පෙන්වා තිබේ. එම ධර්ම ස්වරූපවලින් තොරව අත්ථ කුසලය සම්පූර්ණ කිරීම කිසි සේත් කළ නො හැකි ය. බෙහෙත් වට්ටෝරුවට අයත් බෙහෙත් වර්ග එක් නො වී අවශ්‍ය බෙහෙත් සකස් කළ නො හැකි ය. එමෙන් ම අත්ථ කුසලය නමැති මානසික මට්ටම සකස් වීමට ද

ඊට අවශ්‍ය ධර්ම ගොනුවිය යුතු ය. අත්ථ කුසලය යනු අනර්ථයෙන් බේරා අර්ථවත් අයිතිය ලබා, සැනසිල්ල භුක්ති විඳීමට ඉඩ ලබා දෙන චිත්ත මට්ටමක් බව කලින් සඳහන් කෙළෙමු. එකී අර්ථවත් අයිතිය ලබා ගැනීම සඳහා උපකාර වන ධර්ම ක්‍රියාවට නැගීමේ දක්‍ෂකම පවතින පමණට අර්ථය සාර්ථක වනු ඇත.

## දක්ෂකම (සක්කො)

දක්‍ෂකමේ පමණට ක්‍රියාව සාර්ථක වන බව කවුරුත් දනිති. පුහුදුන් තත්ත්වයේ සිටින කවරකු තුළ හෝ පවතින දක්‍ෂකම තාවකාලික අර්ථයක් මතුකර දෙන පදනමක් මත රැඳී ඇත. සදකාලික සැප ලබාදෙන ක්‍රියාවක දක්‍ෂකමේ ඡායා මාත්‍රයකුදු සිත්වලට වැටී නැති බැවින් එම ක්‍රියා පිළිබඳව මොන ම දැනීමක් හෝ පුහුදුන් පුද්ගලයා තුළ නැත. පුහුදුන් කමෙන් ඉවත් වී විශාරද නුවණක් සකස් කරගත් බුදුපියාණන් වහන්සේ විසින් සදකාලික සැනසිල්ල මතු කිරීම සඳහා අවශ්‍ය දක්‍ෂකම පුද්ගලයකු තුළ ඇති කරන ධර්ම කොටස් පහක් පිළිබඳ විස්තරය මේ ගාථාවෙහි ඇතුළත් කර තිබේ. උජුකම - සූජුකම, සුවචකම - මුදුකම - මානයෙන් තොරකම යනු එකී ධර්ම පසයි. මෙම ධර්ම පස ක්‍රියාවට නැගීමේ දක්‍ෂ භාවය මතු වූ විට අත්ථ කුසලය සකස් වීම සැක කටයුත්තක් නො වේ. ජීවිතය සමග දක්‍ෂකම මිශ්‍ර වීමේ ක්‍රම දෙකකි. කෙනකුගේ උපතේදී ම ඇතැම් ක්‍රියා පිළිබඳව දක්ෂකම තිබිය හැකි ය. ඇතැම්හු උපතේ දී නැති දක්ෂකම් ඇතිකර ගැනීම සඳහා උත්සාහයෙන් යුක්තව ක්‍රියා කිරීම හේතුකොට ගෙන තමා බලාපොරොත්තු වූ ක්‍රියාවේ දක්ෂ වෙති. මෙම දක්ෂකම් සියල්ල ලෞකික අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා හපන්කම් පානවා ඇත.

කෙනකු තුළ පවතින දක්ෂ භාවයේ ප්‍රමාණය මැනගත හැක්කේ ඔහු එම ක්‍රියාවෙහි යෙදෙන අවස්ථාවේදී ය. තමාගේ දක්ෂකම් පිළිබඳ විස්තර අන්‍යයන් ඉදිරියේ ප්‍රකාශ කරන පුද්ගලයන් ද නැතිවා නො වේ. එම ප්‍රකාශ පිළිබඳව සත්‍ය අසත්‍යතාව හඳුනාගත හැක්කේ, ඔහුගේ ක්‍රියා දෙස බැලීමෙන් පමණි. අත්ථ කුසලය වැනි, ජීවිතයක් සැනසිල්ලට පත්කරවන ක්‍රියා පිළිබඳ තිබිය යුතු දක්ෂ භාවය ලෞකික අයිතියක් ලැබීම සඳහා යොදන

දක්ෂ භාවයට වඩා ක්‍රමානුකූල විය යුතු ය. නිදසුනක් වශයෙන් තාවකාලික වාසයට ගෘහයක් ලබා ගැනීමට යොදන උත්සාහයට වඩා වැඩි උත්සාහයක් හා ක්‍රියා මාර්ගයක් ස්ථිර අයිතියට යටත් කොට ගෘහයක් තනා ගැනීම - සඳහා යෙදිය යුතුවාක් මෙනි.

## උජුකම (උජු ච)

අත්ථ කුසලය සකස් කිරීම සඳහා උපකාර වන ධර්ම ස්වරූප අතරින් උජුකම මුලින් සඳහන් කර තිබීමේ වැදගත් හේතුවක් තිබේ. කුමන කරුණකට හෝ සිත නො නැමෙන දුර්වල නො වන අයුරින් ඉදිරිපත් නො වේ නම් එම හේතුව නිසා ම අදහස් කළ කාරණය බිඳ වැටෙනවා ඇත. සිත ඍජුකම සමග මිශ්‍ර විය යුත්තේ කාරණයට සිත යොදන ආරම්භයේදීම ය. අවංකකම යනුවෙන් ව්‍යවහාරයට පත්වී ඇත්තේ ද එම ලක්ෂණය විය යුතු ය. අදහසක් සපුරා ගැනීම සඳහා සිත යොමු කිරීමේදී අදහස සඵල වන තුරු ක්‍රියාව නො නැවැත්වීම ඍජුකමේ ලක්ෂණය යි. එම ලක්ෂණය වෙනස් නො වී කරන සියළු ක්‍රියා අවසන් වන්නේ ජයග්‍රහණයෙනි. ක්‍රියාවක් ආරම්භ කිරීමේදී එයට උපකාර පිණිස එක්විය යුතු හේතුන් පිළිබඳව මෙන් ම අනුපකාර පිණිස ඉදිරිපත් විය හැකි හේතුන් පිළිබඳව ද අවබෝධය තිබීම ඍජු භාවය පවත්වා ගැනීමට උපකාරයක් වනු ඇත. අදහසක් සාර්ථක හෝ අසාර්ථක හෝ වීමට පරිසරයෙන් ලැබෙන සහාය හේතු වන්නේ ය යනු සාමාන්‍ය මතයකි. එහෙත් සිතේ ඍජුකම මතුකර ගත් විට බාහිර ලෝකයෙන් ඉදිරිපත් වෙන කිසිදු හේතුවකට තබා ගත් අදහසෙන් සිත බුරුල් වීමට ඉඩ නො තබා ජයග්‍රහණය කරා ළං වීමට දිරිය මතුකර ගත හැකි ය. කෙනකුගේ ක්‍රියාවකට බාහිර ලෝකයෙන් නොයෙක් ස්වරූපයේ සබඳකම් ඇතිවිය හැකි ය. වැඩි කොටසක් ම හිතවත් ස්වරූපයෙන් ඉදිරිපත් කරන අවවාද අනුශාසනා සැටියෙන් පෙන්වයි. පුහුදුන් සිත කෙලෙස් පිරිවරා ගත් පදනමක් මත රැඳී ඇත. කිලිටි ගතිවලින් තොර වූ ක්‍රියාවක් හෝ වචනයක් හෝ ඉදිරිපත් කිරීම පුහුදුන් සිතට අපහසු ය. පෞද්ගලික ක්‍රියාවක් හෝ බාහිර කෙනකුගේ ක්‍රියාවක් හෝ පිළිබඳව සිත යෙදීමේදී මෙම කිලිටි ගති පුහුදුන් සිතේ මතුවීම ස්වභාවයකි.

කෙනකුගේ ක්‍රියාවක් පිළිබඳව තවත් කෙනකු කරුණු ඉදිරිපත් කරන්නේ බොහෝ විට තමාට විය හැකි පාඩුවක් හෝ අලාභයක් හෝ පිරිමසා ගැනීමේ චේතනාවෙනි. නැතහොත් අනෙකාට ලැබෙන ලාභය ඉවසා ගැනීමේ අපහසුකම නිසා, එය නො මගට යැවීමේ අදහසිනි. සුද්ධෝදන රජු තම පුතාගේ ගමන වැළැක්වීමට ඉදිරිපත් වූයේ රජ පරපුර ගෙන යාමට කෙනකු නැති වීමේ පාඩුව පිරිමසා ගැනීමේ අදහසින් විය හැකි ය. සක්විති රජ සැපතට හා සතර මහ නිධානයට පුතා හිමිකරුවකු වන බැවින් එයින් ලැබෙන ගෞරවයෙන් කොටසක් පියාට ද හිමි ය. එම ඓශ්වර්ය හේතුකොට ගෙන සුද්ධෝදන රජුට ලැබෙන ගෞරවය හා සැලකිලිවලට තිබූ ගිජුකම බුදුබව පතා යන ගමන වැළැක්වීමට ඉදිරිපත් වූ හේතුවලින් එකක් විය හැකි ය. නො එසේ නම් පුත්‍රයාගේ අදහස තුළ රැඳී තිබූ ශුද්ධ පරමාර්ථය පිළිබඳව සොයා බලා සාධාරණ තීරණයකට බැස ගැනීමට සිතුවේ නම්, එවැනි අවහිරයක් කිරීමට තිබූ හේතු අඩු වනු ඇත. එහෙත් ආත්ම ලාභයට බර වී තමන්ගේ තීරණය හරි යයි කියා ගන්නා දෘෂ්ටිය සමග සිත බැඳීමේ හේතුව මෙම කාරණයට මුල් වූ බව පෙනේ. ස්වභාව ධර්මයේ බලපෑම්වලින් ද කෙනකුගේ අධිෂ්ඨානයක් වෙනස් කර දුර්වල කිරීමට බැරි කමක් නැත. අව්ව-වැස්ස-සුළඟ-පින්න ආදිය නිමිතිකර ගෙන වැඩ අත්හිටවන අවස්ථා හා පුද්ගලයන් නැතිවා නො වේ. අදෘශ්‍යමාන ශක්ති වශයෙන් සලකන ග්‍රහ දෝස-නැකැත් දෝස-භූත දෝස-හූනියන් දෝස-කටවහ දෝස-ඇස්වහ දෝස-අසුභ නිමිති ආදිය අධිෂ්ඨාන කර ගත් ක්‍රියා දුබල කිරීමට ශක්ති සම්පන්නව නැගී සිටින අවස්ථා බොහෝ විට දකින්නට ලැබේ. තම තමන්ගේ වැටහීම්වලට අනුව ඇතිකරගත් විශ්වාස ඇත. ඒ සියළු විශ්වාස තමා ගත් අදහසට උපකාර වීම පිණිස විනා අවහිරවීම පිණිස යොද නො ගැනීමට වගබලා ගැනීම නුවණ ය. එක්තරා පුද්ගලයෙක් ව්‍යාපාරයක් පටන් ගැනීම සඳහා ග්‍රහචාරය හොඳ තත්ත්වයට පත්වන තුරු බලා සිටියේ ය. සුදුසු රාශිවලට ගැලපෙන ග්‍රහයන් එන තුරු තිබුණු ඉඩකඩම් විකුණා පවුලේ කටයුතු කිරීමට ඔහුට සිදු විය. අවසානයේ තිබූ ඉඩකඩම් විකිණී ඔහු සිටි ගෙයිනුත් ඉවත් වන්නට හේතු මතු වෙන්නට විය. එවැනි බාහිර බලපෑම් කිසිවක් පිළිබඳව නො සලකා ශුද්ධ පරමාර්ථයක් මත තබාගත් අධිෂ්ඨානය නො බිඳ යමෙක් ක්‍රියා කරන්නේ නම් එය 'සෘජු' කමයි.

මෙහි සඳහන් වී ඇති සිදුහත් කුමරු පිළිබඳ පුවත ඇසුරෙන් මතුවන අතුරු ප්‍රශ්නයක් තිබේ. එනම් සුද්ධෝදන රජුට අකීකරු වී පුත්‍රයා ක්‍රියා කළ ආකාරයෙන් දෙන ආදර්ශය හැම දරුවකු විසින් ම අනුගමනය කළ යුතු ද යන්න ය. සිදුහත් කුමරු තබාගත් අධිෂ්ඨානය තුළ උදාර අදහසක් ගැබ් වී තිබුණ බව අපි දනිමු. සියළු ලෝකයා සැනසිල්ලට පත් කිරීම එතුමන් බලාපොරොත්තු වූ අර්ථය බව රහසක් නො වේ. එවැනි උදාර අදහසක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් වන කාට වුව ද එම ආදර්ශය උපකාරයට ගැනීම වැදගත් බව කිව යුතු ය. අදත් එම ආදර්ශය උපකාරයට ගෙන උසස් අදහස් දරා ක්‍රියා කිරීමට ඉදිරිපත් වන වාසනාවන්ත පුද්ගලයින් සිටින බව පැවිදි භූමියට කෙනකු ඇතුල්වන අදහස දෙස බලන විට පැහැදිලි ය. තමන් සතුව තිබුණු සියළු අයිතිවාසිකම් අත්හැර සියළු ලෝකයාගේ සැනසිල්ලට හේතුවන අයුරින් වැඩෙහි යෙදීමේ අදහසින් ක්‍රියා කිරීම භික්ෂූන් වහන්සේගේ ජීවිත පරමාර්ථයයි. උන්වහන්සේ සතුව ඇති කාලය-ශ්‍රමය-නුවණ ආදී සියල්ල යොදන්නේ සියල්ලන් සැනසිල්ලේ තැබීම සඳහා ය. එම තත්ත්වයෙන් දිවි ගෙවන යම් භික්ෂුවක් හෝ වැඩි පිරිසක් හෝ වෙත් නම් ඔවුන් මෙයට නිදසුන් වෙනවා ඇත. එවැනි උදාර අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් වන්නා කිසිවකුගේ අදහස්වලට අවනත නො වී ක්‍රියා කිරීමට ඇති හේතු හා යුක්තිය පිළිබඳව, මෙසේ තේරුම් ගත යුතු ය.

කෙනකුට ජීවත් වීම සඳහා ලැබී ඇත්තේ සීමාසහිත කාලයකි. එම ජීවිතයට සබඳව තිබෙන අහිතකර ධර්ම ඉවත් කිරීම හා හිතකර ධර්ම එක්කර ගැනීම එම කාලය තුළ සිදුවිය යුත්තකි. කෙනකු අන්‍යයන්ගේ යහපත සඳහා යොදන යම් කාලයක් වේ නම් එම කාලය තුළ ද තමාගේ ජීවිතය පිරිසිදු කරන ධර්ම එක්වීම සිදුවන බව බුදුපියාණන් වහන්සේ පැහැදිලි කර තිබේ. එබැවින් තමාගේ ජීවිතයෙන් එක් පුද්ගලයකුගේ හෝ ජීවිත සැනසිල්ලට යම් උපකාරයක් වේ නම් එය සමාජයට සිදුවන වැදගත් පෙළේ සේවාවකි. එමෙන් ම එය ඔහුගේ ජීවිත පාරිශුද්ධියට ඉවහල් වන කරුණකි. එවැනි ක්‍රියා බහුල වූ පමණට සමාජයක පවතින අසහනකාරී ස්වරූප මැකී යනවා ඇත. ඇතැම්හු තමන්

අදහස් කරන මතයට පටහැනිව යමකු කරන හොඳ වැඩවලට වුව ද අකැමැත්ත ඉදිරිපත් කරති. එය කෙලෙස් බරකමේ ස්වභාවයකි. එහෙත් එය හරි ක්‍රමය නො වේ. එබැවින් දරුවන් ඉදිරිපත් වන යම් උදාර ක්‍රියාවක් වේ නම් එය සාර්ථක කර ගැනීම සඳහා උපකාරී වීම දෙමාපියන් සතු යුතුකමක් සැටියෙන් සිහිපත් කිරීම නිවැරැදි යයි සිතමු. යම් දරුවෙක් අනර්ථයක් සිදුවන ක්‍රියාවක් සමග සබඳ වන්නේ නම් හෝ ඔහුගේ ඉදිරිපත් වීම අන්‍යයන් පෙළීමට හේතු වන්නේ නම් හෝ එම අසහනකාරී සිද්ධියෙන් දරුවා මුදවා ගැනීමට ඉදිරිපත් වීම දෙමාපියන් සතු යුතුකමකි. එලෙසින් ම තමන් කරන්නට යන්නා වූ ක්‍රියාවේ ඇති අනර්ථකාරී තත්වය පිළිබඳව කරුණු තමන්ට නො වැටහෙන්නේ වුව ද, දෙමාපියන් හෝ අන්‍ය වූ කෙනකු හෝ එහි ඇති වරද දක්වා වරදින් බේරා ගැනීමට උත්සාහවත් වන්නේ නම් එවැනි අවවාද අනුශාසනාවලට අවනත වීම සත්පුරුෂ සමාජයක් අපේක්ෂා කරන දරුවන්ගේ ද යුතුකමයි.

හොඳ නොහොඳ යන ක්‍රියා දෙකේදී ම 'උජු' භාවය ප්‍රයෝජනයට ගත හැකි නමුදු සැමට ශාන්තිය සලසන අත්ථ කුසලය වැනි උසස් ක්‍රියාවකට එම ධර්මය යොදා ගැනීමේ අගය සීමා කළ නො හැකි ය. කුමන හේතුවක් නිසා හෝ අධිෂ්ඨාන කරගත් අදහස් වෙනස් නො කර එහි ම රඳවා පවත්වා ගැනීම 'උජු' කමෙන් පෑ හැකි භාස්කමකි. සෘජු භාවය සිතේ මතුකර ගැනීමට බැරිවන අවස්ථා තිබිය හැකි ය. මතුකරගත් සෘජුකම නො කැඩී පවත්වා ගැනීමට උපකාර වන්නේ තමා විසින් සෘජුව කිරීම සඳහා අරමුණු කරගත් අත්ථ කුසලය පිළිබඳ කරුණු පැහැදිලිව තේරුම් ගැනීම ය. එහි ඇති අර්ථවත් රසය හා සැනසිල්ල සඳහා දෙන උපකාර ආදිය පිළිබඳ පැහැදිලි වැටහීමක් ලබා ගැනීම ය.

ලැබෙන ත්‍යාගයේ අගයේ පමණට ක්‍රීඩකයාගේ උනන්දුව ක්‍රීඩාව සඳහා යොමු වන්නේ ය. ලැබිය හැකි අස්වැන්නේ ප්‍රමාණයට අනුව ගොවියාගේ උනන්දුව එම කෘතිය සඳහා වැඩි වනු ඇත. එසේ ම ලැබෙන ඵලයේ අගය වැඩි වෙන පමණට පිළිවෙත් පිරීමේ උනන්දුව වැඩි වීම පුදුමයක් නො වේ. ලෝකීය තත්ත්වය ඉක්මවා යන අත්ථ කුසලය වැනි උදාර චිත්ත මට්ටමක් ලැබීම

සඳහා යෙදිය යුතු උනන්දුව අවදි වීමට අත්ථ කුසලයෙන් මතුකළ හැකි සැනසිල්ලේ ප්‍රමාණය පැහැදිලි කරන කරුණු දත යුතු ය. එම දැනීම **"සුතමය ඤාණය"** යනුවෙන් හැඳින්වේ. ශාසන සම්ප්‍රදයට අනුව භික්ෂුවක් නිස්සය මුත්ත වීමේ (හුදකලා ජීවිතයට සුදුස්සා වීමේ) වරප්‍රසාදය ලබන්නේ බහුශ්‍රැත ආචාර්‍යවරයකු ඇසුරේ පස් අවුරුද්දක කාලය තුළ ලබන අධ්‍යයන දක්ෂ භාවයට අනුව ය. භික්ෂු ජීවිතය යොමු විය යුත්තේ අත්ථ කුසලය නමැති උදර ජීවිත ස්වරූපය සදදෙන ක්‍රියාවල යෙදීමට පමණි. එකී අර්ථය සපුරා ගැනීම සඳහා උපකාර වන පිළිවෙතෙහි යෙදීමට ප්‍රමාණවත් දැනීමක් ලබාදීම සඳහා පස් අවුරුදු කාලය සීමා කරගෙන තිබේ. නිසි තත්ත්වයට දැනීම මතුවන තුරු, ගුරු ඇසුරෙන් ඉවත් වීමට භික්ෂුවට අවසර නැත. අධ්‍යාපන කාලය සම්පූර්ණ කර ලබාගත් දැනීමට අනුව උත්සාහ යොදමින් තමා අපේක්ෂා කරන චිත්ත මට්ටම ලැබෙන තෙක් උත්සාහ යෙදීම භික්ෂුවට අයත් එක ම කෘත්‍යය වන්නේ ය. එදිනෙද ජීවිතය නඩත්තු කිරීම සඳහා උපකාර වන දේ සෙවීම පිළිබඳ දැනීම ලබාදීම භික්ෂූන් වහන්සේ විසින් ලබන අධ්‍යයනයට ඇතුළත් නැත. සිත පාලනය කර දුකින් මිදීමේ අර්ථවත් අයිතිය ලබාදීමේ ක්‍රම පමණක් පැහැදිලි කරදීම බෞද්ධ අධ්‍යාපන ක්‍රමයෙන් සිදුවෙන කොටස ය. ජීවිතය පිළිබඳ දර්ශනික අවබෝධයක් හා විද්‍යානුකූල හැඟීම් භික්ෂූන් වහන්සේ විසින් ලබන අධ්‍යයනයේ උපකාරයෙන් සිතේ මතුවෙනවා ඇත. අවුරුදු පහක කාලයක් මුළුල්ලේ මෙම අධ්‍යාපනයෙන් පෝෂණය වූ භික්ෂූන් වහන්සේගේ සිත අත්ථ කුසලය නමැති උදර සිත් ස්වරූපය මතුකර ගැනීම සඳහා නැගී සිටී. එවිට උන්වහන්සේ තුළ තිබූ ලෝකීය අයිතිවාසිකම් පිළබඳ අපේක්ෂාවන් සියල්ල බහා තබා, ගත කරන සෑම මොහොතක් ම සිතේ සැනසිල්ල සකස්කර දෙන අත්ථ කුසලය සකස්කර ගැනීමට උපකාර වන ක්‍රියා මාර්ගයට බැස ගැනීම සිදු වේ. ඍජු කම අවදි කර ගැනීම සඳහා උපකාර වන හේතු මතුවන ආකාරයෙන් අධ්‍යාපනය ලබන භික්ෂුවකගේ මානසික වේගය අත්ථ කුසලය වෙතට නැඹුරු වන ක්‍රමය නිදසුනක් වශයෙන් මෙහි ඉදිරිපත් කර දක්වීමු. ඍජුකම මතුකරගත් සිතේ තත්ත්වය බිඳ නො වැටීම සඳහා උපකාර වන්නේ ඍජුකමට අයත් ස්වරූප සිතේ මතුකර ගැනීම ය.

## සූජුකම (සූජු ච)

අත්ථ කුසලය සපුරා ගැනීමේ එක්තරා දක්‍ෂකමක් වශයෙන් බාහිර අවහිරකම්වලින් බේරී සිත පවත්වා ගැනීමට උපකාර වන සෑජුකම පිළිබඳ විස්තර ඉහත දක්වීමු. එහෙත් සිත තුළ තැන්පත් වී තිබී මතුවන කෙලෙස් වේග සිතක තිබිය යුතු සන්සුන් කම නැති කර අවුල් තත්ත්වයක් උදකර දීමට හේතු වෙයි. සූජු භාවය යනු අභ්‍යන්තර කෙලෙස් වේගවලට සිත යට නො වී පවත්වා ගැනීමේ උනන්දුව මතුකර ගැනීමට අනාදිමත් කාලයක් මුළුල්ලේ හුරු වෙමින් සිතේ පැවති කෙලෙස් ගති රැසකි. එම ගති මතුවීමට තරම් සමත් හේතුන් මතු වූ විට ඒවා මතුවීම, පුහුදුන් සිතේ පවතින ස්වාභාවික ගතියකි. එම කෙලෙස් ස්වරූප චරිත නමින් හඳුන්වයි. රාග-ද්වේශ-මෝහ-ශ්‍රද්ධා-බුද්ධි-විතක්ක යන චරිතවලට පුද්ගලයන් කොටස් වන්නේ ද ක්‍රියා සමග එක්වෙන ගති ස්වරූප වලට අනුව ය.

ලෞකික ලොකෝත්තර යන තුමන තාලයේ ක්‍රියාවක් සමග වුව ද මෙකී ගති මිශ්‍ර වූ විට යහපත සලසා ගැනීම සඳහා යොදන උත්සාහය දුබල විය හැකි ය. ලෞකික පදනමේ පවතින ජීවිත නො සන්සුන්කම සියළු ලෞකික සිත්වල පවතින ගතියකි. කිසිදු ක්‍රියාවකින් සෑහීමකට පත් වූ අවස්ථාවක් ලෞකික පදනමේ ජීවිත තුළින් මතු නො වන්නේ කෙලෙස් ස්වරූප මතුවීම හා ඒවාට යටවීමේ හේතුව නිසා ය. නො සෑනසිල්ල ඕනෑකමේ අතෘප්තිමත්කම පෙන්වන ලක්‍ෂණයකි. අතෘප්තිය අපේක්ෂාවේ අසීමිතකම බලවත් වීමෙන් මතුවන විපාක ස්වරූපයකි. මෙම තත්ත්වය සිතට නැගීමේ හේතුවෙන් දෙම්නස් ස්වරූපය ජීවිතය පිරිවරා සිටී. එම ස්වරූපය පැහැදිලි කර දෙන නිදසුන් සමාජයෙන් උපුටා පෙන්විය හැකි අවස්ථා එමට තිබේ. ස්වාමියාගේ පැවතුම්වල ආටෝපය භාර්යාවට මදි වූ විට ඔහුව ඇට නො රුස්සයි. භාර්යාවගේ ක්‍රියා තුළින් ස්වාමියා විසින් අපේක්‍ෂිත තත්ත්වය මතුවන තාක් ඔහුට ඇව රිස්සුම් දෙන්නේ නැත. දෙමාපියන්ගේ ගති පැවතුම්වල ස්වරූපය ඇතැම් විට දරුවන්ට රිස්සුම් නො දෙන බව පෙන්වන ලක්ෂණ මතුවන අවස්ථා එමට තිබේ. දරුවන්ගේ පැවතුම් දෙමාපියන් විසින් බලාපොරොත්තු වන මට්ටමට පත්වන තාක් දෙමාපියන්ගේ මානසික පීඩන නො

නවතී. මේ ආකාර අසහනකාරී ස්වරූප පවුලේ සාමාජිකයන් අතර මතුවීමට හේතුව කුමක් ද? තම තමන් තුළ අන්‍යයන් පිළිබඳව මතුවන අපේක්ෂාවන්ගේ බලපෑම් බව පැහැදිලිව පෙනේ. ලෝභ-ද්වේෂ-මෝහ යන කෙලෙස් ස්වරූප සිත්වල පවතින තාක් සැනසිල්ලේ ඡායාවක් හෝ දක ගැනීමට ඉඩක් නො ලැබෙන බව මෙයින් පැහැදිලි ය.

මෙම තත්ත්වයෙන් සිත මුද ගැනීමේ මගට බසින්නා පත්වන්නේ අත්ඵ කුසලය සම්පූර්ණ වන කරුණු ජීවිතය සමග එක් කිරීමේ ක්‍රියා මාර්ගයකට ය. බාහිර ලෝකයෙන් ඉදිරිපත් වෙන නොයෙකුත් තාලයේ වේගවලට යට නො වී සිත අවශ්‍ය ක්‍රියාවට යොමු කිරීම සඳහා උජු භාවයෙන් යුක්තව ක්‍රියා කිරීම උපකාර වන බව කීවෙමු. අභ්‍යන්තර කෙලෙස් වේග මතුවී ජීවිතයට රිදුම් දෙන ස්වරූපවලින් මිදීමට ඒවා සිතෙන් පහකොට සිත ක්‍රියා කිරීමේ හුරුව ලබාගත යුතු ය. කෙලෙස් වේග නවතාලීම ඒවා සිතට එක්වෙන අවස්ථා හා හේතු පිළිබඳ සොයා බලා හැඳිනීමෙන් කළ යුත්තකි. සිතේ ක්‍රියා පිළිබඳ මැනවින් පරීක්ෂාකාරී වීම මෙයට නිසි මග ය. "විදර්ශනාව" යනු එය යි. මෙම පරීක්ෂණයෙහි යෙදී උපරිම ඵලය ලබාගත් බුදු පියාණන් වහන්සේ විසින් සියළු ලෝකයාගේ යහපත පිණිස එම විස්තරය ලෝකයා ඉදිරියේ තබන ලදී. "සතිපට්ඨාන සූත්‍රය" මෙම විස්තරය ඇතුළත් කර ඇති වචන ගොනුව යි. මෙම පරීක්ෂණයෙහි යෙදීමේ අවස්ථාවේ දී උපකාර පිණිස ගතයුතු කොටස් සතරක් පිළිබඳව දක්වා තිබේ. සිත ක්‍රියා කරන අයුරු දක ගැනීම සඳහා එම ක්‍රියා දෙස විමසිල්ලෙන් බැලීම කායානුපස්සනාව යි. එම ක්‍රියාවලින් උපදවන වේදනා දෙස බැලීම වේදනානුපස්සනාව යි. පහළ වන වේදනා සමග සිත ක්‍රියා කරන ආකාරය දෙස බැලීම චිත්තානුපස්සනාව යි. චේතනාවලට අනුව සිත ක්‍රියා කරන ආකාරවල හේතුවෙන් සකස් වෙන ධර්ම ස්වරූප දෙස් බැලීම ධම්මානුපස්සනාව යි. මෙම නිමිති සතරේ සිත ක්‍රියා කරන ආකාරය දක ගැනීම සඳහා පිළිපැදිය යුතු ආකාරය බුදුපියාණන් වහන්සේ සතිපට්ඨාන සූත්‍රයෙහි පෙන් වූ සේක.

## සුවච භාවය (සුවචෝ)

ක්‍රියාවක් හෝ වචනයක් හෝ අසංවර භාවයට පත් කෙරෙන්නේ සිතේ පවතින කෙලෙස්වල ප්‍රමාණයන්ට අනුව ය. පුහුදුන් සිත කෙලෙස් පිරිවරා ගත් ස්වරූපයකින් යුක්ත බැවින් සංවරයෙන් යුක්ත ක්‍රියාවක් කිරීමට හෝ සංවරව වචන පාවිච්චි කිරීමට හෝ පහසු නො වේ. එහෙත් සියල්ලන් ම තමා වසන පරිසරයෙන් බලාපොරොත්තු වන්නේ ද සුවච භාවයෙන් යුක්ත පැවතුම් ය. දෙමාපියන් දරුවන්ගෙන් නිතර බලාපොරොත්තු වන්නේ සුවචකම හා කීකරුකම ය. එහෙත් එම බලාපොරොත්තුව සාර්ථක කරගත් මව්පියවරු කොතෙක් සිටිත්දැයි කීම අපහසු ය. දරුවන්ගේ දෙස් කියාපාමින් දුක් වෙන මව් පියවරු විදහාපාන්නේ තමන් විසින් බලාපොරොත්තු වූ සුවච භාවය දරුවන් තුළ නැති බවකි. මේ ක්‍රියා මාර්ගය මව්පියන් හා දරුවන් අතර තිබිය යුතු එකමුතුකම විසිරී යාමට හේතු වී ඇත. ස්වාමියා හෝ ස්වාමි දුව හෝ සේවක සේවිකාවන්ගෙන් බලාපොරොත්තු වන්නේ ද සුවච භාවයට අයත් පැවතුම් ය. බලාපොරොත්තු ආකාරයෙන් ප්‍රතිඵල නො ලැබීම නිසා දෙපක්ෂය අතර තිබිය යුතු සුහද භාවය නැතිවී යාමට කරුණු මතුවන්නේ ය. සේවකයාගේ දොස් ස්වාමි පක්ෂයෙන් කියවෙන අතර ස්වාමි පක්ෂයේ දෙස් සේවකයන් ගෙන් ප්‍රචාරය වන තත්ත්වයට පත්වී ඇත. ගුරු ගෝලයන් අතර ද මෙම ස්වරූපය ම පවතී. ගුරුවරයා විසින් ගෝලයන්ගෙන් බලාපොරොත්තු වන සුවච භාවය ක්‍රියාවට පත් නො වන හේතුවෙන් එම දෙපක්ෂය අතර තිබිය යුතු සුහද භාවය නැති වී යන්නේ ය.

මෙම තත්ත්වය උදවීමට හේතුව එක් පක්ෂයක වරදක් බව කීම යුක්ති සහගත නො වේ. පරිහරණයට ලැබෙන වස්තු කිසිවක් අපේ අපේක්ෂාවන් සපුරා දීමට යෝග්‍ය ආකාරයෙන් සකස් නො වී ඇති බව අප තේරුම් ගත යුතු ය. එහෙත් තමාගේ අදහස සපුරා ගැනීමට සුදුසු ආකාරයෙන් එය සකස් කර ගැනීමට ඉඩකඩ නැතිවා නො වේ. තමාට අවශ්‍ය කාරණයට ගැලපෙන ආකාරයෙන් නිමිත්ත සකස්කර ගැනීමේ හෝ තමාට පීඩාවක් නො දෙන ආකාරයෙන් නිමිත්ත ඇසුරු කිරීමේ හෝ වැරදි ක්‍රමය හේතුවෙන් නිරන්තරයෙන් පීඩා විඳීමට සිදු වේ.

කෙනකු විසින් සකස් කරන ලද කැවිලි වර්ගයක් බුදින පුද්ගලයා බලාපොරොත්තු වන රසය එහි අඩුවිය හැකි ය. ඊට වැරදිකරු කැවිලි සෑදූ තැනැත්තා නො වේ. කැවිලි බුදින්නා විසින් බලාපොරොත්තු වන රසයේ ප්‍රමාණය පිළිබඳ දැනීම කැවිලි සාදන්නා තුළ නැත. ඔහුගේ හැකියාවේ හා දැනීමේ පමණට කැවිලි සෑදීම ඔහු කරයි. රසවත් කැවිලි බලාපොරොත්තු වන්නා විසින් රස මතු කරන කොටස් එක්කර තමාට අවශ්‍ය කැවිලි සාදගැනීම ඔහු සතු ය. එසේ නැතිව කැවිලිවලට දොස් තැබීම හෝ කැවිලි සකස් කළ පුද්ගලයාගේ වරද පෙන්වීම හෝ කැවිලි රසවත් කර ගැනීමේ ක්‍රමය නො වේ. පුද්ගලයකු තමාට අවනත වන්නේ ඇසුරේදී කියවෙන වචනවල හා සිදුවන ක්‍රියාවල ස්වරූපවලට අනුව ය. වචන හා ක්‍රියා තුළ කරුණාව ගැබ් වී තිබෙන පමණට අසන්නාගේ හා දකින්නාගේ සිත් තමාට අවනත වන ස්වරූපයට පත් වේ. යම් කාරණයකට සම්බන්ධ කර ගන්නා පුද්ගලයා තුළ තමා බලාපොරොත්තු වන කාරණයට අවශ්‍ය ප්‍රමාණයේ සුවචකම නො තිබෙන්නට පුළුවන. එහෙත් එම අඩුව පිරිමසා ගෙන ක්‍රියාවට අවශ්‍ය සුවචකම ඔහු තුළ ඇතිකර ගැනීමට බැරිකමක් නැත. දුර්වචකම මතු වන්නේ ක්‍රියා හා වචන සමඟ කෙලෙස් මිශ්‍ර වීමෙන් ය. කෙලෙස් නැති පුද්ගලයකු සමාජයේ සෙවිය නො හැකි ය. එහෙත් කෙලෙස් මතු නො වීම සඳහා යෙදිය යුතු උපක්‍රම යොදන්නේ නම් පුද්ගලයන් තුළින් මතුවන දුර්වච ස්වරූප බොහෝ දුරට යටපත් කර සුවච ගති මතු කිරීම අපහසු නො වේ. තමන් සුවචකම ඇතිකර ගැනීම මෙයට නිසි ප්‍රතිකර්මය බව කිය යුතු ය.

දරුවන්ගේ සිත් සතසා ඔවුන් තුළ පවතින කෙලෙස් මතු නො වන අයුරින් ක්‍රියා කිරීමට මවුපියන් සුවච වන්නේ නම් දරුවන් තුළින් මතුවන නො දමුණු ස්වරූප යටපත්කර සුවච ගති මතුකර ගැනීම අපහසු වේයයි සිතිය නො හැකි ය. ස්වාමි පක්ෂය විසින් සේවකයන් තුළ තිබෙන කෙලෙස් මතු නො කර සැනසිල්ලේ සිත පැවැත්වීමට උපකාර වන ක්‍රියා කිරීම හා සිය යුතුකම් ඉටු කරන්නේ නම් සේවක පක්ෂයෙන් ස්වාමි පක්ෂය ලබන පීඩා අඩුකර ගැනීමට පුළුවන. ශෝලයන් තුළ යටපත් වී තිබෙන සුවච ගති මතු කිරීමේ උපක්‍රම ගුරුවරුන් විසින් යොදන්නේ

නම්, ගෝල පිරිස් හික්මවීම එතරම් අපහසු වේයයි සිතිය නො හැකි ය.

සිතක් තුළ ගොනු වී තිබෙන කෙලෙස් මතු නො වීම සඳහා යෙදිය යුතු උපක්‍රම පිළිබඳව තේරුම් ගැනීමට බුදුපියාණන් වහන්සේගේ ජීවිතය ආදර්ශයකි. උන් වහන්සේ මුහුණ දුන් බිහිසුණු අවස්ථාවලදී හමු වූ දුර්වච පුද්ගලයන් සමග ඇසුරු කළ අයුරු පිළිබඳව නුවණින් සිතන විට එම කාරණය පැහැදිලි වෙයි. කරුණාව සිතේ මතු කරගත් විට බොහෝ දුරට අන්‍යයන් තුළ පවතින කෙලෙස් මතුවීම නවත්වා තමාට අවනතව ක්‍රියාකර ගැනීමේ හැකියාව තිබෙන බව බුදුපියාණන් වහන්සේ නොයෙක් අවස්ථාවල පෙන්වා තිබේ. රා බී මත්ව ආ නාලාගිරි ඇතු තුළ තිබූ දුර්වච ක්‍රියා සියල්ල යටපත්කර තමන් වහන්සේ ඉදිරියේ දණ ගැසීමට කරුණු යෙදුණේ උන්වහන්සේ මතුකළ කරුණා සිතේ බලපෑමෙනි. දැඩිගති මතුකර ගෙන බුදුපියාණන් වහන්සේගේ ඉදිරියේ දණ ගැසීමට කරුණු යෙදුණේ උන් වහන්සේ මතුකළ කරුණා සිතේ බලපෑමෙනි. දැඩිගති මතුකර ගෙන බුදුපියාණන් වහන්සේගේ ඉදිරියට පැමිණි ආලවක සෙන්පතියාගේ දුර්වච ක්‍රියා සියල්ල මැඩ ඔහු සුවච කීකරු උවසුවකු බවට පත්කළේ කරුණාව මිශ්‍ර වූ ක්‍රියා හා වචනවල බලයෙනි. යම් පුද්ගලයකු තමන් තුළ පවතින ක්‍රෝධාදි ධර්ම යටපත් කර මෛත්‍රී කරුණා සිතිවිලිවලින් යුක්ත වන්නේ නම් ඔහුගේ ඉන්ද්‍රියයන් තුළින් ශාන්ත පෙනුමක් මතුවෙයි. වචන තුළ ද එම ස්වරූපය මතුවෙයි. එබැවින් ඔහුගේ දර්ශනය හා ඔහුගේ හඬ අනෙකාගේ සිතට ප්‍රිය එලවන සුලු ය. මෙකී කරුණුවලින් සුවචකම කුමක් ද යනු වටහාගත හැකි ය.

## මෘදු භාවය (මුදු)

සුවචකමට අයත් ස්වරූපයෙන් ක්‍රියා හා වචන සංවිධානය කිරීමේදී සිතේ සකස් වෙන ධර්මය මුදු භාවයයි. සිතට හමුවන කුමන නිමිත්තක් සමග හෝ ලෝභ-ද්වේෂ මිශ්‍ර නො කර ක්‍රියා කිරීමේ හුරුව සිතේ දියුණු වූ විට සියල්ල පිළිගන්නේ ඉතා සැහැල්ලු මොලොක් ස්වරූපයෙනි. සිතට බරක් නො වන ආකාරයෙනි. සිත නිමිත්තේ දැඩිව බඳවන ගතිය සිතේ නැතිකම

මෙයට හේතුවයි. සිත සැනසිල්ලේ පැවැත්වීමට උපකාර වන ප්‍රධාන හේතුව නිමිත්ත දැඩි ස්වරූපයෙන් නො පිළිගැනීම ය. ලෝභයෙන් හෝ ද්වේෂයෙන් නිමිත්ත අල්ලා නො ගැනීම නිසා සිත සැහැල්ලු ස්වරූපයකින් යුක්තව ක්‍රියා කරනවා ඇත. නමුත් එම ශාන්ත ස්වරූපය සාමාන්‍ය ලෝකයා පිළිගන්නේ දුර්වල කමක් සැටියෙනි. කෙනකු දෙස් පවරමින් බණින අවස්ථාවකදී බැනුම් අසන්නා වෙනසකට පත් නො වී කෝප නො ගෙන සිටී නම් ඔහු බිය ගුල්ලකු සැටියෙන් තීරණය කිරීමට සමාජය පුරුදු වී ඇත. ඇතැම් පුද්ගලයන් බය හේතුකොට ගෙන ශාන්ත ස්වරූපයට අනුව ක්‍රියා කරන අවස්ථා නැතිවා නො වේ. එහෙත් එකී "මෘදු" ගතිය සතුරාට විරුද්ධව නැගී සිටීමේ හැකියාව නැතිකමෙන් ඇති වූ නිහඬ තත්ත්වයකි. ඔහු ද්වේෂය මතු කරගෙන සිතෙන් විරුඬව නැගී සිටින්නෙකි. ඒ අවස්ථාවේදී ඔහුගේ සිතට කිසි ම සැනසිල්ලක් නො ලැබේ. කෙලෙස් මතු නො වී මොලොක් ස්වරූපයෙන් සිත ක්‍රියා කරන්නාගේ තත්ත්වය එසේ නො වේ. ඔහු බැණුම් අසන්නේ කිසිදු චිත්ත පීඩාවක් නැතිව ය. තමාට දෙස් කියන්නා සමග සිතෙන් හෝ විරුඬව නැගී සිටින්නේ නැත. සියල්ලට කන් දෙමින් සතුටු සිතකින් යුක්තව එය අසාගෙන සිටිය හැකි තත්ත්වය "මුදු" ස්වරූපයට පත් වූ සිතක ලක්ෂණය වන්නේ ය.

එහෙත් පුහුදුන් සමාජය ඔහු දුබල කෙනකු සැටියෙන් කොන් කරනවා ඇත. කෙලෙස් සහිත සිතකට නික්ලේශී සිතකින් කරන ක්‍රියා ස්වරූපවල තත්ත්වය තේරුම් ගැනීමේ අපහසුකම මෙයට ඇති එක ම හේතුවයි. කෙලෙස් සහිත සිත් නිතර අපේක්ෂා කරන්නේ කෙලෙස් මිශ්‍ර වූ ක්‍රියා දැකීමට හා වචන ඇසීමට ය. එබැවින් කෙනකු විසින් වෙනත් කෙනකුට දෝෂාරෝපණය කිරීමේදී පුහුදුන් ලෝකයා බලාපොරොත්තු වන්නේ දෝෂයට ඉලක්ක වන තැනැත්තා දෙස් තබන්නාට විරුඬව නැගී සිටීමයි. එසේ නැගී සිටීමෙන් මතුවන අරගලය දැක එම ජවනිකාවෙන් සතුටක් බුක්ති විඳීම, පුහුදුන් ලෝකයාගේ ස්වභාවය යි. කෙනකුගේ ජීවිතය නො මග යාමට පරිසරයෙන් ලැබෙන අනුබල වශයෙන් මෙවැනි සිද්ධීන් ලකුණු කළ හැකි ය. එහෙත් නැණවත් පුද්ගලයා කෙරෙහි මේ කිසිවක් බල නො පායි. ඔහු පුහුදුන් සිතේ ස්වභාවය දන්නා

බැවින් ඒ පිළිබඳව මොන ම අමුත්තක් හෝ නැතිව තමාගේ යහපත සඳහා කළ යුතු ක්‍රියා කිරීමට පසුබට නො වන්නේ ය. ලාබයක් ලැබුණු විට ලෝභයෙන් උදම් වීම හෝ අලාභයක් සිදු වුණු විට ද්වේෂයෙන් පෙළීම හෝ මුදු ගතියෙන් යුක්ත සිතට අයත් ක්‍රියා ස්වරූපය නො වේ. ලාභ-අලාභ සියල්ල මධ්‍යස්ථ ලීලාවෙන් යුක්තව පිළිගැනීම හා මුදු භාවය සිතට එක්කර ගෙන නිහඬ වීම සැනසුණු සිතක ලක්ෂණ වේ. මෙම වැදගත් ගතිය සිතට එක්කර නො ගැනීමේ හේතුවෙන් ජීවිතය තුළින් මතුකර ගන්නා පීඩා එමට ය. සැනසිල්ලට යොදගත හැකි කරුණු නො සැනසිල්ලට හේතුවන ආකාරයට යොද ගන්නේ මේ ගති නැති හේතුවෙනි.

දරුවන්ගේ නො හික්මුණු දඟකාර ක්‍රියා "මුදු" භාවයෙන් පිළිගෙන ඒවා නිසි තත්ත්වයකට පත්කර ගැනීමට අපොහොසත් මවුපියෝ තමන්ගේ දරුවන් අනාගතයේදී වෛරක්කාරයන් වශයෙන් ක්‍රියා කිරීමේ තත්ත්වයට පත්කර ගනිති. දෙමාපියන් තුළ "මුදු" භාවය ඇතිකර ගෙන දරුවන්ගේ නො හික්මුණු ක්‍රියා සන්සුන් ස්වරූපයෙන් පිළිගැනීමේ තත්ත්වයෙන් යුක්තව ක්‍රියා කරන්නේ නම් දරුවන්ට ද එය ආදර්ශයක් වන අතර ඔවුන්ගේ නො හික්මුණු ස්වරූප කලකදී නැතිකර ගෙන ඔවුන් හොඳ තත්ත්වයට පත්වීමට ද හැකිවේ. පොඩි වයසේදී කරන වරදට නිසි දඬුවම් නො දුන හොත් ඔවුන් අකීකරු වේය යන බිය වැඩිහිටියන් තුළ පවතින්නකි. එහෙත් එම තීරණය වැරදි බව කිව යුතු: ය.

ස්වාමියාගෙන් සිදුවන වැරදිවලට සමාව දීමේ මොලොක් ගතිය භාර්‍යාව තුළ තිබෙන්නේ ද, භාර්‍යාවගෙන් සිදුවන වැරදිවලට සමාව දීමේ මොලොක් ගතිය ස්වාමියා තුළ තිබේ ද, ඔවුන් වාසය කරන ස්ථානය දේවතාවියක් දේවතාවකු සමග වාසය කරන දෙව් විමනක් බවට පත්කර ගත හැකි බව බුදුපියාණන් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශයකි. එම ආදර්ශය ලබන දරුවන්ගේ ද පැවතුම් ඊට අනුරූපව සකස් වී ඔවුන් ලොව සනසන වස්තු බවට පරිවර්තනය වීම පුදුමයක් නො වේ. නො එසේව භාර්‍යාවගෙන් සිදුවන සුළු වරදට කිපෙන ස්වාමියාගේ ක්‍රියා අමානුෂික තත්ත්වයට පෙරළෙන්නේ නම් හෝ ස්වාමියාගෙන් සිදුවන සුළු වරද ද්වේෂ ගතියෙන් පිළිගන්නා භාර්‍යාවගේ පැවතුම් අමානුෂික තත්ත්වයට

පෙරළෙන්නේ නම් හෝ ඒ දෙපලගේ වාසස්ථානය යක්ෂයකු යක්ෂණියක සමග වසන යක්ෂ විමනක් බවට පෙරළීම පුදුමයක් නො වේ. ඔවුන්ගෙන් ඇතිවන දරු පරපුර ද සමාජය කලම්බන පුද්ගලයන් වීම නැවැත්විය නො හැකි ය. මේ අයුරින් බලන විට ඇසුරට පත් වෙන සියල්ලන්ගේ ක්‍රියා මෘදු ස්වරූපයෙන් පිළිගැනීමේ උත්සාහය යොදන්නා සමාජය මැද සැනසුණු හා සමාජය සනසන පුද්ගලයකු බවට පත්වීම නිරායාස සිද්ධියකි. ලෞකික ජීවිතය සමග මුදු ගතිය එක්වීමෙන් සිදුවන අර්ථය හා මෘදු ගතිය එක් නො වීමෙන් සිදුවන අනර්ථය යන කරුණු දෙක ඉහත සඳහන් වූ කරුණුවලට අනුව පැහැදිලි වී යයි සිතමු.

අත්ථ කුසලය සාද ගැනීම සඳහා උපකාර වන මුදු භාවය උදවන්නේ උජු-සුජු-සුවච යන ධම් වර්ධනය වීම නිසා ය. මේ ආකාරයෙන් ලෝභාදි ධම් සිතේ යටපත් වූ විට සද්ධා-සති-විරිය-සමාධි-පඤ්ඤ යන ධම් කොටස් මතුවී සිත සන්සුන් බවට පත් කරවන්නේ ය. මෙම ධම් කොටස්වල තේරුම් සැකෙවින් මෙසේ ය. සිත නිදෙස් ගතිවලින් යුක්ත කර දෙස් සහිත ගති ඉවත් කිරීම සඳහා සිතේ ඇති වන බලවත් ඕනෑකම ශ්‍රද්ධාව වශයෙන් තේරුම් ගත යුතු ය. තමා ගත් එම අදහස ක්‍රියාවට පත් වන්නේ ද යන්න සෙවීම සඳහා සිත පිළිබඳ පරීක්ෂාවෙන් යුක්තව සිටීම සතිය වශයෙන් තේරුම් ගත යුතු ය. එම ක්‍රියාව පහසුවෙන් කර ගැනීමේ සමත්කම තිබීම විරිය වශයෙන් තේරුම් ගත යුතු ය. මෙම ක්‍රියා ස්වරූප තුන එක් වී කෙලෙස්වලින් සිත මිදී ක්‍රියා කිරීමේ තත්ත්වයට පත්වීම සමාධි වශයෙන් තේරුම් ගත යුතු ය. තාවකාලිකව කෙලෙස් යටපත්කර සදගත් සමාධි තත්ත්වය සදකාලික වශයෙන් ක්‍රියා කිරීමේ තත්ත්වයට පත්වන්නේ, ලෝකයේ පවතින සියල්ල අනිත්‍ය-දුක්ඛ-අනාත්ම වශයෙන් පිළිගැනීමේ ශක්තිය මතුවූ විට ය. ප්‍රඥව වශයෙන් හඳුන්වන්නේ එය යි.

## මානයෙන් තොර බව (අනතිමානී)

ප්‍රඥවට අයත් යහපත් සිතිවිලි ස්වරූප සිතේ සකස් වීම දියුණු වන විට ලෝභයෙන් පෙළීමට හෝ ද්වේෂයෙන් පෙළීමට හෝ හේතු වන කිසිවකට ඔහු අසු නො වෙයි. බාහිර වස්තු

උපකාරයට ගෙන සතුට ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් වස්තු ඇසුරු කිරීම ලෝභයයි. බලාපොරොත්තුව අසාර්ථක වූ විට සිත දූෂිත ස්වරූපයෙන් ක්‍රියා කිරීම ද්වේෂයයි. මෙම ධර්ම සිතෙන් ඉවත්කර ගත් විට සැප ලැබෙන ආකාරයෙන් ක්‍රියා කිරීමට එම සිතට පුළුවන. මෙම තත්ත්වයට පත් වූ විට අවශ්‍ය සැපය සිතේ වගාකර ගන්නා ක්‍රමය එම සිතට දනේ. එබැවින් බාහිර නිමිති උපකාර කරගෙන සැප ලැබීම සඳහා යෙදූ උත්සාහය ඉදිරියට අවශ්‍ය නො වේ. එබැවින් යමක පවතින හොඳ හෝ නරක හෝ පිළිබඳ ප්‍රමාණය දන ගැනීම සඳහා අවධානය යොමු කිරීමේ අවශ්‍ය කමක් ඔහු තුළ මතු නො වේ. යමක මිම්ම යනුවෙන් සැලකෙන්නේ නිමිත්තක පවතින වර්ණ-හැඩ ආදීන්ගේ ප්‍රමාණයයි. මානය යනු එම වර්ණ හැඩ ආදීන්ගේ ප්‍රමාණ සෙවීම සඳහා යෙදෙන සිත් ස්වරූපය යි. කෙලෙස්වලින් මිශ්‍ර වූ පුහුදුන් සිත සෑම කරුණකදී ම හොඳ හා නො හොඳ සෙවීමේ හුරුවෙන් යුක්ත ය. තමා අපේක්ෂා කරන සැනසුම කුමන ස්වරූපයේ හැඩවලින් යුක්ත වස්තුවලින් ලබාගත හැකි වේ ද යන සෙවිල්ල මානයෙන් යුක්ත සිතෙන් කෙරෙන කෘත්‍යයයි. වස්තුවක පවතින මිම්ම දනගැනීම සඳහා එහි පවතින කොටස් කීපයක් පිළිබඳව විමසිලිමත් වීමට සිදු වෙයි. පාට-ගුණ-රස-හැඩ-සුවඳ-ලක්ෂණ ආදිය එයින් ප්‍රධාන කොටස් වෙනවා ඇත. නිමිත්තක් පිළිබඳ ලෝභය උපදින්නේ, තමා අපේක්ෂා කරන සැපය ලබාගැනීම සඳහා උපකාරී විය හැකි කොටස් එහි තිබෙන පමණට ය. අපේක්ෂිත සැපය ලබා ගැනීමට සරිලන කොටස් එහි විද්‍යමාන නො වන විට හෝ ලැබීමට බැරිවන විට හෝ ද්වේෂය මතුවීම ස්වභාවයකි. එහෙත් සිතෙන් කෙලෙස් ඉවත් වූ විට අවශ්‍ය සැපය සිතේ මතුවන බැවින් කිසිවක මිම්ම සෙවීමේ ඕනෑකම සිතේ පහළ නො වේ. එබැවින් නොයෙක් තාලයේ මිම් සොයමින් එතෙක් වින්ද පීඩා නැවත පහළ නො වනු ඇත. මෙම තත්ත්වයට සිත පත් වූ විට අනතිමානී ගතිය එම සිතේ පවතින බව පැහැදිලි ය.

* * *

සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො

උසස් අර්ථයක් සකස් කර දෙන ආකාරයෙන් සිත සකස් වූ විට එහි මතුවන ලක්ෂණ මෙම ගාථාවෙහි දක්වේ. සතුට ඇති බව, පහසුවෙන් පෝෂණය කළ හැකි බව, කෘත්‍ය බහුල නැතිකම, සැහැල්ලු පැවතුම් ඇති බව, ඉන්ද්‍රියයන්ගේ ශාන්ත භාවය, ස්ථානෝචිත ප්‍රඥාව ඇතිබව, සංවර වූ ඉන්ද්‍රියයන් ඇති බව, කුලයන්හි ඇලීමක් නැතිකම යන ස්වරූප සිතක පහළ වන විට සැනසීමේ තත්ත්වයට සිත වැටී ඇති බව පෙන්වන ලකුණු මෙම ගාථාවෙහි ගොනු වී තිබේ.

# 3 වැනි පරිච්ඡේදය

මෙම ධර්ම කොටස් එකින් එක ගෙන බලන විට එකකට එකක් ප්‍රත්‍ය වෙමින් පහළ වන බව ද, පැහැදිලි වනු ඇත. මෙසේ කෙලෙස්වලින් සිත මිදෙන විට නුපුරුදු සැනසිලිදායක වින්දන හැඟීම් පහළ වීමට පටන් ගන්නේ ය.

## සතුට ඇති බව ද (සන්තුස්සකො ච)

සතුට මතුවීම සිතේ කිළිටි ගති ඉවත්වීමෙන් සිදු වන්නෙකි. ඒ බව නුවණ මෙහෙයවා ක්‍රියා කිරීමෙන් ලැබෙන අත්දැකීම්වලින් වටහා ගත හැකි ය. සතුට මතුවෙන නිවැරැදි ක්‍රමය වැටහී නො තිබුණු බැවින් සතුට ලබා ගැනීම සඳහා බාහිර වස්තූන්ගේ උපකාර සෙවීමට සිදු විය. සිත කෙලෙස්වලින් මිදී නිදහස් තත්ත්වයට පත් වූ විට ලැබෙන වින්දන ස්වරූපය "සතුට" නමින් හඳුන්වමු. ආහාරයක් ගැනීමේදී නොයෙක් වර්ගයේ රස දැනේ. එම දැනීම, පැණිරස, ලුණුරස, ආදි නම්වලින් හැඳින්වෙන්නේ ඒ ඒ අවස්ථාවල දැනුණු වින්දන වෙන්කර පෙන්වීම සඳහා ය. සතුට යන හැඳින්වීම ද එලෙසින් ම වින්දන ස්වරූපය හඳුන්වන්නකි. රඳවාගත හැකි සතුටුදායක වින්දන ලැබීමේ අයිතියක් පුහුදුන් සිත තුළ නැත. නොයෙක් තාලයේ උපක්‍රම යොදා ලබා ගන්නා සතුට පුහුදුන් සිතේ වැඩි වේලාවක් නො රඳයි. ඊට හේතුව සතුට නැතිකර දමන හේතු මතු වී එය අතුරුදහන් කර දමීමයි. කුමන තාලයේ සතුටක් වුව ද සකස් වන්නේ එකම න්‍යායයක් මත ය.

කෙලෙස් යටපත් වූ විට මතුවන සතුට වැඩි කාලයක් පවත්වා ගැනීම ඊට අවශ්‍ය ක්‍රමය දැනීමේ පමණට අනුව සිදු විය යුතු ය. සැපදයක වින්දන ලබා ගැනීම සඳහා පුහුදුන් ලෝකයා දරන උත්සාහය, කරන වියදම, ලබන පීඩන මෙතෙකැයි සීමා කළ නො හැකි ය. දිවා රෑ දෙක්හි වෙහෙස විඳ මුදල් සපයන්නේ ද සතුටින් කාලය ගෙවීමේ මගක් සකස්කර ගැනීම සඳහා ය. බාහිර වස්තුවල උපකාරයෙන් සතුට ලබාගත යුතු ය යන තීරණය උඩ මෙම වෙහෙස විඳීමට සිදු වී තිබේ. එම වස්තුවලින් ලැබෙන සතුටක් නැතිවා නො වේ. එහෙත් එය පවත්වා ගැනීමට ඉඩ නො ලැබෙන බැවින් සතුට ලැබීමට උපකාර වන වාර ගණන හා වස්තු ප්‍රමාණයන් වැඩියෙන් සෙවීමට සිදු වී ඇත. මෙය සිදු වන්නේ මෙසේ ය. සතුට ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් කෙනෙක් යම් වස්තුවක් ඇසුරු කරයි. එය ලැබීමට උත්සාහය ද යොදයි. එම ගතිය ලෝභ නමින් හඳුන්වමු. නිමිත්තක් අරමුණු කරගෙන උපන් ලෝභ සිත අදහස් කළ නිමිත්ත ලැබෙන තුරු සිතේ දහ වේගය වැඩි කරයි. එයින් දැවීමට පත් කරන සිත නො ඉවසුම් තත්ත්වයට පත් වෙනවා ඇත.

මෙහි මතුවූයේ බලාපොරොත්තු වස්තුව ලැබීමේ නො ඉවසුම්කම නොව, එම වස්තුව අරමුණු කරගෙන නැගී ආ සිතෙන් නිපදවන දහය ඉවසිය නො හැකි කම ය. එය අප්‍රකට සිද්ධියක් බැවින් ඒ ගැන වැටහීමක් නැති අය පවසන්නේ එම වස්තුව නො ලැබීම නිසා හටගත් නො ඉවසුම් ගතියක් සැටියෙනි. එම මතය නිසා තමා තුළ ඇතිවූ දහය නිවීම පසෙක තිබියදී වස්තුව සෙවීමේ ම නිරත වේ.

වස්තුව අරමුණු කරගෙන උපන් දහ ගතිය සිතේ පවතින අතර, වස්තුව තමා වෙතට ළඟා වන විට සිතේ යම් සතුටු ස්වරූපයක් මතුවේ. එය සිතේ නැගී ආ දහය ක්‍රමයෙන් බැසයාමේ ලකුණකි. බලාපොරොත්තු වූ වස්තුව අතට පත් වූ විට සතුටක් මතුවන්නේ ඒ වෙනුවෙන් නැගී ආ දහය නැතිව යාමේ ඵලයක් වශයෙනි. එසේ නිවී ගිය සිතෙන් ලැබෙන සැනසිල්ල පවත්වා ගැනීමට නො හැකි වන්නේ නැවතත් එම නිමිත්ත හෝ වෙනත් නිමිත්තක් හෝ ඇසුරෙන් ලෝභ ගතිය මතුවී ඒම නිසා ය. එයින් බේරීමට ද කලින් යෙදූ උපක්‍රම ම යෙදිය යුතු ය. මෙසේ දහ

ගතිය මතුකිරීමේත්, ඒවා නිවා ගැනීමට උපක්‍රම යෙදීමේත්, නො නැවතී පවතින ක්‍රියාදාමයක එල්ලී, තාවකාලිකව සැනසිල්ලක් ලැබීම ලෞකික සැපය නමින් තීරණය කර පීඩා විඳීම හිමි කර ගෙන සිටිමු. කාරණය මැනවින් තේරුම් ගන්නේ නම් සිතේ දහය මතු කරන ලෝභ ගතිය ඉවත් කර සිත තබා ගත් විට බාහිර කිසිවක උපකාරයක් නැතිව සිත සැනසිල්ලේ පැවතීම නිරායාසයෙන් සිදුවන්නකි. දනට කෙරෙන්නේ සෝද සෝද මඩේ දැමීම වැනි ක්‍රියාවකි. පෙර විස්තර කළ ගාථාවේ සඳහන් අනතිමානී තත්ත්වයට සිත පත්වීමෙන්, කිසිවක මිම්ම සෙවීමේ ස්වරූපය සිතෙන් තුරන් වීම හේතු කොට ගෙන සිතේ මතුවන සැනසිලි දයක සෞම්‍ය ස්වරූපය සතුට නමින් හැඳින්වෙන බව ධර්ම ස්වරූපය පිළිබඳව සිත යොමු කිරීමේදී පැහැදිලි වනු ඇත. අත්ථ කුසලය සකස් වීමට උපකාර වන ධර්ම එක්වීමෙන් සතුට මතුවන්නේ එම සිතේ කෙලෙස් යටපත් වීමේ හේතුවෙන් බව වටහා ගැනීමට, මෙහි ඉදිරිපත් කළ හේතූන් ප්‍රමාණවත්යයි සිතමු.

## පහසුවෙන් පෝෂණය කළ හැකි බව (සුභරෝ ච)

පෝෂණය කිරීම සඳහා කොටස් දෙකක් අප සතුව ඇත. එනම් සිරුර හා සිත ය. සිරුර පෝෂණය කිරීමට වඩා සිත පෝෂණය කිරීමට දැඩි වෙහෙසක් විඳීමට සිදු වී තිබේ. සාගින්න මකා ගැනීම සඳහා ආහාරයක් අවශ්‍ය වේ. දිරවා ගත හැකි අපථ්‍ය නො වන ආහාරයක් ගැනීම ජීවිතය රඳවා ගැනීමට ප්‍රමාණවත් වනු ඇත. එය සෙවීම එතරම් අපහසු කරුණක් නො වේ. සාගින්න සමග සිතේ උපදින කෙලෙස් දහය නිවාලීම එතරම් පහසු නො වේ. ලබන ආහාරයේ රස අවශ්‍යකම පදනම් වී ඇති ලෝභයෙන් උපදවන සිතේ දැවීම එක් හේතුවකි. තමාගේ තත්ත්වයට ගැලපෙන ආහාරයක් පිළිබඳව උපදින ලෝභය, දහය වැඩි කිරීමට තවත් හේතුවකි. ආහාරය ශක්තිජනක ධාතු කොටස් වලින් යුක්තව තිබිය යුතු ය යන බලාපොරොත්තුව තවත් හේතුවකි. මෙම කරුණු අනුව බලන විට ආහාර සෙවීම සඳහා හේතු වූ සාගින්න නිවා ගැනීම එතරම් ලෙහෙසි නො වන බව පැහැදිලි වනු ඇත. ආහාරවල ඇති රස අතුරින් තමා ප්‍රිය කරන රසය ම ලබාගත හැකි ආකාරයක් මොහු සොයයි. ඒ අතර සුළු තත්ත්වයේ ආහාරයකින් එම රසය ලබාගත හැකි වුව ද. තමාගේ තත්ත්වයට

ගැලපෙන අයුරින් නො පවතී නම් එම ආහාරය මොහුගේ සැනසිල්ලට හේතු නො වේ. මේ ආදි සිතුම් ස්වරූප සමඟ සිත බැඳී උපදවන දහය සිතෙන් ඉවත් කර සාගින්න නිවා ගැනීමට සෑහෙන උත්සාහයක් හා වියදමක් ආහාරය ගැනීම සඳහා යෙදෙන බව පැහැදිලි ය. මේ අනුව බලන විට ජීවිතය පවත්වාගෙන යාම නම් වූ පෝෂණයේ පහසු කමක් නො පෙනේ.

තව ද ඇඳුම්-පැලඳුම්, යාන-වාහන ආදිය හා නිවාස සම්බන්ධව ද මෙම ස්වරූපයට ම ක්‍රියා කරමින් මිනිසා රහසිගත පීඩා දමයක පැටලී සිටින බව කිව යුතු ය. ජීවිත පෝෂණය පිළිබඳ මෙ පමණ කරුණුවලින් අපහසුකම් මතුකර ගන්නා පුද්ගලයාට සැනසිල්ල පරිහරණයට කිසිදු අවස්ථාවක් නො ලැබෙන බව පැහැදිලි ය. මෙම නොසැනසිල්ල මතු වූයේ සිතෙන් මතු වූ කිලිටි ගතිවල බලපෑමෙන් බව තේරුම් ගැනීම අපහසු නැත.

අත්ථ කුසලය සකස් කිරීමේ මගට පිළිපන් පුද්ගලයා තුළ කෙලෙස් යටපත් වී තිබෙන බැවින් පිනවන ගතිය නිතර තිබේ. සිත පිනවා ගැනීම සඳහා ඔහුට බාහිර යමක උපකාර අවශ්‍ය නැත. ඒ හේතුව නිසා සාගින්න මතුවූ විට එම ගින්න නිවා ගැනීමට පමණක් සුදුසු ආහාරයක් ඔහු ලබා ගන්නවා ඇත. රසයේ හා ආහාරයේ වැදගත් නො වැදගත් කම්වලින් ඔහුට කාරියක් නැත. ලබා ගත හැකි වූ ආහාරය ඔහු බුදින්නේ සිතේ ඇති සතුට මිශ්‍ර කරගෙන ය. සතුටින් ආහාර ගන්නා ඔහුට ආහාරය පිළිබඳව කිසිදු විවේචනයක් අවශ්‍ය නො වේ. ඇඳුම්, පැළඳුම්, යාන-වාහන ආදි සියල්ල පිළිබඳව ද ඔහුගේ ක්‍රමය එලෙසින්ම ය. එබැවින් පහසුවෙන් පෝෂණය කළ හැකි ස්වරූපය මෙහි පවතින බව පැහැදිලි ය.

## කටයුතු බහුල නො වීම ද (අප්පකිච්චො ච)

සෑම පුද්ගලයකුට ම වැඩ වැඩි වන්නේ ජීවිතය පෝෂණය කිරීමේ කටයුතු හා අංග වැඩිවීමේ හේතුවෙනි. ජීවිතයට අවශ්‍ය කොටස් ඉතා උසස් තත්වයෙන් පරිහරණය කරමින් සතුටින් සිටීමට වැඩ යොදගෙන සිටින්නා ඒ සියල්ල නඩත්තු කිරීම සඳහා සෑහෙන ධනයක් ඉපයීම කළ යුතු ය. ධනය උපදවමින්

රැස්කිරීමේ පැත්තට වැටුණු පුද්ගලයාට, කොතෙක් ලැබුනේ නමුදු තමාගේ සිතේ පහළ වන අවශ්‍යකම් සපුරා ගැනීම සඳහා ලැබෙන ධනය කොහොමට වත් නො සෑහේ. නිසි මාර්ගවලින් ලැබෙන ධනය ඔහුට මදි බැවින් අනිසි මාර්ග පාදගෙන හෝ ධනය සෙවීමට ඔහු පෙළඹෙයි. එබැවින් කරන රැකියාවට අමතරව වෙනත් ආදයම් ක්‍රමවලට යොමු වන මොහුට තෙහෙට්ටු වීමට ද පුළුවන් කමක් නැත. ඒ නිසා පහසු මාර්ගවලින් ධනය සෙවීමට යොද ගන්නා මාර්ග වශයෙන් සොරකම් කිරීම, මරණය පිණිස සතුන් ඇති කිරීම, කූට උපක්‍රම යොද අන්සතු දේ අයත් කර ගැනීම, අසාධාරණ ක්‍රමයට වෙළඳාම් කිරීම ආදි මිනිස් කමට කිසි සේත් නො ගැලපෙන ක්‍රියාමාර්ගවලට මොහු පත් වන්නේ ය. සැනසිල්ල සෙවීම සඳහා යොදගත් වැඩ ගොඩ නිසා පීඩාදයක තත්ත්වයට පත් වී තිබෙන බව පෙනෙන්නේ සෑහෙන දුරක් වැඩ ගොඩේ පටලැවී වෙලුනාට පසුව ය. නමුත් තමාගේ ක්‍රියාවලින් මෙසේ වැඩ ගොඩ ගසාගෙන ඒ මැදට වී පෙළීමෙන් පීඩා විඳීම අත්ථ කුසලය සකස් කිරීමේ යෙදෙන්නාට අහිමි ය. පහසුවෙන් පෝෂණය කළ හැකි සිතක් හා ගතක් හිමිකර ගත් මොහුට සිතෙන් මතුවන සතුට භුක්ති විඳිමින් ජීවිතයේ පැවැත්මට කුමක් හෝ අවශ්‍ය යමක් සපයා ගැනීම වැඩි වැඩක් නො වෙනවා ඇත. එබැවින් කෘත්‍ය බහුලත්වයෙන් තොර වූ තැනැත්තාගේ ජීවිතය සැහැල්ලු ය.

## සැහැල්ලු පැවතුම් ඇති බව (සල්ලහුක වුත්ති)

කෙනකුගේ ජීවිතයක් බර වන්නේ ඔහුගේ ශරීරයේ ප්‍රමාණයට අනුව නො වේ. තමා හදගත් සිරුර තමාට බරක් නො වේ. එහෙත් බර වන්නේ තමාගේ සිත ය. සිත බරවන්නේ කෙලෙස්වලිනි. සිතට කෙලෙස් එක් කරන හේතූන් බොහෝ ය. කෙලෙස්වල ඇති බර ප්‍රමාණය නිමිති සමග එක් වී ක්‍රියා කරන අවස්ථාවලදී තේරුම් ගත හැකි ය. ඇඳුමක් දවටා ගත් සමහරු ලෝකයාගේ අවධානය තමා කෙරෙහි යොමුකර ගැනීමට උත්සාහ ගනිති. එය සාර්ථක වීමට තරම් සුදුසු තත්ත්වයක් ඇඳුමේ තිබේ ද යන සැකය පදනම් කොට මතුවන සිතේ බර ගතිය ද සෑහෙන පීඩනයක් මතු කරනවා ඇත. තමාට අයත්ව පවතින මිල මුදල්, වතුපිටි, ගේදෙර, තනතුරු, ගෞරව, සැලකිලි ආදිය රැකගැනීමේ

හැඟීම් හා යෙදිය යුතු උපක්‍රම සඳහා රොක්වන සිතුම්වල බර උසුලා ගැනීමට බැරිකම නිසා පීඩා විඳී. ඒවා පසෙකින් තැබීමට හැකි තත්ත්වයක් ද නැත. මේ සියල්ල සැනසීම ලබා ගැනීම සඳහා ගොනු කර ගත් කොටස් ය.

අත්ථ කුසලය සකස් කිරීමේ පැත්තට යොමු වූ තැනැත්තාගේ සිතේ පවතින සතුට ඔහුට තෘප්තිමත් වීමට තරම් ප්‍රමාණවත් බැවින් ඔහු සතුව තිබෙන වස්තුව හෝ අන්‍ය වූ කිසිවක් ඔහුට බරක් නො වන්නේ ය. ඒවා පිළිබඳ කළයුතු දේ සියල්ල, නිදහස් හා සැහැල්ලු සිතකින් යුක්තව ඔහුට කළ හැකි ය. අපේක්ෂාවක් හෝ බැඳීමක් හෝ නැතිව ලෝකීය දේ පරිහරණය කරන බැවින් අමුතු බරක් සිතේ නැතිව ජීවත් වීමේ අයිතිය ඔහු ලබනවා ඇත. සිතක් සැහැල්ලු වන අයුරු මෙයින් පැහැදිලි වේ.

## ඉන්ද්‍රියයන්ගේ සන්සුන් බව ද (සන්තින්ද්‍රියො ච)

සිත කෙලෙස් වලින් බරවී තිබෙන පුද්ගලයාගේ ඉන්ද්‍රියයන් තුළට ද, එම බර ගතිය එක් වේ. පුහුදුන් පුද්ගලයාගේ මනෝ ධාතුව (මොළය) නිතර අවුල් සහිත ය. මනින්ද්‍රිය (මොළයේ ක්‍රියා කාරීත්වය) වේගවත් වීම කෙළෙස් සහිත පුද්ගලයාගේ මොළයේ ස්වභාවයයි. ඊට ම සම්බන්ධ ඇස-කණ-නාසය-දිව-ශරීරය ආදි බාහිර කොටස් ද ඒ හේතුවෙන් නො සන්සුන් තත්ත්වයෙන් ක්‍රියාත්මක වෙනවා ඇත. කථාව ද වේගවත් වන්නේ ය. ක්‍රියාවන් ද එසේම ය. සන්සුන් ස්වරූප ඒ කිසිවක නැත. සිතේ පවතින නො සන්සුන්කම හේතුකොට ගෙන මතුවන ද්වේෂ ගතිය නිසා අසන්නාගේ සිත රිදෙන අයුරින් ක්‍රියා හා වචන සිදු වන්නේ ය. ඉවසුම් සහිතව කළ හැකි කිසිවක් ඔහුගේ ජීවිතයේ නැත. සෑම ක්‍රියාවක් ම ඉක්මණින් අවසන් කිරීමට උත්සාහ දැරීම ඔහුගේ ස්වභාවය යි. විනාඩියක පරක්කුව ඔහුට දනෙන්නේ සතියක් ගත කරන්නාක් මෙනි. පවුලේ සාමාජිකයන් පවා රිස්සුම් නො දෙන තත්ත්වය උද වී ඇනුම්-බැණුම්-ගෙරවුම් මතු වන්නේ ද මෙම හේතුව නිසා ය. අසල් වැසියන් සමග සුළු කරුණකදී පවා අමනාප වෙන තත්ත්වයක් උදකර ගන්නේ කාරණය පිළිබඳව සන්සුන්ව සිතීමේ ශක්තිය මනින්ද්‍රියේ නැති බැවිනි. අනන්ත කරුණු ගොඩගසා ගෙන තීරණ සෙවීමට

වෙහෙසෙන මොහුට ඇගේ ස්පර්ශ වන සුළං රැල්ල පවා රිස්සුම් නො දෙන අවස්ථා ඇත. කෙලෙස්වල බලපෑමෙන් උදවෙන ක්‍රියා වේගවලට අවනත වී ක්‍රියා කිරීමට පෙළඹෙන බැවින් විඳගැනීමට සිදුවන පීඩන සීමා රහිත ය. එහෙත් අත්ථ කුසලය සකස් කිරීමේ පැත්තට යොමු වන්නාට කෙලෙස් වලින් කිසිදු බලපෑමක් නො ලැබෙන බැවින් සියළු ඉන්ද්‍රියයන් ශාන්තව පරිහරණය කිරීමේ හැකියාව ලැබෙන අතර, ඔහුගේ ඇසුරට වැටෙන්නා ද, සැනසීමට පත්කිරීමේ හැකියාව ඔහු තුළ සකස් වන්නේ ය. යමක් පිළිබඳව නිවැරැදි තීරණයක් ගැනීම සඳහා නිදහස්ව කල්පනා කිරීමේ හැකියාව ද සකස් වන්නේ ය. එයට හේතුව මනින්ද්‍රිය වේගවත්ව ක්‍රියාවට පත් නො වීම ය. කිසිදු අවුලක් නැති තත්වයෙන් ක්‍රියා කරන මනින්ද්‍රියයෙන් පාලනය වන පංචෙන්ද්‍රියයන් සෑම කරුණක් පිළිබඳව ම සන්සුන්ව ක්‍රියා කරන බැවින්, ලෝකයා අතර මොහු සැනසුණු පුද්ගලයෙකි.

## නේපක්ක ප්‍රඥව හෙවත් අවස්ථාවට සුදුසු අයුරින් තීරණය ගැනීමේ ශක්තිය (නිපකො ච)

ස්ථානොචිත ප්‍රඥව ජීවිත තුළ ක්‍රියා නො කිරීමේ හේතුව නිසා අවුල් හදගන්නා අවස්ථා පුහුදුන් ජීවිත තුළ එමට තිබේ. ජීවිතය සමග එක්වෙන සියළු කරුණු පිළිබඳව කාරණයට අනුව තීරණ ගැනීමේ ශක්තිය අඩු වන පමණට එයින් ලැබිය හැකි ප්‍රයෝජන ද අඩු වෙනවා ඇත. සමාජයක ජීවත් වීමේදී දරු දැරියන්, ස්වාමි පුරුෂයන්, භායර්‍යාවන්. නෑදයන්, අසල් වැසියන්, විවිධ ජාතිකයන් ආදි කොටස්වලට බෙදෙන පුද්ගලයන් හා ඇසුරට පත් වීමට සිදු වන්නේ ය. එසේ ම තමා සතු දේපොල හා අනුන් සතු දේපොල වශයෙන් ද කොටස් දෙකක් ඇසුරු කිරීමේ අයිතිය අපි ලබා සිටිමු. මෙකී සියළු නිමිති සමග ඇසුරට පත් වීම ජීවිතයක පීඩනයට හේතු නො විය යුතු ය. ඒ සියල්ල අපේ සැනසිල්ලට උපකාර වෙන අයුරින් පරිහරණය කිරීමේ ශක්තිය අප ළඟ තිබිය යුතු ය. එහෙත් පුහුදුන් කමේ වරදින් ඉහත කී කරුණු පීඩා ගෙන දෙන තත්ත්වයට පත්වීම පුදුමයක් නො වේ. තමන්ට සහාය වීම පිණිස සබඳ වෙන සහකාරිය තමාගේ අසහනය මතුකර පීඩා දෙන වස්තුවක් බවට පෙරළා ගන්නේ ඉහතකී ප්‍රඥව යොද නො ගන්නා වරදිනි. එපමණ

දියුණු තත්ත්වයක් තමන් තුළ නැතිය යන දුර්වල හැඟීම බොහෝ දෙනා තුළ පවතින්නකි. එය වරදකි. ජීවිතය අස්සේ කුමන කාලයේ පුළුවන්කම් තිබේදැයි අපි නො දනිමු. තමන් තුළ පවතින්නා වූ හොඳ ශක්තීන් මතුකර ගැනීමට අවශ්‍ය හේතු එක් වෙන විට ඒවා මතු නො වී නො සිටිනවා ඇත. යමක තිබෙන ඇත්ත දැන ගැනීම නුවණ වශයෙන් සලකමු. යමක ඇත්ත දැක ගැනීමට මැදහත් සිතින් යුක්තව සාධාරණව සිතීමේ හැකියාව මතුවිය යුතු ය. දරුවන් පිළිබඳව දෙමාපියන් ඇත්ත දකින්නේ නම් ඔවුන් පිළිබඳව සිතේ පීඩා මතුවීමට තිබෙන ඉඩකඩ දුරු වී යනවා ඇත. දරුවන්ගේ පැවැතුම් තුළ අකීකරුකම්, වැරදි මාර්ගවල ගමන් කිරීම්, උත්සාහයෙන් තොරව ක්‍රියා කිරීම් ආදිය තිබිය හැකි ය. මේ ස්වරූපයන් පිළිබඳ ඇත්ත නො පෙනෙන මාපියෝ බලවත් චිත්තපීඩා විඳිති. යමකු වැරදි මග ගමන් කරන්නේ හරි මග කුමක් ද යන්න ඔහුට හරිහැටි වැටහී නැති බැවිනි. කෙනෙක් එය පෙන්වා දුන්නේ ද, එය නො වැටහෙන්නේ වටහා ගැනීමේ ශක්තිය නැති බැවිනි. ඔවුන්ගේ මානසික මට්ටම්වලට අනුව වැරදි මාර්ග ඔවුන්ට රුචි වෙයි. ඇතැම් විට ඇසුරට වැටී තිබෙන පුද්ගලයන්ගේ බලපෑම් නිසා ඔවුන් වැරදි මගට වැටී සිටිනවා ඇත. හේතු මෙතෙක් තිබියදී දරුවා නමැති නිමිත්ත සමග විරුද්ධ වී පීඩා විඳින්නේ දෙමාපියන් තුළ තිබෙන ඒ සියල්ල පිළිබඳ නිවැරැදි ඇත්ත වටහාගෙන ඉවසිල්ලෙන් යුක්තව දරුවන් හරි මගට දමා ගැනීමට සුදුසු පිළියම් යෙදීමේ අසමත් කම නිසා ය. වරද දුටු විට නො ඉවසිලිමත්ව ද්වේෂය මතුකර ගෙන ඊට අනුව ක්‍රියා කරනවා විනා මෛත්‍රියෙන් යුක්තව කාරණය පිළිබඳව නුවණින් සලකා බලා අවස්ථාවට ගැලපෙන අයුරින් දෙපක්ෂයේ ම සැනසිල්ලට හේතු වන තීරණ ගැනීමේ හැකියාව දෙමාපියන් තුළින් ක්‍රියාත්මක නො වන බැවින් දරුවන් පිළිබඳ දුකින් පෙළීමට පත් වෙන බොහෝ දෙමාපියෝ වෙති.

භාර්‍යාවගේ පැවතුම් නො රුස්සන ස්වාමියාගේ තත්ත්වය පිළිබඳව කිව යුත්තේ ද එම අදහසම ය. ස්වාමියාගේ පැවතුම් නො රුස්සන භාර්‍යාව ද වැටෙන්නේ එම තත්වයටම ය. යම් වරදක් සිදු වන්නේ හේතුවක් පදනම් කරගෙන ය. එම හේතුව සොයා ගත් විට වරද නවත්වා ගැනීමට ඉඩ සලසා ගතහැකි ය.

හේතුව අස්කර ගැනීම සඳහා ගතයුතු මාර්ගය තීරණය කරගැනීම නේපක්ක ප්‍රඥවෙන් කෙරෙන කෘත්‍යයකි. ජීවිතයේ සෑම කරුණක් පිළිබඳව ම මෙම නුවණ යෙදීමේ හැකියාව ඇති තැනැත්තාට ජීවිතයෙන් ලබන බොහෝ පීඩා මග හරවා ගෙන සැනසිල්ලේ ජීවත් වීමේ තත්ත්වය උදකරගත හැකි වන්නේ ය. ඉවසිලිමත් වන්නේ නම් මෙය අපහසු ක්‍රියාවක් නො වේ. අත්ථ කුසලය සකස් කිරීමේ වැඩට යොමු වූ විට නේපක්ක ප්‍රඥව ක්‍රියාත්මක කරගත හැකි සුදුසුකම් උදවනු ඇත. සිතෙන් කෙලෙස් ඉවත්ව, සතුට මතුවී, ඉන්ද්‍රියයන්ගේ දමුණු ස්වරූපය උදකර ගත් විට යම් කාරණයක් පිළිබඳව නිරවුල් ව සිතා ගැනීම හා නිවැරැදිව තීරණය දීමේ නිදහස එම සිතට හිමි වන්නේ ය. එබැවින් සෑම කාරණයක් පිළිබඳව ම එම සිතෙන් තීරණය මතුවන්නේ නේපක්ක ප්‍රඥවට අයත් ස්වරූපය පදනම් කරගෙන ය. එම හේතුව නිසා පීඩාවට පත් කරන කිසිවක් එම සිත් සමග එක්වීමට ඉඩ නැත. අවස්ථාවට උචිත ලෙසින් ක්‍රියා කිරීම සඳහා උපකාර වන නිවැරදි තීරණ ගැනීමේ හැකියාව දියුණු වන විට සිත සමග කෙලෙස් එක්වීමට තිබෙන හේතුව ද වැසී යන්නේ ය. මෙම තත්ත්වයට පත් වෙන විට කෙලෙස් මිශ්‍ර ව ක්‍රියා කිරීම හා වචන කීම සඳහා තිබූ හුරුව දුබල වී කෙලෙස්වලින් තොර වූ වචන කීමේ හා ක්‍රියා කිරීමේ හුරුව ශක්තිමත් වන්නේ ය. එය හැඳින්වෙන්නේ "අප්පගබ්භ" යන නාමයෙනි.

## කය හා වචනය දමුණු ස්වරූපයෙන් යුක්ත වීම (අප්පගබ්භො)

ක්‍රියා හා වචනවල නො දමුණු ස්වරූප හුරු වී තිබේ නම් ඒ හේතුවෙන් මුහුණ පෑමට සිදු වන පීඩා සහිත අවස්ථා එමට ය. කියවෙන වචනවල පවතින රෞද්‍ර ශබ්ද විලාශ හේතු කොට ගෙන අසන්නාගේ සිත කෝපයට පත්වීමට පුළුවන. ඇතැම් විට ඔහු එය ඕනෑකමින් කළ දෙයක් නො ව කෙලෙස් සමග මිශ්‍ර වචන කීමේ හුරුව තිබීමේ හේතුවෙන් මතුවූ ප්‍රතිඵලයක් විය හැකි ය. තමාගේ වචන ඇසූ පුද්ගලයාගේ සිත කෝපයට පත් වූ බව දත් විට ප්‍රකාශ කළ තැනැත්තා ඇතැම් විට පසුතැවිල්ලට හා පීඩාවට පත් වෙනවා ඇත. තමාගේ වරදින් ඔහුගේ සිත රිදවාගත් බව වැටහුණේ පසුව ය. කෙනකු කරන වැඩකට අත

දමා නිකරුණේ දෙස් අසන පුද්ගලයන් එමට ය. එම ක්‍රියාව වරදක් බව ඔහුට වැටහෙන්නේ ක්‍රියාවෙන් පසුව ය. එසේ ම අනවශ්‍ය දේවලට කිපී අනර්ථ සිදු කර ගන්නා පුද්ගලයෝ ද සමාජයේ එමට සිටිති. එවැනි පුද්ගලයන්ට සමාජය අපායක් වැනි ය. ඔවුන් සමාජ ඇසුර ප්‍රයෝජනයට ගෙන ඇත්තේ දුක් විඳීම සඳහා ය. ඒ සියල්ල කැමැත්තෙන් කරන දේ නොව කෙලෙස් පුරුද්ද බලපෑමෙන් සිදු වන අනවශ්‍ය සිද්ධීන් ය. තවද නිතර කාමරාග ආදි සිත් පහළ වී රාගික ක්‍රියාවල යෙදෙන විලි බිය නැති පුද්ගලයන් සමාජයේ කොතෙකුත් දක්ක හැකි ය. ඔවුනට ද ශීලාචාර ගුණසම්පන්න මිනිසුන් ලෙසින් ක්‍රියා කිරීමේ ආශාව තිබේ. එහෙත් ජීවිතය සමඟ බැඳී ඇති නො මනා පුරුදු විසින් ඔවුන් සදහට ම සමාජයෙන් කොන් කරන පුද්ගලයන් බවට පත් කරනු ලැබේ. 'අප්පගබ්භ' ස්වරූපයට ජීවිත පත් නො වීමේ හේතුවෙන් සිදු වන අනර්ථකාරී ස්වරූපවලින් ජීවිතයට දෙන පීඩා තේරුම් ගැනීමට මෙම කරුණු ප්‍රමාණවත් වේයයි සිතමු. අත්ථ කුසලය සකස් කර ගැනීම සඳහා යොමු වී ක්‍රියා කරන්නා තුළ ශෝභන සිත් ස්වරූප මතුවේ. ජීවිතයට හුරු වී තිබූ විවිධ ආකාරවල වැරදි ක්‍රියා හා වචන සංවිධානය කරන කෙලෙස් වේග අඩු වේ. ඒ හේතුකොට ගෙන නිවැරදි වචන හා නිවැරදි ක්‍රියා කිරීමේ හුරුවට පත් වන්නේ ය. එබැවින් ඔහුගේ ඇසුරට පත් වෙන කුමන දෙයක් හෝ තමාගේ සැනසිල්ලට හේතුවන අයුරින් පරිහරණය කිරීමේ භාග්‍යය ඔහු සතු වෙනවා ඇත. හිතවතකු හෝ අහිතවතකු හෝ ඔහුට නැත. සියල්ල ඔහු සමග හිතවත් ය. සියල්ල සමඟ ඔහු හිතවත් ය. එයින් මතුවන්නේ විවිධත්වය සමඟ මොහු නො බැඳෙන බවයි.

## කුලයන්හි නො ඇලීම (කුලේසු අනනුගිද්ධො)

ලෝකය විවිධ ය. එහි විද්‍යමාන සියල්ල ම විවිධ ස්වරූපවලින් යුක්ත ය. එම විවිධත්වයන් සමඟ ඇසුරට පත් වෙන සිත ද විවිධ ස්වරූපවලින් ක්‍රියා කරනවා ඇත. ඇලීම හා ගැටීම සිත විවිධ පීඩාවලට පත් කරන ප්‍රධාන හේතු දෙක ය. එම ක්‍රියාකාරී පදනම මත රැඳී ක්‍රියා කරන සිතේ හටගන්නා දුක් සුවරූපය මෙතෙකැයි කිව නො හැකි ය. එකී දුක් සියල්ල ම නිමිත්තක් සමඟ සිත බැඳී ක්‍රියා කිරීමේදී මතුවන කෙලෙස්වල

ප්‍රමාණ පෙන්වයි. සිත නිමිත්තක් සමඟ ඇලී පවතින ප්‍රමාණ අනුව එම නිමිත්ත පිළිබඳව වගකීම භාරගෙන තිබෙන ප්‍රමාණය පැහැදිලි වේ. ඇලීම අඩු පමණට වගකීමේ භාරය ද අත්හැරෙනවා ඇත. දරුවන් පිළිබඳව දෙමාපියන් තුළ ඇතිවන ඇලීමේ දැඩි ස්වභාවය හේතුකොට ගෙන දරුවන්ගේ ඉරියව් පවා පාලනය කිරීමේ උත්සාහය ඇති වන්නේ ය. භාණ්ඩයක් පිළිබඳ ඇලීමේ ප්‍රමාණය අනුව එය තබන තැන, ආරක්ෂා කළ යුතු ආකාරය, පිරිසිදුව තැබිය යුතු බව, අන්‍යයන්ගේ පරිහරණයෙන් වලක්වා ගැනීම ආදිය එම භාණ්ඩය පිළිබඳ තමා පවරාගෙන ඇති වගකීම පැහැදිලි කරයි. වගකීමේ ක්‍රමය වැඩි වෙන පමණට වග කියන්නාගේ සිතේ ඇති වන පීඩනය ද වැඩි වෙනවා ඇත. ඇතැම් අවස්ථාවල අන්‍යයන් සතු වස්තු පිළිබඳව ද අපේ ඇලීම ඇති වන අවස්ථා නැතිවා නො වේ. එවැනි අවස්ථාවල ඇලීමට අනුව වගකීමේ කටයුතු තමාගේ මනාපයේ හැටියට කිරීමට ඉඩ නො ලැබෙන බැවින් ඒ පිළිබඳව කළ යුතු දේ සම්බන්ධ ව වස්තු හිමියාට අවවාද දීමට ඉදිරිපත් වීම සිරිත ය. කෙනකු ළඟ තිබෙන මුවහත් ඇති පිහියක් දුටු අනෙකාගේ සිතේ ඒ ගැන බැඳීම ඇති විය හැකි ය. එම බැඳීම ඇතිවුව ද තමාගේ මනාපය අනුව යමක් කිරීමට බැරි බැවින් එම පිහිය පාවිච්චි කළ යුතු ආකාරය පිහිය හිමියාට කියා දීමට ඉදිරිපත් වන්නේ ය. මලකඩ නො ඇල්ලීම සඳහා තෙල් ටිකක් තැවරිය යුතු බව, තද ලී වර්ග කැපීම සුදුසු නැති බව, ප්‍රවේශම් කළ යුතු බව ආදිය කැටි වූ අධ්‍යාපනයක් පිහිය හිමියාට ඔහුගෙන් ලැබෙනවා ඇත. මේ සියල්ල ඔහුට පිහිය අයිති නම් කරන වත්පිළිවෙත් ටික ය. අයිතිකරුට එසේ කියාදීම සඳහා ඉදිරිපත් වීමට හේතු වූයේ පිහිය කෙරෙහි ඔහුගේ බැඳීම පවතින බැවිනි. තමාගේ සිත නො බැඳෙන තත්ත්වයක පිහියක් වූයේ නම් ඒ ගැන ඔහු ඉදිරිපත් කරන්නේ දෙස් සහිත කරුණු ය.

කරුණාවෙන් හා මෛත්‍රියෙන් යුක්තව මෙම අදහස් කෙනෙකුගේ යහපත සඳහා දිය හැකි ය. එහෙත් කෙලෙස්වලින් බර වී තිබෙන සිතක් ක්‍රියා කරන්නේ එම මිශ්‍රණයෙන් යුක්ත වී බැවින් පුහුදුන් පුද්ගලයන්ට එම ක්‍රියාව කළ හැක්කේ ඇලීම පදනම් කරගෙන ය. තමාගේ දරුවාට වඩා ඉහළින් වෙනත්

දරුවකු කුමකින් හෝ සමත් වේ නම් තම දරුවා පිළිබඳව ද්වේෂය දෙමාපියන් තුළ ඇති වීම ස්වභාවයකි. ඊට හේතු වන්නේ එවැනි සමත්කම් ඇති දරුවකු තමන් සතු ව තබා ගැනීමේ ආශාව තිබීමත්, එම අයිතිය තමන්ට නැති කමත් ය. මේ අයුරින් විවිධ ආකාරයට සකස් වී ඇති නිමිති පිළිබඳ ව සිතේ ඇති වන 'ශෝධය' කුලයන්හි ඇලීම යනුවෙන් පෙන්වා තිබේ. නිල්-කහ-රතු-උස-මහත-ඝන-තද ආදිය නිමිතිවල විවිධත්වය මතු කරන කරුණු වලින් සමහරකි. ඒ කොටස පිළිබඳ අවශ්‍යකම මතුවන ආකාරයෙන් ඇලීම් මතු වනු ඇත. මෙයින් තොර ව ක්‍රියා කිරීමේ හැකියාව පුහුදුන් සිතට නැත. බාහිර දේ තමාගේ සැපය සඳහා යොද ගැනීමේ හුරුව හා අපේක්ෂාව තිබීම මෙයට හේතුව වශයෙන් සැලකිය යුතු ය. නො ඇලී සිටීමේ හැකියාව පුහුදුන් සිතට හුරු නැත. ඒ නිසාය, මතුවන පීඩා සියල්ල විඳ ගැනීමට සිදු වී ඇත්තේ. අත්ථ කුසලය සෑදීමේ පැත්තට යොමු වී කෙලෙස්වලින් සිත මුදවා පිනවන ස්වරූපය සාදගත් විට කිසිවක් පිළිබඳ ව ඇලීමට හේතුවක් නැත. මොහු යොමු වන්නේ වස්තුවල පවතින විවිධත්වය හඳුනා වස්තුව තෝරා ගැනීමට පමණි. ඇලීමකට නො වේ. කෙලෙස් ඉවත් වී තිබීම හා පිනවන තත්ත්වයෙන් සිත පැවතීම මෙයට හේතු වශයෙන් සැලකිය යුතු ය. මෙතෙක් ඉදිරිපත් කළ දෙයින් විස්තර වූයේ අත්ථ කුසලය සකස් කිරීම සඳහා අවශ්‍ය දක්ෂකම මතුවීමේදී සිතේ මතුවන ලක්ෂණවල ක්‍රියා ස්වරූපයන් ය. එම ලක්ෂණ සිතේ මතුවීම හේතු කොට ගෙන සිත ක්‍රියාවට පත්වීමේදී බාහිර ලෝකය සමග එම සිත පිළිපදින ආකාරය සාමාන්‍ය පුද්ගලයෙකුගේ ස්වරූපය ඉක්මවා යන තත්වයෙන් යුක්ත ය. මෙතෙක් පැහැදිලි කරන ලද්දේ අත්ථ කුසලය සිතක සකස් වන ක්‍රමය පිළිබඳව ය.

* * *

**නවබුද්දං සමාචරෙ කිංචි**
**යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං**
**සුඛිනො වා ඛෙමිනො හොන්තු**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා**

ඇසුරට පත් වන කිසිවකු කෝපයට පත් කරවන ක්‍රියා නැතිකම. නැණවතුන් විසින් දෙස් තබන කිසිදු වරදක් තමාගෙන් නො කෙරෙන බව. සෑම කෙනකු ම සැපය ලබා එය දරා සිටින්නන් විය යුතු බව, සියළු සත්වයන් සැපයෙන් දිවි ගෙවන්නන් විය යුතු බව, මොහුගේ සිතේ ඇති වන ප්‍රාර්ථනාව යි.

# 4 වැනි පරිච්ඡේදය

## නුවණැත්තන්ගේ දෝෂාරෝපණයට ලක් වන සුලු හෝ කිසිදු ක්‍රියාවක් නැති බව (නචඛුද්දං සමාචරේ කිංචි යෙන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං)

කිසිවකු නො සන්සුන් බවට පත් නො කිරීම සැපයට යොමු වූ සිතක පවතින හැඟීම් ලක්ෂණයක් බව මෙහි හැඳින්වේ. පුහුදුන් සමාජය දෙස බලන විට නිතර ම අනෙකා රිදවන ස්වරූපය එම සිත්වල ක්‍රියා කරන බව දැකිය හැකි ය. ඊර්ෂ්‍යා-ක්‍රෝධ-මාන-අහංකාර-ලෝභාදි ධර්ම මිශ්‍ර ව ක්‍රියා කරන සිත් තුළින් කෙනකු සනසන සිතක් පහළ කිරීම කළ නො හැකි ය. තමාගේ සිත කෙලෙස්වලින් දැවෙන බැවින් අන්‍යයන්ගේ සිත් ද, රිදවන තාලයේ තත්ත්වයට පත් කිරීම සිරිතයි. මව්පියන්ගේ සිත් රිදවන තාලයේ පැවතුම් දරුවන්ගෙන් මතුවන අතර, දරුවන්ගේ සිත් රිදවන වචන හා ක්‍රියා දෙමාපියන් තුළත් මතුවන්නේ ය. තමාගේ අභිමථාර්ථය ඉටු කර ගැනීමට අනෙකා උපකාරයට ගැනීමේ අදහස් පදනම් කරගෙන මෙම පැවතුම් හා අදහස් මතුවන බව කිය යුතු ය. ගින්නෙන් දැවෙමින් සිටින කෙනකුට කෑ නො ගසා සිටිය නො හැකි ය. දැහලීමක් නැති ව සිටීමට ද නො හැකි ය. කෙලෙස් වේගවලින් අභ්‍යන්තරය නිතර දැවෙමින් පවතින සිතින් යුතු ව යෙදෙන වචන තුළ සෞම්‍ය ස්වරූප නො පවතී.

එසේ ම එම සිතින් යුතුව කෙරෙන ක්‍රියාවල ද සෞම්‍ය තත්ත්වයක් නැත. ඒවා අසන දකින පුද්ගලයන් ද කෙලෙස්වලින් පීඩා ලබමින් සිටින්නන් ම බැවින් එම වචන හා ක්‍රියා විසින් ඔවුන් තුළ සැඟවී ඇති ක්ලේශ වේග මතු කෙරේ. ගිනි බෝල දෙකක් ගැටුණු විට ගිනි රොටුවක් මතුවන්නාක් මෙන් කෙලෙස් ගිනිවලින් යුක්ත පුද්ගලයන් දෙදෙනෙකුගේ මුණ ගැසීම සිත් දවන ස්වරූපයක් මතු කිරීමට හේතු වනු ඇත. හිත මිතුරු, අසල්වැසි, හඳුනන, නාඳුනන කවුරුන් සමග වුව ද, මෙම ස්වරූපය ක්‍රියා කිරීම පුහුදුන් පුද්ගලයන් තුළ පවතින තත්ත්වයයි. මෙයින් පැහැදිලි වන්නේ කෙලෙස් සිතකින් සනසන ස්වරූපයක් මතු කිරීම අපහසු බවත්, කෙනකුගේ සිතක් සැනසිල්ලට පත් කරවනසුලු වචන හෝ ක්‍රියා කිරීමේ හැකියාව පුහුදුන් සිතෙන් මතුකිරීමට බැරි බවත් ය.

සමාජ ඇසුරේ ජීවත් වීමේදී අන්‍යෝන්‍ය සහාය නැතිව අපහසු ය. එකිනෙකා ඔවුන් පිළිබඳ හිතවත් ස්වරූප සාදගත යුතු ය. එසේ නො වේ නම් එම සමාජය, ජීවත් වීමට සුදුසු ස්වරූපයක් මතු නො කරනවා ඇත. කෙනකු සමාජයේ ගරු සැලකිලි ලබන්නේ මිනිසුන්ගේ ප්‍රසාදය දිනාගෙන සිටින බැවිනි. සමාජයේ සැනසිල්ලට හේතු වන අයුරින් යමකු ජීවත් වන්නේ නම් ඔහු පිළිබඳ ප්‍රසාදය එම සමාජය තුළ ඇති වීම අමුත්තක් නො වේ. එහෙත් බොහෝ විට වැඩි දෙනෙක් කෙනකු ගැන පහදින්නේ ඔහුගෙන් ලැබෙන ලෞකික ප්‍රයෝජනවලට අනුව ය. ඒවා අඩු වන විට ඔහු කෙරෙහි පැහැදීම ක්‍රමයෙන් අඩු වීමට පටන් ගනී. එම තත්ත්වයට ගොදුරු වන්නා තුළ සමාජයට ම ශාප කිරීමේ සිත් පහළ වීම ද පුදුමයක් නො වේ. ගුණයෙන් නො දියුණු සමාජයක සිටින පුද්ගලයන්ගේ තත්ත්වය එලෙසින් තේරුම් ගත යුතු ය. නුවණින් යුක්ත පුද්ගලයෙක් කෙනකු පිළිබඳව පහදින්නේ ලැබෙන ලෞකික ලාභ සත්කාර සැලකිළි ආදිය පදනම් කර ගෙන නොව, පුද්ගලයා තුළ පවතින යහපත් ගති පැවතුම් පිළිබඳව තේරුම් ගැනීමෙනි. යහපත් පැවතුම් ඉදිරිපත් කර, සමාජයේ පැහැදීම හෝ හිතවත් කම හෝ මතුකර ගැනීමට තරම් ගුණ දියුණු කළ පුද්ගලයන් පුහුදුන් අය අතුරින් සෙවීම අපහසු ය. වැඩි දෙනකු පැහැදීම හෝ හිතවත් කම ලබා ගන්නේ කුමක් හෝ ලෞකික ලාභයක් ලබා දීමෙනි. යහපත් පැවතුම් ඉදිරිපත්

කර ප්‍රසාදය දිනා ගැනීමට තරම් නිදෙස් භාවයක් පුහුදුන් සිතේ නැතිකම මෙයට හේතුවයි. තමාගේ යහපත් පැවතුම් හේතු කොට ගෙන තමා පිළිබඳව ලෝකයා තුළ පැහැදීම මතුකරවන යහපත් ගති දියුණු කරන අය පුහුදුන් පුද්ගලයන් අතර දුර්ලභ ය. කෙලෙස් වේගවල බලපෑම්වලට යට වීමට සිදු වීම නිසා යහපත් ගති මතු කිරීමට ද අපහසු ය. යම් ප්‍රමාණයකට කෙලෙස් අඩුවී තිබේ නම් එපමණකට යහපත් පැවතුම් මතු කිරීමට පුළුවන. කෙලෙස්වල පවතින ශක්තියට යට වී තිබෙන පුහුදුන් සිතේ තත්ත්වය මේ ආකාරයි. නිතර බැණුම් ඇසීම, අගෞරව විඳීම ආදි පහත් අයිතිවාසිකම්වලට මිනිසා හිමිකාරයා කරමින් ඔහුට පීඩා ලබා දෙන්නේ මෙම කෙලෙස් වේග විසින් බව තේරුම් ගත යුතු ය.

අත්ථ කුසලයට නැඹුරු වී ක්‍රියා කිරීමේ ශක්තිය සිතේ සාදගත් තැනත්තා කෙලෙස් බලයට යට වන්නෙක් නො වේ. බාහිර ලෝකයාගේ පැසසුම් සැලකිලිවලින් ද ඔහුට වැඩක් නැත. සැනසිල්ල පිණිස බැහැරින් අවශ්‍ය උපකාර අපේක්ෂා කිරීමේ තත්ත්වය ද ඔහුගෙන් ඉවත් ව ගොස් ය. ඔහුගේ සිත නිතර සැනසිල්ල මතුකර ගෙන ක්‍රියා කරන හුරුවෙන් යුක්ත ය. ඔහුට අවශ්‍ය සැනසිල්ල ඔහු තුළ ම තිබේ. ඔහුගේ පැවතුම් සියල්ල ලෝකයාගේ සිත් සතන්වල මෝදනය මතු කිරීමට හේතු වන ස්වරූපවලින් යුක්ත ය. කෙලෙස් අමිශ්‍ර ව සිදු වන ක්‍රියා සැනසිල්ලට ම හේතු වන බැවින් ඔහු පිළිබඳ ව ලෝකයා තුළ අප්‍රසාදයක් මතුවීමට ඉඩක් නැත. අත්ථ කුසලය සාදගත් තැනැත්තාට නුවණැත්තන් දෝෂාරෝපණ නො කරන බව මෙහි සඳහන් වී තිබේ නුවණැත්තන් පමණක් මෙහි වෙන්කර දක්වීමට හේතුවක් තිබේ. එනම් නුවණින් හීන පුද්ගලයන් තමාගේ කැමැත්තට පිටින් කෙරෙන යුක්තියට වුව ද, දෙස් පැවරීමට ඉදිරිපත් වන නිසා ය. එය කෙලෙස් නිසා සිදු වන වරදකි. නූගත් කම ද එයට හේතුවක් වනු ඇත. නුවණින් යුක්ත තැනැත්තෝ තීරණය දීමේදී තමාට වෙන පාඩුව හෝ ලාභය පිළිබඳ විමසීම ඉදිරියට නො ගනිති. යුක්තිය පිළිගෙන ක්‍රියාවේ ගෞරවය රැකීමට හැකි වන්නේ නුවණේ ඇති වැදගත්කම නිසා ය. එබැවින් අත්ථ කුසලය සකස් කරගත් තැනැත්තාගෙන් කෙරෙන ක්‍රියා පිළිබඳව නුවණැත්තන්ට කිය හැකි වරදක් නැත. ඔහුගේ ක්‍රියා නුවණැත්තන් විසින් සතුටින් භා

ගෞරවයෙන් පිළිගනු ලබන තත්ත්වයට පෙරළී ඇත. එබැවින් ඔහු නුවණැත්තන්ගේ විශේෂ ගෞරවයට පාත්‍ර වේ.

## සැප ඇත්තෝ එම සැප උසුලා දරා සිටින්නෝ වෙත්වා (සුඛිනෝවා ඛෙමිනො හොන්තු)

පුද්ගලයන් දෙදෙනකුගේ සිත්වල ඇති වන සිතුම් ස්වරූප සමාන නො වේ. ඔවුනොවුන් තුළ පවතින කෙලෙස් වේගවල අසමානත්වය මෙයට හේතුවයි. සැම කෙනකු ම ක්‍රියා කරන්නේ හෝ වචන කියන්නේ සිතෙන් ඉදිරිපත් කරන නිගමනවලට අනුව ය. එක ම නිමිත්ත පිළිබඳ ව විවිධ අදහස් මතුවන්නේ ද එම හේතුව නිසා ය. යමකු තුළ ද්වේෂය නැගී පවතින විට, ඔහු ගන්නා තීරණ රෞද්‍ර ස්වභාවයෙන් යුක්ත ය. එම තීරණ ක්‍රියාවට දැමීමේදී සියල්ලන්ට ම අනර්ථයක් ලබා දෙන ප්‍රතිඵල මතුවිය හැකි ය. ලෝභ චේතනාවෙන් මිශ්‍ර වී සිත පවතින අවස්ථාවක ගන්නා තීරණ ද එම ගතියට නැඹුරු වූ ස්වරූපයෙන් යුක්ත වනු ඇත. ප්‍රතිඵල ද එයට අනුරූපව ම මතුවේ. සිතක ක්‍රියා කාරී ස්වරූප දෙස නුවණ යොදා බලන්නේ නම් ඒ බව පැහැදිලි ව දැකගත හැකි ය. සමාජයක තිබිය යුතු සැනසිල්ල මතු කිරීමට බැරි හේතුව ද පුද්ගලයන් තුළ කෙලෙස් ගති මතු වී ක්‍රියා කිරීම ය. කෙලෙස් වලට යට වී විවිධ අදහස් මතු වන පුද්ගලයන් සිටින සමාජයක් තුළ යහපත් ක්‍රියා කිරීම සඳහා සිත් යොමු කරවා ගැනීම අපහසු ය.

සැමගේ ම යහපතට හා සතුටට හේතු වන යම් කරුණක් ගැන තීරණයක් ගැනීමට බැරිවන්නේ කෙලෙස් සහිත සිත්වලින් මතුවන මතවල ඇති වන විවිධත්වය නිසා ය. එවැනි සමාජයක පොදු යහපත සලසන තීරණයක් පිළිබඳ ව අනුමතිය බලාපොරොත්තු වීමෙන් වැඩක් නැත. අධ්‍යාත්මික ගුණ වගාවෙන් පොහොසත් තත්ත්වයක් මතුවන තුරු පොදු යහපත සලසන මත පිළිබඳව ඔවුන්ගේ ඡන්දය විමසීම අමතක කළ යුත්තකි. මිනිසා අධ්‍යාත්මික ගුණ වගාවෙන් දියුණු වන විට පොදු යහපත පිළිබඳ ව අමුතුවෙන් යමක් යෙදීමට ද ඉතුරු නො වේ. ඒ ඒ පුද්ගලයන් විසින් දියුණු කරගන්නා ලද අධ්‍යාත්මික ගුණ දියුණුව නිසා ඔවුන්ගේ සිත් තුළින් මතුවන අදහස්වල වරදක් තිබිය නො හැකි

ය. එම මත ක්‍රියාවට දැමීමෙන් පොදුවේ කාටත් යහපත ම සැලසේ. අත්ථ කුසලය සකස් වූ සිතකින් මතුවන අදහස පුහුදුන් සිතක මතුවන අදහසට සම්පූර්ණයෙන් ම වෙනස් වූවකි. කෙලෙස් මිශ්‍රණය නවත්වා ඇති එම සිත සැනසුමට හේතුවන සිතිවිලි පහළ කිරීමේ මගට යොමු වූවකි. එම සිතේ නිවී සැනසුණු ස්වරූපයක් පවතී. එබැවින් අන්‍යයන්ව සැනසිල්ලට පත්කරන තීරණ පහසුවෙන් මතුවේ. සියල්ලන් ම සැපයෙන් යුක්ත වූවන් වශයෙන් දැක ගැනීමේ ප්‍රාර්ථනාව මෙම සිතේ නිතර මතුවන ගතියකි. සියල්ලන්ට ම සැප ලැබේවා පමණක් නොව, සැප වලකා ලන හේතු ඉදිරිපත් නො වේවා යන තීරණය, නික්ලේශී සිතේ නිතර පවතින බව මෙහි දක්වා තිබේ. සිතෙන් කෙලෙස් බැහැර වන පමණට මෙම ලක්‍ෂණය ඇතිවන බව තේරුම් ගත යුතු ය. එම ලක්‍ෂණය පහළ නො වේ නම් කෙලෙස් පවතින බව වටහා ගෙන එම ගති මතුවීම සම්පූර්ණ වන තුරු කෙලෙස් ඉවත් කිරීමට උත්සාහ වැඩීම මෙයින් ගතයුතු පාඩමයි.

## සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා (සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා)

කෙලෙස් සහිත සිතක් ඇති පුද්ගලයා තමා ප්‍රිය කරන කොටසට පමණක් ලැබෙන ලාභය පිළිබඳ ව සතුටු වීම ස්වභාවය යි. තමා ප්‍රිය කරන පුද්ගලයන් හැරුණු විට, අන් කිසිවකුගේ යහපත පිළිබඳ ව සිතීමට පුහුදුන් සිතේ ඉඩක් නැත. අත්ථ කුසලය සාදගත් සිතේ තත්ත්වය එසේ නො වේ. ඉතා සියුම් සතාගේ සිට විශාල සතා තෙක් ඇති සත්ව සමූහයා පිළිබඳව පවතින්නේ සමාන පැවතුම් ස්වරූපයකි. සියල්ලෝ ම එක සේ සැපවත් ව වාසය කරන්නෝ වෙත්වා යන පැතුම මෙම සිතට හිමි වී ඇති සිතුම් ස්වරූපය යි. මෛත්‍රියට විරුද්ධව සිත් පහළ කිරීමේ ස්වරූපය කිසි කලෙකත් මෙම සිතේ ඇති නො වන්නේ ය. සැම සත්වයෙකු ම තමාගේ හිත මිතුරන් සැටියෙන් සැලකීමේ උතුම් ගුණය මෙම සිතේ තිබේ. සිතේ පිරිසිදු කම පෙන්වන ලකුණක් වශයෙන් මෙම ගතිය තේරුම් ගත යුතු ය.

* * *

යෙ කෙචි පාණ භූතත්ථි
තසා වා ථාවරා වා අනවසෙසා
දීඝා වා යෙ මහන්තා වා
මජ්ඣිමා රස්සකාණුකථූලා

සත්වයන්ගේ ගති පැවතුම් හා ශරීර ප්‍රමාණවලට අනුව පවතින වෙනස්කම්-ගැන කිසිවක් නො තකා අත්ථ කුසලය සකස් කරවන මෙත් ගතිය ක්‍රියා කරන බව.

# 5 වැනි පරිච්ඡේදය

කෙලෙස් සහිත සිතක හා කෙලෙස් රහිත සිතක ඇති වන සිතුම් ස්වරූපවල වෙනස මෙතෙක් කරන ලද විස්තරවලින් තේරුම් කර දුනිමු. මෙම ගාථාවෙන් සත්වයන් අතර පවතින විවිධත්වය ඉදිරිපත් කරමින් කෙලෙස් සිත එම විවිධත්වය පිළිබඳ ව පිළිපදින ආකාරය හා කෙලෙස්වලින් මිදුණු සිත පිළිපදින ආකාරය වෙන් වශයෙන් තේරුම් කර ගැනීමට උපකාර වන කරුණු ඉදිරිපත් කෙරේ.

## යම්කිසි ජීවය සහිත සකස් වූ වස්තුවක් වේ නම් (යෙ කෙචි පාණ භූතත්ථි)

පඨවි-ආපො-තේජො-වායො යනුවෙන් සලකන මහා භූත කොටස් සතරේ උපකාරයෙන් ලෝකය සැදී ඇති බව බුද්ධ දේශනාවෙහි පෙන්වා තිබේ. එම මහා භූත උපකාර කරගෙන ලෝකයට අයත් සියළු වස්තු සකස් කිරීමේ තත්ත්වය උදකර තිබෙන බව හා ඒවා ගොනු වෙන ආකාරය ද පෙන්වා ඇත. විඤ්ඤාණ ශක්තිය ක්‍රියා කරන වස්තූන් තුළ ද ඇත්තේ මෙම ධාතු සතර ය. යමක් සකස් කිරීම සංඛාර නමින් හඳුන්වමු. සකස් වී අවසන් වූ විට භූත නමින් වෙන් වෙනු ඇත. සැදෙන අවස්ථාව, සැදුණු අවස්ථාව යන අවස්ථා දෙක සංඛාර-භූත යන

නම් දෙකින් වෙන් වන්නේ ය. **"සබ්බේ සංඛාරා අනිච්චා"** යනුවෙන් පෙන්වා ඇත්තේ ද සියළු සකස්වීම් සදාකාලිකව පවතින ආකාරයෙන් සකස් නො වන බව යි. එසේ සකස් වෙමින් හා වෙනස් වෙමින් සිදු වේගෙන යන සිද්ධිය තුළින් උලුප්පා පෙන්වන ස්වරූප භූත යනුවෙන් තේරුම් ගත යුතු ය.

## සෙලවෙමින් ජීවත් වන සත්ව කොටස (තසා වා)

තසා යනුවෙන් හැඳින්වෙන්නේ මතු විස්තර වන දීර්ඝ-මහත් ආදී විවිධ සත්ව කොටස් ය.

## නො සෙල්වී ජීවත් වන සත්ව කොටස (ථාවරා වා)

ලෝකයේ සිටින ජීවීන් අතර අප දන්නා කොටස්වලට වැඩියෙන් නො දන්නා කොටස් සිටින බව පිළිගත යුතු ය. සත්ව විද්‍යාවෙන් එළිදරව් කරන විස්තරවලට අනුව ජීවත් ව සිටි සත්ව කොටස් අතුරින් සමහර කොටස් ලෝකයෙන් අතුරුදහන් වී සිටින බව පිළිගෙන තිබේ. එසේ ම, අළුත් ස්වරූපවලින් යුත් සත්වයින් හමුවන බව ද එය කියයි. සත්ව විෂය අචින්ත්‍ය බව බුදු පියාණන් වහන්සේ ද වදරා තිබේ. ඩාවින් මහතාගේ දර්ශනයට අනුව සත්වයා පරිනාම න්‍යායට යටත් ව විවිධ ස්වරූපවලට පත්වන බව සඳහන් වී ඇත. එහෙත් බුදු වදනින් පැහැදිලි කෙරෙන සත්වයා පිළිබඳ විස්තරයට අනුව පරිනාමය නමැති කෘත්‍ය ස්වරූපය භෞතික වශයෙන් සිදු වන්නක් නොව මානසික වශයෙන් සිදු වන්නකි. එම ක්‍රියාවේ මූල ධර්ම ස්වරූපය සත්ව පරම්පරාවක මූල වශයෙන් පිළිගැනීම නිදෙස් යයි සිතමු. එබැවින් ජීව ශක්තියකින් යුක්ත වී දැනීමේ ශක්තියක් ඇතිව, සෙලවීමේ හැකියාව සකස් වී නැති සත්ව කොටස් සිටින බව "ථාවරා" නමින් කොටසක් පිළිබඳ සඳහන් කිරීමෙන් පැහැදිලි වන අතර එය සත්ව පරපුරක එක් අවස්ථාවක් සැටියෙන් පිළිගත හැකි ය. එම සත්වයන් එක ම ස්ථානයක් ඇසුරු කරමින් නො සෙල්වී ජීවත් වන සත්ව කොටසකි.

දැනට සොයාගෙන තිබෙන කරුණුවලට අනුව මුහුදු ගල්පරවල එවැනි ජීවීන් සිටින බව කියවේ. එම සත්වයන් ඇතැම් බෙහෙත් වර්ග සෑදීම සඳහා ද අවශ්‍ය විය හැකි ය. යම් හෙයකින්

එම ගණයට අයත් සත්වයන්ගේ සිරුරු තුළ මනුෂ්‍ය ජීව ධාතුව ශක්තිමත් කරන රසායනික බලයක් තිබෙන බවක් වෛද්‍ය මත තුළින් හෙළිදරව් වුව හොත්, පුහුදුන් පුද්ගලයන් එම සතුන් කෙරෙහි කිසිදු අනුකම්පාවක් නො දක්වා ප්‍රයෝජනයට නො ගනිතැයි සිතීම අපහසු ය. බාහිර සියලු දේ උපකාරයට ගෙන තමාගේ සැනසිල්ල හද ගැනීමට සිතන මිනිසා, සෙලවෙන්නට බැරි අසරණ මට්ටමේ සිටි අහිංසකයාගෙන් වුව ද එම ප්‍රයෝජනය ගැනීමට ඉදිරිපත් වනු නිසැක ය. එහෙත් අත්ථ කුසලය සකස් වී ඇති සිතකින් එවැනි ක්‍රියාවක් සිදු නො වේ. තමාගේ සැනසිල්ලට අවශ්‍ය හේතු අරමුණු කරගෙන බාහිර කිසිවක උපකාරයක්, සැනසිල්ල මතු කිරීම සඳහා ප්‍රයෝජනයට නො ගනී. එබැවින් එම අසරණයන්ට ද මොහුගෙන් ලැබෙන්නේ සැනසිලිදායක අයිතියකි.

## ඉතුරු නැති ව (අනවසෙසා)

මේ තසා-ථාවරා යන කොටස් දෙකට සියළු සත්වයන් ගොනු කිරීමට උපකාර වශයෙන් යොද තිබෙන පද දෙකකි. මෙම දෙකොටසට අයත් නො වන සත්වයන් නැත. එසේ සියළු සත්වයන් කොටස් දෙකකින් පෙන්වා අනතුරු ව වෙන් වෙන් වශයෙන් ගෙන කරුණු ඉදිරිපත් කරමු.

## දීර්ඝ වූ සත්ව කොටස් (දීඝා වා)

නයි-පොළොං-පිඹුරු-ගැරඬි-කරවල්ලු ආදි කොටස් දීර්ඝ සත්වයෝ ය. මෙම සත්ව කොටස් හමු වීමේදී සිතේ ඇති වන ස්වරූප පැහැදිලි කිරීම මෙම ඡේදයෙන් බලාපොරොත්තු වෙමු. හැඩ-රුව-පාට-දිග-මහත-සිහින්-තර ආදී විවිධ ස්වරූප පිළිබඳව සිත ක්‍රියා කරන්නේ විවිධ ආකාරවලිනි. සිත ක්‍රියා කිරීමේදී එහි ඇති වන වෙනස, නිමිත්තේ ප්‍රමාණයට හා එහි තමාට ඇති වටින නො වටින තත්ත්වයේ ප්‍රමාණයට අනුව සිදු වන්නේ ය. සිතට නුහුරු යමක් හමු වූ විට තිගැස්සීමට පත් වීම කෙලෙස් සහිත සිතේ ගතියයි. හුරු නැති කිසිවක් සමග සිත සන්සුන්ව තැබීම අපහසු ය. හුරු වීම යනු පරිහරණයේ පහසුවට පත්වීම ය. එක් ස්වරූපයක සිත තැබිය නො හැක්කේ කෙලෙස්වල බලපෑම නිසා ය. කෙලෙස් බලය ඉදිරිපත් වී අරමුණෙන් අරමුණට සිත පත් කිරීම සිදු කරයි. මෙහිදී අරමුණේ හා නිමිත්තේ වෙනස

කුමක් ද යන්න තේරුම් ගැනීම ප්‍රයෝජනවත් ය. අරමුණ යනු සිත පවත්නා වූ කුසල් හෝ අකුසල් යන දෙක අතරෙන් එකකි. එම දෙකෙන් සකස් වන ස්වරූප අනන්ත ය. එම දෙක කුසල් හා අකුසල් යනුවෙන් බෙදෙන්නේ ඒවායින් මතුකරන වේදනා භේදයන්ට අනුව ය. කුසලාරම්මණයේ සිත පවතින අවස්ථාවේදී එය සැප ස්වරූපය සිතේ ඇති කරයි. අකුසලාරම්මණයේ සිත පවතින අවස්ථාවේදී සිතේ ඇතිවන්නේ දුක් ස්වරූපයකි.

නිමිත්ත යනුවෙන් හැඳින්වෙන්නේ සිත පහළ වීම සඳහා ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වයට උපකාර වන වස්තුවයි. සිත එක් නිමිත්තක් ඇසුරු කරන අවස්ථාවේදී විවිධ ස්වරූපයේ අරමුණු සිතේ ඇතිවිය හැකි ය. කෙනකු යම් නිමිත්තක් ඇසුරු කරන්නේ සැපයක් භුක්ති විඳීමේ අරමුණ ඇතිව ය. එහෙත් පුහුදුන් කමේ වරදින් සිත පත්වන්නේ පීඩා දෙන අකුසල් අරමුණට ය. මෙම තත්ත්වය උදවන්නේ කෙලෙස්වල (ලෝභ-දෝස) බලපෑමේ හේතුවෙනි. සිතේ කෙලෙස් මතුවන තාක් සැප දෙන කුසල් ස්වරූපයට පත් නො වන්නේ ය. සිත යනු ජීවිතයේ පැවැත්ම සඳහා උපකාර වෙමින් ක්‍රියා කරන තේජස් ධාරාවක පැවැත්මකි. අකුසල් නමින් හඳුන්වන්නේ එම තේජස වැඩි වීමේ තත්ත්වයට පත් වීම ය. එය පීඩාවට හේතු ය. කුසල් යනු එම තේජස අඩු කරගත් අවස්ථාවේ සිතේ මතුවන ස්වරූපයයි. තේජස අඩු වූ පමණට සැනසිල්ල මතු කරයි. කෙලෙස් යනුවෙන් සලකන්නේ සිතේ තේජස් වේගය වැඩි වීම සඳහා උපකාර වන ගති සමූහයයි. සිත පීඩාකර තත්ත්වයෙන් මුදවා, සැනසිල්ලේ තබා ගැනීමේ ක්‍රම නො දන්නා පුහුදුන් පුද්ගලයා සැප ලැබීම අරමුණු කරගෙන, සිත දුක් අරමුණේ පවත්වන ගති ක්‍රියාවට දමා පීඩා විඳින තත්ත්වය උදකර ගනී. සැපය අපේක්ෂා කරන්නා විසින් පරිහරණය නො කළ යුතු ධර්ම කොටස් කෙලෙස් නමින් බුදුපියාණන් වහන්සේ පෙන්වා තිබේ. නො දන්නා කම හා නුපුරුදු කම නිසා කෙලෙස් මතුකර නො ගෙන, නිමිත්තක් ඇසුරු කිරීමට බැරි තත්ත්වයක මිනිසා සිටී. ලැබෙන නිමිත්තෙන් අපේක්ෂිත සැප නො ලැබීමේ හේතුවෙන් සිත ද්වේෂ තත්ත්වයට පත් වී පීඩා දියුණු කර ගන්නා අවස්ථා එමට ය.

සර්පයන් දුටු විට ඇති වන තැති ගැනීම ද එයට අදල

ක්‍රියාවකි. සතා දුටු විට උගෙන් විය හැකි අනතුරු පිළිබඳව මතකයට ඒම නිසා බිය මතුවේ. එවැනි සතුන් තුළ පවතින රෞද්‍ර ගති සම්බන්ධව තමා දන්නා බැවින් මෙම තත්ත්වය උද වේ. එවැනි හැඳිනීමක් නැති කුඩා දරුවන් එවුන් අල්ලා ගෙන ක්‍රීඩා කිරීමට වුව ද ඉදිරිපත් වෙනවා ඇත. භය වීමට තරම් සර්පයා ගැන දැනීමක් කුඩා දරුවා තුළ නැති බැවිනි, ඔහු එසේ කරන්නේ. එක් වර්ගයකට අයත් සර්පයකු දුටු විට ඇති වන භය ස්වරූපය වෙනත් වර්ගයක සර්පයකු දුටු විට වෙනස් වේ. ගැරඩියකු දුටු විට ඇති වන්නේ අප්‍රසන්න ස්වරූපයකි. නයකු දැකීමෙන් සිතේ ඇති කරන්නේ තැති ගන්වන තත්ත්වයකි. එවැනි වෙනස් ස්වරූප සිතේ ඇති කරන කුමන තාලයේ සතකුගේ දැකීම වුව ද, පීඩාවක් මතුකරන හැඩයෙන් යුක්ත බව කිය යුතු ය. එහෙත් සතා දුටු පමණින් තැති ගැනීමේ තත්ත්වය උදා කළේ එම සතා නොව තමන් තුළ තිබෙන ද්වේෂ ගතිය මතුවීමේ හේතුවෙන් බව තේරුම් ගත යුතු ය. යමකු ලෝභ-දෝස යන ගතිවලින් තුරන් වූ මෛත්‍රී සිත සාදගෙන නිමිත්ත සමග සිත ක්‍රියා කිරීමේ හැකියාව හුරු කරගෙන තිබේ නම්, කුමන තාලයේ නිමිත්තක් සමග වුව ද සැනසිල්ල මතු කරන කුසලාරම්මණයේ සිත පැවැත්වීමට සමත් වනු ඇත. අත්ථ කුසලය සිතේ සාද ගැනීමේ අගය එයයි. මෙහි කෙලෙස් මතු කිරීමේ තත්ත්වය නැති බැවින් සැනසිල්ල මතුකරන කුසලාරම්මණයේ සිත පැවැත්වීමට හැකියාව ලැබේ.

## ශරීර ප්‍රමාණයෙන් මහත් ව වැඩුණු සත්වයෝ (මහන්තා වා)

ශරීර ප්‍රමාණයෙන් මහත් වූ සත්ව කොටස් විවිධ ප්‍රමාණ වලින් යුක්තව සිටිති. ඔවුන්ගේ ප්‍රමාණ පමණක් නොව හැඩ-රුව-වර්ණ ආදිය අනුව ද සිතේ තත්ත්වය වෙනස් විය හැකි ය. ඇතා විශාලත්වයෙන් වැඩි වුව ද, ගෝරිල්ලා පමණ භයජනක සතෙක් යයි කිව නො හැකි ය. ගෝරිල්ලා පිළිබඳ අපේ හැඳිනීමේ තිබෙන භයජනක ස්වරූපය ඇතා පිළිබඳ ව නැති බැවින් ඇතාට වඩා ගෝරිල්ලා පිළිබඳ ව සිතේ ඇති වන තැති ගැනීම වැඩි යයි කිව යුතු ය. සීබ්‍රා නමැති වයිරන්වලින් හැඩ ගැන්වී සිටින සතා පිළිබඳ භයක් ඇති වන්නේ නමුදු එම භය ඇතකු පිළිබඳව ඇතිවන භයට වඩා අඩු යයි කිව යුතු ය. එසේ ම එම සතා දෙස

බලා සිටීමේ කැමැත්ත ද සිතේ ඇති වන්නේ ය. ගවයා ද එම සත්ව ගණයට ඇතුලත් වන අතර මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා සතුන් අතුරින් ප්‍රධාන තැන ගවයාට හිමි වී තිබේ.

එහෙත් මිනිස් සිතේ පවතින කෙලෙස්වල හේතුවෙන් ගවයාට හිමි වී ඇති ඉරණම සංවේගජනක ය. ඒ බව දවසකට සිදු වන ගව ඝාතනයේ ප්‍රමාණය ගැන සිතන විට වැටහෙනු ඇත. ලංකාවේ ශිෂ්ටත්වය දියුණු වී පවතින යුගවල ගවමස් බුදින්නා සැඩොලකු ලෙස සලකා තිබේ. ගවමස් අනුභව කිරීමේ හේතු ගණනාවකි. එයින් ප්‍රධාන හේතුව මස් ව්‍යංජනයේ රසය පිළිබඳ ගිජුකම ය. කෙලෙස් බර ව පවතින සිතේ ඇති මෛත්‍රී විරහිත භාවයේ ප්‍රමාණය මෙයින් තේරුම් ගත හැකි ය. ව්‍යංජනය රසවත් කර ගැනීම සඳහා අසරණ සත්වයකුගේ ජීවිතයක් නැසීම සුදුසු කරුණක් නො වන බව තේරුම් ගැනීමට බැරි තරමේ තත්ත්වයක් මිනිස් සිතේ තිබේ නම් තිරිසන් කම සමග එම සිත සැසඳෙන ප්‍රමාණය තේරුම් ගැනීම අපහසු නැත. සත්ව මාංශ කෑම වරදක් නො වේය යනු ඇතැමුන්ගේ මතයකි. ඇතැමුන් වරද තෝරන්නේ ක්‍රියාවෙන් සිදු වන පවේ පමණට ය. අපායට යන බියෙන් වැරදි නො කර සිටින පුද්ගලයන්ට අපායක් නැති අවදියක් අසුවුව හොත්, කෙසේ හැසිරේදැයි සිතීම පවා අපහසු ය. අපායට බියෙන් පව් නො කරන්නාත්, දෙව්ලොව සැප ලබා ගැනීමේ චේතනාවෙන් පින් කරන්නාත්, යහපත් ක්‍රියාවක තිබිය යුතු පදනමේ නො පිහිටි පුද්ගලයන් බව කිව හැකි ය.

මිනිසා වැරදි අත්හළ යුත්තේ අපායට භයෙන් නොව තමාගෙන් අන්‍යයන්ට සිදු විය හැකි අනර්ථය සලකා ගෙන ය. මිනිසා හොඳ ක්‍රියාවල යෙදිය යුත්තේ දෙව්ලොව සැපයට ගිජුකමෙන් නොව අන්‍යයන්ට එයින් ලැබෙන සැනසිල්ලේ වටිනාකම සලකා ගෙන ය. එම සත්පුරුෂ අදහස් මත සිත පවත්වා ගැනීමට නො දත්කමේ හේතුවෙන් වැරදි කරමින් අපායෙන් බේරීමේ තර්ක ඉදිරිපත් කර නිදෙස් පුද්ගලයන් වශයෙන් සමාජයේ පෙනී සිටීම ඇතැමුන්ගේ උත්සාහයයි. මෙසේ උපක්‍රම යොදා රස තෘෂ්ණාවේ බැඳී සිටීම සැනසිල්ල ලබා ගැනීමේ මාර්ගයෙන් ඈත් ව සිටින ප්‍රමාණය පෙන්වයි. සත්ව ඝාතනයේ හවුල් කරුවන් බවට පත්වීමේ අයිතිය මස් මාළු බුදින්නාට අයත් වන බව තේරුම් ගැනීමට

තරම් නුවණ මතු නො වන මිනිස් සිතේ ඇත්තේ මිනිස්කමේ බොළඳ ස්වරූපයක් යයි කීම නිවැරදි යයි සිතමු. එම අසරණ සතුන්ගේ දුක්බර ජීවිත පිළිබඳ කරුණු සිතා මෛත්‍රී සහගත ව යමෙක් මස් මාළු කෑමෙන් පමණක් වුව ද මිදෙන්නේ නම් ඔහු ශිෂ්ට සමාජයක ජීවත් විය යුතු කෙනකු බවට ඡන්දය ලබන්නෙකි.

මෛත්‍රී ස්වරූපයෙන් සකස් වන අත්ථ කුසලය සෑදුණු සිතක සතාගේ ප්‍රමාණය පිළිබඳ ව වෙනසක් ඇති නො වන්නේ ය. තමාගේ සිතේ මෛත්‍රියෙන් සෑදුණු සැප ස්වරූපය නිසා කුමන තාරාතිරමේ වුව ද සතකු දක අමුතුවෙන් සතුටු වීමට වත්, බිය වීමට වත් හේතුවක් නැත. තමාට අනර්ථයක් කිරීමට එන විට වුවත් යෙදිය හැකි උපක්‍රම යොද තම ජීවිතය බේරාගැනීමට උත්සාහවත් වන්නේ වුව ද, මෛත්‍රී ස්වරූපයෙන් සිත ගිලිහී නො යනවා ඇත. සතා තුළ පවතින රෞද්‍ර ස්වරූපය මැඩීමට ප්‍රමාණවත් මෛත්‍රී ගතිය තම සිතේ දියුණු වී තිබේ නම් සතාගේ රෞද්‍ර අදහස් ද වෙනස් වනු ඇත. අත්ථ කුසලයේ තත්ත්වය එලෙසින් සිතාගත යුතු ය.

## මධ්‍යස්ථ ප්‍රමාණයේ සත්වයෝ (මජ්ඣිමා)

එළුවන්, බැටළුවන් ආදි ප්‍රමාණයේ සතුන් මධ්‍යස්ථ ප්‍රමාණයේ සතුන් වශයෙන් සැලකිය හැකි ය. සතා මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යොදගත යුතු වස්තුවක් සැටියෙන් පිළිගැනීම, ඇතැමුන්ගේ මතයයි. කුමක් හෝ ප්‍රයෝජනයට ගැනීම වරදක් නො වේ. එහෙත් එම වස්තුවට හානියක් හෝ පීඩනයක් නො වන ලෙසින් ප්‍රයෝජනයට යොද ගැනීමේ සත්පුරුෂ ගතිය මිනිස් සිත සමග මිශ්‍ර ව තිබිය යුතු ය. හෙවන දුන් ගසේ අතු කැඩීම අසත්පුරුෂ ලක්‍ෂණයක් සැටියෙන් සම්මත වූවකි. අවිඤ්ඤාණක වස්තුවක් පිළිබඳ ව සත්පුරුෂයා පිළිපැදිය යුත්තේ එලෙසින් වේ නම්, සවිඤ්ඤාණක සතුන් පිළිබඳ ව පිළිපැදිය යුතු පිළිවෙල අමුතුවෙන් ඉගැන්විය යුත්තක් නො වේ. එහෙත් ගසකට හෝ ගලකට පමණකුදු නො කළ යුත්තක් සතකුට කිරීමට තරම් මිනිසා සත්පුරුෂ කමෙන් ඈත් වී සිටින ප්‍රමාණය එළු-බැටළු ආදි සතුන්ගෙන් ගතහැකි සියළු ප්‍රයෝජන ලබා අවසානයේදී ඔවුන්ගේ ජීවිත නසා මස් අනුභව කිරීමේ ක්‍රියාවලින් තේරුම් ගත හැකි ය.

සත්වයන් වනගත ජීවිතයෙන් ඉවත් කර, මිනිස් ඇසුරට ගෙන ප්‍රයෝජන ගැනීම කෙරෙහි කාගේත් අනුමැතිය ලැබී තිබේ. එහෙත් යුක්ති ධර්මයට අනුව එම සතාගේ ජීවිතය නිදහසේ හා සැනසිල්ලේ පරිහරණය කිරීමට ඉඩ තිබිය යුතු ය. එම නිදහස පුහුදුන් මිනිසාගෙන් එම සතාට ලැබේයයි සිතිය නො හැකි ය. එය අපරාධයක් වශයෙන් පිළිගෙන නැත. වනගත ව සිටි අවස්ථාවේ තිබූ සියළු අයිතිවාසිකම් හැරදමා මිනිසා තමාගේ මිතුරා වශයෙන් පිළිගෙන සිටින අසරණ සතාගෙන් ගත හැකි සියළු ප්‍රයෝජන ලබා අවසානයේදී මරා මස් අනුභව කිරීමට තරම් මිනිසා සැහැසි වීම නම් බලවත් අපරාධයක් බව කිවයුතු ය. සතකු මරණයට පත්වන අවස්ථාවේ, සිරුරේ කලින් පැවති සියළු ස්වරූප වෙනස් වන්නේ ය. කෙටියෙන් කියන්නේ නම් සියල්ල විකෘති වන්නේ ය. විෂවන්නේ ය. එම මස් කෑම හේතු කොට ගෙන තමාට වන හානිය වත් සලකා වරදින් මිදීමට තරම් නුවණක් නැති වූයේ කෙලෙස් වේගවලට යට වී ඒවායින් ලැබෙන තීරණ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින වහල් භාවය නිසාම ය. කෙලෙස්වලින් මිදීමේදී මතුවන අත්ථ කුසලය සකස් වූ විට සිතුම් පිරිසිදු ය. කියුම් පිරිසිදු ය. එබැවින් ඔහුගේ ජීවිතය සත්ව හිංසාවෙන් තොර ය.

## කුඩා ප්‍රමාණයේ සත්වයෝ (රස්සකා)

කුඩා සතුන් සැටියෙන් කුරුමිණි-මැසි-මදුරු ආදි සත්ව කොටස් ගත හැකි ය. මෙම කොටස් පිළිබඳ ව කෙලෙස් සිත ක්‍රියා කරන්නේ ඉතාමත් දරුණු ලෙසිනි. තමාගේ ලාභය රැක ගැනීම සඳහා මෙකී සතුන් වනසන්නේ සමූහ වශයෙනි. වඳ විය යුතු සතුන් මෙන් සලකා කරන එම ඝාතනය ගැන නිදහසට කරුණු එමට ඉදිරිපත් කළ හැකිව ඇත. එහෙත් කාරණයේ තිබෙන බිහිසුණු කම පිළිබඳව සිතා ගැනීමට තරම් නුවණක් නැතිකම නිසා. එම ක්‍රියා නො සන්සුන් තත්ත්වයට සිත පත් කරන ධර්ම එක්වීමට හේතු වන බව තේරුම් ගැනීමට තරම් මිනිස්කම දියුණු වී නැති බව මෙයින් පෙනේ. අසරණ තත්ත්වයේ සිටින එම සතුන් මිනිසාට පාඩු කරන අදහසින් ක්‍රියා කරනවා නො වේ. සාගින්න මකා ගැනීමට හේතු වන යමක් දුටු විට එය ප්‍රයෝජනයට ගැනීම සතාගේ සිරිත ය. එහෙත් මිනිසා ඔවුන් නැතිකර දමන්නේ තමන්ට පාඩු කරන අදහසින් කළ ක්‍රියාවක්

ලෙසින් සලකා ගෙන බව සතුන් නැසීම සඳහා කරන බිහිසුණු ක්‍රියාවලින් සිතාගත හැකි ය. කෙලෙස් මිශ්‍ර සිත්වලින් යුක්ත වී නිපදවන අළුත් ජාතියේ යන්ත්‍ර පවා සකස් වන්නේ හිංසාවට උපකාර වන අයුරින් බව නවීන නිපදවීම් දෙස විමසිල්ලෙන් බලන විට තේරුම් ගත හැකි ය. කෙලෙස් යටපත් වූ මිනිස් සිත්වලින් මෙම නිපදවීම සිදු වන්නේ නම් සියල්ලන් සනසන, සැමගේ ම බිය දුරුකළ හැකි යන්ත්‍ර නිපදවනවා ඇතැයි සිතිය හැකි ය. මිනිස්කම හොඳ නො හොඳ දෙකින් සංකීර්ණ වූවකි. බුදුපියාණන් වහන්සේ ඉදිරිපත් වූයේ මිනිස්කම සමග සමීප වී ඇති නො හොඳ කොටස ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රම මිනිස් සිතට හුරු කරවීමට ය. එම ක්‍රමවලට අනුව මිනිසා ජීවත් වන්නේ නම් ඔහුගේ ජීවත් වීමෙන් කිසිදු හානියක් කිසිවකුට සිදු නො වේ. එය අත්ථ කුසලය ඔහුගේ සිතේ සකස් වීමේ ලක්‍ෂණයකි.

## ඇසට නොපෙනෙන ප්‍රමාණයේ සත්වයෝ (අණුක)

ඇසට පෙනෙන සතුන්ට වඩා නො පෙනෙන සතුන් වර්ග බොහෝ යයි කිව යුතු ය. ඇසට නො පෙනෙන සතා පිළිබඳ අමෛත්‍රී සිතක් පහළ කිරීමට හේතුවක් නැතැයි සිතිය හැකි ය. එහෙත් සිදු වන්නේ ඊට විරුද්ධ පැත්ත ය. නොයෙක් කොටස්වල රෝග සෑදීමට හේතු වන-උපකාර වන එම වර්ගවල සත්තු සිටිති. එම රෝගයක් යමෙකුට සෑදුණු විට අමනාපය ඇතිවන්නේ රෝගය පිළිබඳව නො ව ඊට හේතු වූ සත්ව කොටස් පිළිබඳව ය. රෝගයෙන් පෙළීමට සිදු වීම එක් වේදනාවක් වන අතර, රෝගයට හේතු වූ සතා පිළිබඳ ව ගත් ද්වේෂය තවත් අතකින් ඔහුව පෙළනවා ඇත. සිතේ කෙලෙස් නැති පුද්ගලයාගේ සිත එවැනි පෙළීමකට පත් නො වන්නේ ය එම පීඩාව ඔහුට නැත. සිතේ ඇති වන මෙත් ගතිය නිසා ගත සිත දෙක ම නිවී යාමේ හේතුවෙන් කෙලෙස් සහිත පුද්ගලයා මෙන් ඔහුට රෝගයක පීඩා විඳීමේ තත්ත්වය ඇති නො වේ. මෙය අත්ථ කුසලයෙන් ලැබෙන එක් උපකාරයකි. ඒ සිත නිවාගෙන කය සනසවන තත්ත්වයට පත් කරගත් තැනැත්තාගේ සියළු කොටස් නිවීගිය තත්ත්වයක පවතින බැවින් රෝගවලින් පීඩා විඳීමට එක්වෙන හේතූන් ද අඩු වන්නේ ය. අත්ථ කුසලය සකස් වූ සිතේ මෙම ලකුණු විද්‍යමාන ය.

## වටකුරු හැඩයේ සත්වයෝ (ප්‍රූලා)

මෙම හැඩයෙන් යුත් සත්ව කොටස් බොහෝ ය. ඒ හැම සත්වයකු පිළිබඳව ම පුහුදුන් මිනිස් සිත ක්‍රියා කරන්නේ කෙලෙස් මතු කරගෙන ය. කැස්බෑවා වටකුරු සත්ව කොටසට අයත් සතෙකි. ඔහුගේ ජීවිතයට මිනිසා සතුරෙක් වී ඇත. එම සතාගේ මස රසවත් ආහාරයක් ලෙස සකස් කර ගැනීම සඳහා යොදන උපක්‍රම ඉතා ම සාහසික ය. එසේ ම කකුළුවන් ආහාරයට සකස් කර ගන්නා ක්‍රමය ද ඊට නො දෙවෙනි ය. කකුළුවන් තම්බන්නේ පණපිටින් හැළියට දැමීමෙනි. එම ගණයට අයත් සතකු වූ ඉබ්බා මිනිසාගෙන් වැඩි හිංසාවක් ලැබූ සතෙක් නො වේ. එහෙත් ක්‍රමයෙන් අමනුෂ්‍ය ගති මිනිස් සිතේ දියුණු වන ප්‍රමාණයේ වැඩිකම නිසා ඒ සතාට ද වදහිංසා කර ජීවිත හානි කර මස් අනුභව කිරීමේ තත්ත්වයට වැටී ඇත. හොඳ හෝ නරක හෝ ක්‍රියාවට පත් වන්නේ සිතේ බලපාන ධර්ම ස්වරූපවලට අනුව බව කලින් ද කීවෙමු. මේ ආකාර සත්ව හිංසාවන්ගෙන් යුක්ත ව මිනිසා ක්‍රියා කිරීමේ හේතුවෙන් මිනිසා සියළු සතුන්ගේ සතුරකු බවට පත් වී තිබීම සංවේගදයක ය. කෙලෙස් වේගවල පවතින පහත් ස්වරූපය මේ ආදි කරුණුවලින් තේරුම් ගත හැකි ය. සිත කෙලෙස්වලින් මිදුණු පමණට එම සිතෙන් සියල්ලන් සනසන හා තමන් සැනසීමට පත් කරන පැවතුම් උද කරන බැවින් කවුරුන් වුව ද ජීවිත සැනසිල්ල ලැබිය යුත්තේ ජීවිතය අපිරිසිදු වීමෙන් මුදවා ගැනීම මගින් බව අමතක නො කළ යුත්තකි. අත්ථ කුසලයෙන් හඳුන්වන්නේ එම තත්ත්වය යි.

* * *

**දිට්ඨා වා යේ ච අද්දිට්ඨා**
**යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ**
**භූතා වා සම්භවේසී වා**
**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා**

ඇසට හමු වන සත්වයෝ ද, ඇසට හමු නො වන සත්වයෝ ද, දුර සිටින සත්වයෝ ද, ළඟ සිටින සත්වයෝ ද, සෑදී අවසන් වූ තත්ත්වයේ සිටින සත්වයෝ ද, සෑදෙමින් සිටින සත්වයෝ ද, යන සියල්ලෝ ම සැපවත් වෙත්වා යනු ගාථා වේ අදහස ය.

# 6 වැනි පරිච්ඡේදය

## ඇසට හමු වන සත්වයෝ (දිට්ඨා)

ඇස හමුවේ සිටින සත්වයන් පිළිබඳ ව ඇති වන හැඟීම් නො පෙනෙන සත්වයන් පිළිබඳ ව ඇති වන්නේ නැත. පෙනෙන සත්වයා පිළිබඳ ව ආසාව හෝ අමනාපය ඇති වීම පහසුවෙන් සිදු වන්නකි. සතාගේ පැවතුම්වලට අනුව හා හැඩරුවට අනුව එය වෙනස් වේ. තමාගේ ඇසුරේ සිටින පුද්ගලයා පිළිබඳ ව ඇති වන හැඟීම් අතර, ඔහු තමාට උපකාර වන්නකු විය යුතු ය, යන තීරණය සැඟවී තිබෙන අපේක්ෂාවකි. ඔහු තමාගේ දුකට පිහිට විය යුතු ය යන හැඟීම මිනිස් සිතේ මතුවන සිත් ස්වරූපවලින් ප්‍රධාන යයි කිව යුතු ය. තමාට මෙන් අනෙකාට ද තමාගෙන් උපකාර අවශ්‍ය බව සිතීමට තරම් සිත දියුණු නැතිකම මෙම අසාධාරණ සිතුවිලි පහළ වීමට හේතුව වශයෙන් සැලකිය හැකි ය. එකී බලපොරොත්තු ඉටු නො වන සෑම අවස්ථාවක ම ඇතිකර ගන්නේ ද්වේෂ ස්වරූපයකි. මෙම හේතුවෙන් තමා ඉදිරියේ තිබෙන නිමිත්ත සමග සිත සැනසිල්ලට හේතුවන අයුරින් ක්‍රියා නො කරයි. සැනසිල්ල ලැබෙන අයුරින් සිත යොදන ක්‍රමය නො දන්නාකමේ පාඩුව මෙයට හේතුවයි. කෙලෙස් සහිත පුද්ගලයාගේ සිත නිතර අවදි වන්නේ කෙලෙස් මිශ්‍රණයෙන් යුක්තව ය. එම කෙලෙස් නිසා, නිමිත්ත සමග ක්‍රියා කරන සිත

සැනසිල්ලට හේතු වන අයුරින් පැවැත්වීමට නො හැකි ය. අත්ථ කුසලය සකස් කිරීමට උපකාර වන මගට සිත යෙදූ විට කෙලෙස්වලින් ඉවත් ව ක්‍රියා කරන බැවින් සැනසිල්ල මතුවන අයුරින් සිත නිමිත්තේ යෙදීමට හැකි වනු ඇත. එසේ නැති සෑම සිතක් ම නිමිත්ත උපකාර කරගෙන රිදුමක් හදගැනීම නැවැත්විය නො හැකි ය.

පුහුදුන් ජීවිත ක්‍රියා කරන අයුරු බලන විට මෙම කරුණ වඩාත් පැහැදිලි වනු ඇත. පවුලක සාමාජිකයන් අතර නිතර මෙම හේතුව මුල් වී පීඩා මතුකර ගන්නා තත්ත්වයක් තිබේ. තමා ඇසුරට එන දරුවාගේ හෝ භාර්‍යාවගේ හෝ ස්වාමි පුරුෂයාගේ හෝ පැවතුම් තමා ප්‍රිය කරන ස්වරූපයෙන් සිදුවේ ය යන අපේක්ෂාවෙන් සිත යොමු වන්නේ ය. කෙනකු තුළ තිබෙන අපේක්ෂා ස්වරූපය තේරුම් ගැනීමට වෙනත් කෙනකුට හැකියාවක් නැත. එබැවින් ඒ ඒ පුද්ගලයන් හැසිරෙන්නේ ඔවුනොවුන්ගේ සිතුම් පැතුම්වලට අනුව ය. ඔවුන්ගේ පැතුම්වලට ඇතැම් කොටස් ඇතමුන්ට රිස්සුම් නො දෙන දේ විය හැකි ය. නිමිති තුළ පවතින ස්වරූප හේතුකොට ගෙන සිත් රිදවා ගන්නේ එබැවිනි. මේ සියල්ලට ම හේතුව සිත සමග කෙලෙස් මිශ්‍රවීමට ඉඩ තිබීම ය. අත්ථ කුසලය සකස් කිරීමේදී සිතේ කෙලෙස් මිශ්‍ර වීමට ඉඩ නැති බැවින් ඉදිරියේ තිබෙන නිමිත්ත මෛත්‍රී ස්වරූපයෙන් ඇසුරු කිරීමට හැකි ය. එය බලවත් සැනසිල්ලකි.

## නො පෙනෙන සත්වයෝ (අද්දිට්ඨා)

තමා හමුවේ නැති එහෙත් හඳුනන පුද්ගලයන් පිළිබඳ ව සිහියට නැගෙන අවස්ථා තිබේ. ඔවුන් තුළ පවතින, තමා ප්‍රිය කරන ඇතැම් ස්වරූප හා වෙනත් දේ ද, සිහියට නැඟී එන්නේ ය. එලෙසින් ම ඔහු තුළ තමා අප්‍රිය කරන කොටස් ද තිබිය හැකි ය. තමා ඇල්මකින් යුක්තව ඇසුරු කළ පුද්ගලයෙකුගේ හපන් කමක් පිළිබඳ ආරංචියක් ලැබුණු විට මතු වන්නේ සතුටකි. ඔහුව නැවතත් දැකගැනීමේ ආසාව ද ඇතිවේ. තමා අප්‍රිය කරන පුද්ගලයකු ලැබූ ජයග්‍රහණයක් හෝ යම් උසස් වීමක් පිළිබඳ ආරංචියක් ලැබුණු විට සිතේ ඇති වන්නේ නො

රිස්සුම් ගතියකි. ද්වේෂ සහගත සිතිවිලි වේගයකි. එවැනි පුවතක් දන ගැනීමට අවස්ථාව එලඹීම ගැන ද ඔහු පසුතැවිල්ලට පත් වේ. එම රිදුම සැහෙන කාලයක් සිතේ පවතිනවා ඇත. මෙසේ ඇස් හමුවේ නැති පුද්ගලයන් පවා උපකාර කරගෙන කෙලෙස් සහිත පුද්ගලයා පීඩා සාද ගන්නා සැටි මෙයින් පැහැදිලි ය. ආරංචි මාත්‍රයෙන් පවා පීඩාවට පත් කළ හැකි තත්ත්වයක් කෙලෙස් සිතට හිමි වී තිබෙන සැටි පෙනේ. අත්‍ථ කුසලය සකස් වූ සිතක මෙම තත්ත්වය උද වීමට ඉඩක් නැත. කුමන ආකාරයේ ආරංචියක් ලැබුණ ද එම සිතට පීඩාවක් නො ලැබෙන අයුරින් ක්‍රියා කිරීමේ ශක්තිය තිබේ. ඔහු අමුතුවෙන් ප්‍රිය කරන පුද්ගලයකු හෝ අප්‍රිය කරන පුද්ගලයකු හෝ නැතිකම මෙයට හේතුවයි.

## තමාගෙන් ඈත් ව සිටින සත්වයෝ (යෙ ච දූරෙ)

ඇසට පෙනෙන සතකු වුව ද, ඔහු තමාට දුරින් සිටින සතෙකු විය හැකි ය. යම් පුද්ගලයකු තමාට පෙනෙන ප්‍රමාණයේ දුරකින් සිටින විට ඔහු පිළිබඳ ව යම් ආශා ගතියක් පහළ වූයේ නම් ඔහුව තමා වෙතට ළඟා කර ගැනීමේ අදහසක් මතුවිය හැකි ය. එය සෙනෙහස, ආදරය යන නම්වලින් හඳුන්වමු. එම තත්ත්වය සිතේ පහළ වීමේදී ඇති වන්නේ නො ඉවසුම් ගතියකි. එම ගතිය වැඩි වන විට සැනසිල්ලක් ගැනීම සඳහා එම පුද්ගලයා ළඟා කර ගැනීමට ඔහු පෙළඹෙනවා ඇත. එම ක්‍රියාව, සිතේ හටගත් පීඩනය නැති කර ගැනීම සඳහා යොදන උපක්‍රමයකි. එහෙත් බාහිර ලෝකයා එය පිළිගන්නේ පුද්ගලයා කෙරෙහි දක්වන ආදරයක් සැටියෙනි. සාමාන්‍ය පෙනුමට අනුව එම තීරණය මතුවන්නේ නමුදු ඇත්ත එය නො වේ. සිතේ උපන් වේදනාව නැතිකර ගැනීම එම ක්‍රියාවේ පදනමයි. මෙහි අනිත් පැත්ත ද එසේම ය. තමාට පෙනෙන තෙක් මානයේ සිටින පුද්ගලයකුගෙන් තමා අකමැති ක්‍රියාවක් සිදු වන විට සිතේ පහළ වන ද්වේෂ ගතිය නො ඉවසුම් මට්ටමට පත් වන අවස්ථා තිබේ. එම අවස්ථාවේ ඔහුව තමා ළඟට ගැනීමේ හෝ තමා ඔහු ළඟට යාමේ හෝ තත්ත්වය උද වන්නේ ය. එම ඇදී යාම හිතවත් කමකින් නොව අහිතවත් කමකින් කෙරෙන්නකි. එම සිතේ පවතින්නේ තද රිදුම් දෙන පීඩා සහිත තත්ත්වයකි. සිතේ හටගත් පීඩාව නැතිකර ගැනීම සඳහා නිමිත්ත සමග එක් වී සුදුස්සක්

කිරීමට ඉදිරිපත් වීම මතු වූ රිදුමට අනුව පහළ වූ අදහස ය. මෙම අවස්ථා දෙකේදී ම මතුවූයේ පීඩන සහිත චිත්ත වේග ස්වරූප දෙකකි. එවැනි පීඩන ස්වරූපවලට සිත පත් වන්නේ කෙලෙස් මිශ්‍ර වීමට ඉඩ තිබුණු බැවිනි. එම තත්ත්වය නැති කරන අත්ථ කුසලය සිතේ සකස් වන විට නිමිත්ත කුමන තත්ත්වයේ හැඩයකින් යුක්ත වුව ද සිතේ කිසි වෙනසක් නො වී සිසිල් ගතියෙන් යුක්තව සිත පවත්වා ලැබෙන ආශ්වාදය විඳ සැනසීමට හැකි වෙනවා ඇත.

## තුදුරුව සිටින සත්වයෝ (වසන්ති අවිදූරෙ)

අවශ්‍යතාව සම්පූර්ණ වූ විට සෝමනස්ස ගතිය මතුවීම පුහුදුන් සිතට අයත් ගතියයි. කෙලෙස් මිශ්‍ර වීම ද පුහුදුන් සිතේ ස්වභාවයයි. අපේක්ෂාවක් සම්පූර්ණ වී සැනසිල්ලක් මතුවී තිබේ නම් එය එම අවස්ථාවේ සිතේ මතුවූ අපේක්ෂාව මතුකළ ලෝභය නැති වූ බවට ලකුණකි. එහි සිදු වූයේ අදහස සමග මිශ්‍ර වී තිබූ කෙලෙස් දහය නිවී යාම ය. යම් නිමිත්තක් හේතුකොට ගෙන උපදින අදහසක් ඉටු කර ගැනීමට නිමිත්තෙන් උපකාර ලැබෙන්නේ නම් එම නිමිත්ත සමග බැඳීම වැඩි වන්නේ ය. අදහස සපුරා ගැනීමට ඉඩ නො දී අවහිරකම් කරන යමක් සිදු වේ නම් එය පිළිබඳ ව ඇති වන්නේ පටිඝයෙන් යුක්ත වෛර ගතියකි. මතුවූ අවහිර නැති කර ගැනීමට යෙදිය හැකි උපක්‍රම ද යොදනු ඇත. මෙහිදී පෙන්වූ සිත් ස්වරූප දෙකේදී ම කෙලෙස් වේග මතුවූ බව පැහැදිලි ය. පුහුදුන් කමේ වරද නිසා මතුවන මෙම ස්වරූප ක්‍රියා කරන තාක් සැනසිල්ලේ සිත පැවැත්වීම කළ හැකි නො වේ. අත්ථ කුසලය සකස් වූ සිතක එම ස්වරූප ඇති නො වන්නේ ය. තමා ළඟ තිබෙන නිමිත්ත කුමන ස්වරූපයකින් යුක්ත වන්නේ නමුදු සිතේ කිසිදු වෙනසක් ඇති නො වී එය ඇසුරු කළ හැකි ශක්තිය එම සිතේ තිබේ. බාහිර දෙයක් සහාය කරගෙන සැනසිල්ල සෙවීමට අත්ථ කුසලය සකස් වූ සිතට අවශ්‍ය කමක් නැත. සිතේ තැන්පත් වී තිබෙන මෛත්‍රී සහගත ස්වරූපවලින් මතු වන රසය භුක්ති විඳින අතර, හමුවන නිමිත්ත සමග සැනසිල්ලේ සිත පැවැත්වීමට ඔහුට හැකි ය.

## සකස් වී අවසන් වූ සත්වයෝ (භූතා වා)

යමක සකස් වීමේ අවස්ථාව සංඛාර නමින් හඳුන්වන අතර, සකස් වී අවසන් වූ අවස්ථාව හඳුන්වන්නේ භූත නමිනි. මෙම කොටසට අයත් නැති, මෙම නමින් හැඳින්විය නො හැකි කිසිවක් ලෝකයේ නැත. සතර මහා භූතයන්ගෙන් සැදුම්ගත් සියල්ල භූත නමින් හැඳින්විය හැකි ය. කලින් විස්තර කරන ලද සත්ව කොටස්, තරාතිරම් භේදයෙන් හා ප්‍රදේශ භේදයෙන් වෙන් කර, ඒ ඒ කොටස්වල සතුන් පිළිබඳ ව පුහුදුන් සිත ක්‍රියා කරන අයුරු හා ලබාගන්නා ප්‍රතිඵල පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කෙළෙමු. අත්ථ කුසලය සකස් වූ සිතකින් එම කොටස් ඇසුරු කරන ආකාරය පෙන්වා එයින් ලබන රස ආස්වාද පිළිබඳව ද සඳහන් කෙළෙමු. මෙහි සඳහන් භූත නාමය අමනුෂ්‍ය කොටස් හැඳින්වීමට ද යෙදේ. එහෙත් මෙය ලෝකයේ පවතින සියල්ල හඳුන්වන පොදු නමකි.

සතුන් සමූහයක් දෙසට පුහුදුන් සිත යොමු කිරීමේදී එම සත්වයන් තුළ පවතින ක්‍රියා-හැඩ-වර්ණ ආදිය ඇසුරු කරමින් නොයෙක් තාලයේ කෙලෙස් ගති මතුකර ගන්නේ ය. ප්‍රිය උපදවන කොටස් හමු වීමේදී ලෝභය මතුවීමත්, අප්‍රිය උපදවන කොටස් හමු වීමේදී ද්වේෂය මතුවීමත්, පුහුදුන් සිතේ හුරුවයි. ලෝකයේ ජීවත් වන සත්ව ජාතීන් බොහෝ ය. ස්වරූප වශයෙන් සලකන විට එක ම ස්වරූපයක සතුන් දෙදෙනෙකු සෙවීම කළ නො හැක්කකි. සෑම සතකු තුළ ම ඔහුට පමණක් සීමා වූ හැඩයක්-වර්ණයක්-ශරීර ප්‍රමාණයක් ආදි වෙස්කම් තිබේ. එවැනි කොටස් පුහුදුන් ඇසට හමු වීමේදී එහි ඇති ස්වරූප ඇසට ගෝචර වන ආකාරයට අනුව කෙලෙස් ගති සිතට මිශ්‍ර වනු ඇත. ඒ නයින් බලන විට නිමිති දෙකක් එක් ස්වරූපයකින් පිළිගැනීමේ හැකියාව පුහුදුන් සිතේ නැති බව පැහැදිලි ය. එකී වෙනස්කම් සියල්ල ඇලීමේ හා ගැටීමේ ක්‍රියා දෙකට යටත් ය. මෙම කෙලෙස් වේග මතුවීමේ තත්ත්වය සිතක පවතින තාක් පොදුවේ පිළිගැනීම හා පොදුවේ සැළකීම කළ නො හැකි ය.

සමාජයේ සිදු වන පොදු ක්‍රියා දෙස බලන විට එය පහසුවෙන් තෝරාගත හැකි ය. රටක පාලනය සඳහා උපකාර

වශයෙන් නීති මාලාවක් සකස් කර තිබේ. පාලන තන්ත්‍රයේ ගරාදි වශයෙන්, පනවා ගත් නීති සමූහය සැලැකිය හැකි ය. නීතිය නිසියාකාර ක්‍රියාත්මක නො වන්නේ නම් පාලනය ද දුර්වල වන්නේ ය. නීතිය කාහටත් පොදුවේ බලපෑ යුතු බැව් සෑම දෙනකු ම පිළිගන්නා කරුණකි. නීතිය ක්‍රියාවේ යෙදවීමට ඉදිරිපත් වන්නා ද එය හොඳින් දනී. එහෙත් නීතිය ක්‍රියාත්මක කරන්නාගේ හිතවතකු දඬුවම් ලැබීමේ වරදකට අසුවුව හොත්, ඔහුව බේරා ගැනීමට, නීතිය අස්සෙන් රිංගීමේ මගක් තිබේ නම් එය ප්‍රයෝජනයට ගැනීම ද අතපසු නො කරයි. පොදු කමට අයත් වූ සාධාරණ කම ක්‍රියාත්මක වන්නේ නම්, එම නීතියට යටවෙන සෑම කෙනකු ම එලෙසින් බේරා ගැනීමේ අදහස මතුවිය යුතු ය. නමුත් බේරා ගැනීමේ අදහස මතුවන්නේ හිතවත් කම උඩ පමණි. මෙහිදී ඇති වන්නේ සාධාරණයක් නොව කෙලෙස් වේගවලට යටවීමකි. තමාගේ අහිතවතකු එවැනි තත්ත්වයකට පත් වූ විට කෙරෙන්නේ බේරීම සඳහා ඇති සියළු ඉඩකඩ වසා දැමීම ය. මේ අනුව බලන විට පුහුදුන් සිතක් සමග සාධාරණ කම බල නො පාන බව පිළිගැනීමට සිදු වේ. ඇතැම් විට බාහිර ව පෙන්විය හැකි විලාසවලින් සාධාරණත්වයක් මවා පෙන්වීමට ඇතැමුන්ගේ සමත් කම තිබේ. එහෙත් ධර්ම පිළිබඳ කතාවේදී සෙවිය යුත්තේ සිත ක්‍රියා කරන අයුරු ය.

යමකු වචනයෙන් පොදු කමේත් සාධාරණ කමේත් අගය කියා පාන්නේ නමුදු සිතේ එම ස්වරූපය තැන්පත් වී නැත. මොහොතකට හෝ සිතේ කෙලෙස් නැති ව යම් සාධාරණ ක්‍රියාවක් කරන්නේ නම් එතැන පුහුදුන් කම ද නැත. ඇලෙන, විරුද්ධ වෙන යන කොටස් දෙකට බෙද ගත් සත්වයන් පිළිබද ව වෙනස් ගති එසේ ප්‍රකට වෙන අතර, එක් එක් සත්වයා පිළිබඳ ව මතුවන සිතිවිලි ස්වරූප ද නිමිත්තේ පවතින හැඩවලට අනුරූප ව පෙරළෙනවා ඇත. එබැවින් සෑම නිමිත්තක් ම පුහුදුන් පුද්ගලයා පරිහරණය කරන්නේ සැනසිලි තත්ත්වයකින් නො වන බව පැහැදිලි ය. කෙලෙස් මිශ්‍ර නො වන අත්ථ කුසලය සකස් කර ගත් විට එම ගතිය ඉදිරිපත් වෙමින් හමු වන සෑම සත්වයකුගේ සැනසිල්ල අපේක්‍ෂා කරමින් ඊට සහාය වීමේ ගතිය මතු වන්නේ ය. මෙයට එක ම හේතුව නිමිත්තෙන් ඔහුට ලබාගත යුතු

කිසිවක් නැති කම ය. භූත යනුවෙන් හැඳින්වූ සියළු සතුන්ගේ සැපය ඔහු නිතර බලාපොරොත්තු වන්නකි.

## සකස් වෙමින් සිටින සත්වයෝ (සම්භවේසී)

මෙහි දක්වෙන සකස් වෙමින් සිටින සතුන් යන්න ඉපදෙමින් සිටින සතුන් යනුවෙන් තෝරාගෙන තිබේ. එම තීරණය වැරදි නො වේ. එහෙත් මෙම තීරණය මත ඇති වී තිබෙන විවිධ හැඟීම් වලින් මතුවන විග්‍රහයන් තුළ සැක කටයුතු තැන් නැතිවා නො වේ. ඉපදෙමින් සිටින සතුන් යනුවෙන් ඇතැමුන් අදහස් කරන්නේ පිළිසිඳ ගැනීමට අවස්ථා සොයමින් සිටීමේ හැකියාවක් ලැබීමට චුත වෙන අවස්ථාවේ ඇති වෙන චිත්ත ශක්තියට ඉඩ නැත. මරණාසන්න චිත්ත වීථියේ පහළ වන සිත් අතරින් එක් සිතකින් චුතිය වන අතර, ඊට අනතුරු ව පහළ වන සිත ප්‍රතිසන්ධි චිත්තයයි. මෙසේ අතරක් නොමැති ව චුතියට අනතුරු ව ප්‍රතිසන්ධිය ලැබිය යුතු ය. **සම්භවේසී** යනුවෙන් දක්වෙන්නේ ප්‍රතිසන්ධි චිත්තය සුදුසු ස්ථානයක පැවැත්මේ ක්‍රියාව ඇරඹීමෙන් පසු ව එයට අයත් කොටස් සකස් වී සම්පූර්ණ වන තෙක් පවතින ජීවිත කාලය යි. මවු කුසක ප්‍රතිසන්ධිය ගත්තේ නම් දරුවකුගේ ස්වරූපයට පත් වීමේ කාලයක් තිබේ. එම තත්ත්වය ලැබෙන තාක් කුසයේ සිටින කාලය සලකන්නේ **සම්භවේසී** අවස්ථාව වශයෙනි. ඕපපාතික ව උපත ලබන සත්වයන් හැර, බිජුවටින් හටගන්නා සත්වයන්, වැදූමසින් හටගන්නා සත්වයන්, දියකඩිති ආදිය උපකාර කරගෙන උපදින සත්වයන් යන කොටස් තුනට මෙම **සම්භවේසී** අවස්ථාව හිමි වන්නේ ය. එම අවස්ථාවේ සිටින සත්වයන් පිළිබඳ අමෛත්‍රී ස්වරූපයක් සිත්වල මතුවීමට හේතු නැතැයි සිතෙන්ට පුළුවන. එහෙත් බොහෝ අවස්ථාවල එවැනි අසරණ තත්ත්වයක ජීවිතය පවත්වන සත්වයන් පිළිබඳව අමෛත්‍රිය, අකරුණාව, පහළ කරගෙන ඔවුන්ට හානි කරන අවස්ථා බොහෝ ය.

කුකුළු-කුරුළු ආදි සත්වයන් **සම්භවේසී** අවස්ථාව ගතකරන්නේ බිත්තර තුළ ය. සතාගේ ජීවත් වීමට උපකාර වන සියළු කොටස් සම්පූර්ණ වූවාට පසු බිත්තරය බිඳී එම පැටවා ලෝකය සමග සබඳ වෙයි. "බිත්තරයට පණ නැත" යනු

ඇතැමකුගේ විශ්වාසය වී තිබේ. ඇතැම් විට එය නිදෙස් පුද්ගලයකු වශයෙන් පෙනී සිට බිත්තර අනුභව කිරීමට උපකාර වශයෙන් යොදගත් උපක්‍රමයක් විය හැකි ය. එසේ නැතිනම් සත්වයකුගේ ජීවිතයක් ඇතුළත සිදු වන ක්‍රියා හා ඒවා සකස් වෙන ආකාරය පිළිබඳ කිසිදු දැනීමක් නැතිකම ද විය හැකි ය. හේතුව කුමක් වුව ද. එය වැරදි මතයක් බව කිව යුතු ය. චිත්ත ශක්තියක් එක් නො වී සත්වයකුගේ පැවැත්මක් සිදු නො වේ. බිත්තරයේ බාහිර ක්‍රියාවක් පෙනෙන්ට නැතත්, ඇතුළේ නො නැවතී කෙරෙන ක්‍රියා වේගයක් තිබේ. එනම් ජීවිතයේ පැවැත්ම රැඳවීම සඳහා අවශ්‍ය අංගෝපාංග සකස් කිරීමේ ක්‍රියාව යි. එය දිවා රෑ නො නැවතී කෙරෙන්නකි. එම ක්‍රියාකාරී ස්වරූපය යම් අවස්ථාවක නැවතුනි නම්, එතැන් සිට එහි චිත්ත බලය නැත. එතැන් සිට එහි සත්වයකු ද නැත.

ඒ බව දනගෙන එම බිත්තරය ප්‍රයෝජනයට ගැනීමෙන් සිදු වන අකුසලයක් ද නැත. එහෙත් එය කුණුවීමේ පැත්තට හැරුණු බිත්තරයකි. සම්භවේසී අවස්ථාවේ ජීවිතය ගෙවන සත්වයන් සම්බන්ධ කර ගෙන අනර්ථ සිදු කර ගන්නා බව පෙන්වීම සඳහා එය එක් නිදසුණකි. මිනිස් ජීවිතයේ **සම්භවේසී**අවස්ථාව මවුගර්භයේ සිටින කාලයයි. මනුෂ්‍යයකුට අයත් අංගෝපාංග සකස් කරනුයේ එම කාලයේදීම ය. දරුවා "සම්භවේසී" අවස්ථාවේ සිටින සමයේදී මවගෙන් ලැබෙන උපකාර මත දිවි පෙවෙත රැ කේ. මිනිස් ජීවිතයේ "සම්භවේසී" අවස්ථාව වශයෙන් සැලකෙන එම අවදියේදී කෙනකු එම දරුවා පිළිබඳව අමනාපයක් ඇතිකර ගැනීමට හේතුවක් නැතිවා සේ පෙනිය හැකි ය. එසේ ම අමුතු ආසාවක් උපදවා ගැනීමේ කරුණක් ද තිබිය නො හැකි ය. එහෙත් එම ස්වරූප දෙක ම බඩේ සිටින දරුවා පිළිබඳ ව ක්‍රියා කරනවා ඇත.

කුංසේ සිටින දරුවා කවද බිහි වේදෝ, ඔහුගේ රුව කවද දක ගැනීමට ලැබේදෝ යන බලාපොරොත්තු මැදි කරගෙන මවගේ සිතේ නො ඉවසුම් ස්වරූපයක් මතු කරමින් අපේක්ෂාව සම්පූර්ණ වන තුරු පීඩාවෙන් කල් ගෙවයි. මෙය ලෝභයයි. දරුවා බිහිවෙන අවස්ථාවේදී කරදරයකට මුහුණ දීමට සිදුවේ ද යන

භයක් ද සිතේ ඇති වීම ස්වභාවයකි. එය ද්වේෂය පදනම් කරගෙන ඇති වන සිතිවිල්ලකි. දරු ජීවිතය නිමිති කරගෙන මවගේ සිතේ ලෝභ ද්වේෂ මතුවී පීඩා ලබන බව මෙයින් පැහැදිලි ය. එසේ ම පිය පක්ෂයේ සිතිවිලි අස්සෙන් ද දරුවාගේ සුරතල් ඉක්මණින් දක ගැනීමේ ආසාව මතුවන්නේ ය. තව ද දරු ප්‍රසූතියේදී මවට පීඩාවක් වේ ද, ජීවිත හානියක් වේ ද, යන භය පියාගේ සිතේ තදින් ක්‍රියා කරන්නකි. මෙසේ දරුවා බිහිවන අවස්ථාව වන තෙක් පීඩා මතු කරගන්නා මවු පිය දෙදෙනා පීඩා විඳින අතර ඇතැම් මවුපිය වරුන්ට ඊට හාත්පසින් ම විරුද්ධ ස්වරූපයක් පදනම් කරගෙන පීඩා විඳින අවස්ථා තිබේ. මවු පිය දෙදෙනා දරුවන් ලැබීමේ අකමැත්තෙන් සිටින අවස්ථාවක දරුවකු පිළිසිඳ ගත්තේ නම් ඒ පිළිබඳ අමනාපයෙන් එය නැතිකර නිදහස් වීම සඳහා ක්‍රම යෙදීමට ඔවුන් යොමු වෙනවා ඇත. කිසිදු අනුකම්පාවක් නැතිව, අයිතිය පරිහරණය කර ලෝකයට පා තැබීමට ඉඩ නො තබා එම සත්වයාව නැතිකර දමන අවස්ථා තිබේ. සත්ව ඝාතන කර්මයට ද ඔවුහු හසුවන්නෝ ය. මේ අයුරින් බලන විට පුහුදුන් පුද්ගලයා සත්වයාගේ "සම්භවේසී" අවස්ථාව තමාගේ අනර්ථයට යොදා ගන්නා සැටි පැහැදිලි ය. සත්වයාගේ එම අවස්ථාව තමාගේ පෙළීමට හේතු වන අයුරින් යොදා ගැනීමට හේතුව කෙලෙස් මිශ්‍ර වීම ය. එහෙත් අත්ථ කුසලයට අනුරූප ව සිත සාදගත් පුද්ගලයා එවැනි තත්ත්වයේ සිටින සත්වයකු වුව ද උපකාර කරගෙන එවැනි රිදුම් හදගන්නා අවස්ථාවකට එළඹෙන්නේ නැත. සෑම සත්වයකු පිළිබඳව ම මෙත් ස්වරූපය මතු කරගෙන සිටින බැවින්, "සම්භවේසී" අවස්ථාවේ සිටින සත්වයන් ද ඔහුගේ මෙත් සිතට මැදිවන්නේ ය.

මෙහි දක්වූ විස්තරයෙහි, ඇසට පෙනෙන සත්වයන් ද, නො පෙනෙන සත්වයන් ද, දුර සිටින සත්වයන් ද, ළඟ සිටින සත්වයන් ද, සෑදී අවසන් වූ සත්වයන් ද, සැදෙමින් සිටින සත්වයන් ද, යනුවෙන් විවිධ සත්ව කොටස් සිතට හමු වීමේ නා නා ආකාර දක්වමින්, එකී අවස්ථාවලදී සැනසිල්ලට හේතු වන අයුරින් සිත යොදන ආකාරය, අත්ථ කුසලය සිතේ සකස් වූ පමණට අනුව සිදු වන බව පැහැදිලි විය.

## සියලු සත්වයෝ සැප ඇත්තෝ වෙත්වා (සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා)

මෙයින් අදහස් කරන්නේ ඉහත සඳහන් වූ මෛත්‍රී සිත් ස්වරූපය සමතුල්‍යතාවයකට පත් වී එක ම මට්ටමේ මෙත් සිතකින් සියළු සතුන් පිළිගැනීමේ පුළුවන් කම තිබෙන බව ය. මෙය කෙලෙස් සහිත සිතෙන් කළ හැකි ක්‍රියාවක් නො වේ. සත්වයන් තුළ පවතින විවිධත්වයන්ට අනුව ඇලීමකින් හෝ ගැටීමකින් හෝ යුක්ත ව සිත් ක්‍රියා කිරීම පුහුදුන් කමේ දෝසයයි. අත්ථ කුසලය සකස් වන්නේ පුහුදුන් ගතිය ඉවත් වූ පමණට ය. තමා තුළ තිබූ පුහුදුන් ස්වරූපය ඉවත් වී, කෙලෙස් මතු නො වන තත්ත්වයට පත් වී, සිත ක්‍රියා කරන බව ස්ථිරව ම දත හැක්කේ සියළු සතුන් පිළිබඳ ව සමාන ව පහළ වන මෛත්‍රිය උද වූ විට ය. එම තත්ත්වයට සිත පත් වූ විට සියළු සතුන්ගේ සැප විහරණය අපේක්‍ෂා කෙරෙනවා ඇත. මෙසේ මෛත්‍රී හැඩයට ක්‍රියා කිරීමේ තත්ත්වය උද වූ සිත කුමන හේතුවක් නිසා හෝ කැළඹීමට පත් නො වන්නේ ය. අත්ථ කුසලයෙන් මතු කෙරෙන්නේ ලෝකෝත්තර තත්ත්වය පදනම් වී සිතේ ඇතිවන මෛත්‍රියයි. මෙහි විශේෂයෙන් ලොකෝත්තර සිත පිළිබඳ ව දක්වූයේ, බාහිර වස්තු උපකාරයෙන් සිතේ සැපය මතු කිරීමේ ආදීනව දක ඒවා බහා තබා කෙලෙස් නැති ව සිත පරිහරණය කිරීමෙන් ලැබෙන සැනසිල්ල භුක්ති විඳීමට තීරණය කරගත් තත්ත්වයයි. එම තත්ත්වය පදනම් වී සකස් වූ මෙත් ගතිය බිඳීමට තරම් සමත් නිමිත්තක් ලෝකයේ නැත. එබැවින් එම මෙත් ගතියෙහි ස්ථිර කම තිබේ. එයින් මතුවන සැනසිල්ල ද ස්ථිර ය. මෙම තත්ත්වයට සිත පත් වූ විට එම සිතේ ඇතිවන අදහස් යොමු වන පැත්ත පිළිබඳ විස්තර අනතුරු ව දක්වනු ලැබේ.

* * *

න පරෝ පරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝ සඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.

කිසිවෙක් කිසිවකුට වංචා නො කරත්වා, අවඥා නො නොකරත්වා, කෙනකුගේ ක්‍රියාවක් තවත් කෙනකුගේ සිතට රිදුමක් දෙන අයුරින් සිදු නො වේවා!. කෙනකුගේ ක්‍රියාවකට විරුද්ධ වන ස්වරූපය කිසිදු සිතක මතු නො වේවා, කෙනකුගේ පීඩාව අනෙකාගේ සතුටට හේතු නො වේවා, යන සිත් ස්වරූපය මතු වන බව ගාථාවෙන් දැක්වේ.

# 7 වැනි පරිච්ඡේදය

ගාථාවෙහි සඳහන් වී ඇති වචනවලින් පෙන්වන අදහස් මාලාව දෙස බැලීමේදී කෙලෙස් මතුවන ගතියෙන් සිත මුදගත් විට සිතේ ඇතිවන වෙනසේ ප්‍රමාණය තේරුම් යනු ඇත. සමාජයේ පැවතුම් හා හැසිරීම් දෙස බලන විට කෙලෙස් සහිත සිත් ස්වරූප ක්‍රියා කරන අඳුරු පැත්ත පැහැදිලි වන්නේ ය. කෙනකුට ලැබෙන සැපය ගැන සතුටු වීමේ හැකියාව කෙලෙස් සහිත සිතේ නැතිකම නිසා එවැනි අවස්ථාවක් දැකීමේදී හෝ ඒ ගැන ඇසීමේදී හෝ මතුකර ගන්නේ රිදුම් දෙන චිත්ත ස්වරූපයකි. කෙනකුගේ සැපයට කැමති වී සතුට මතුකර ගැනීමට තරම් නිදහස නො දෙන්නේ කෙලෙස් වේගවල බලපෑමෙනි. කෙනකුට අලාභයක් සිදු වූ අවස්ථාවක් දකින විට කනස්සලු බව පෙන්වන ඇතැමුන් කරනුයේ ඇත්ත වශයෙන් ම එය සිතේ මතු වූ දුකක් ද, මවා පෙන්වීමක් ද යන්න තීරණය කිරීම අපහසු ය. තමාට උපකාර කරන කෙනකුට යම් අලාභයක් සිදු වූ විට කනස්සල්ලක් සිතේ පහළ වීම මවා පෑමක් නො වේ. එහිදී පීඩාව මතුවන්නේ එම පුද්ගලයාට සිදු වූ පාඩුව ගැන සලකා ගෙන නොව ඒ හේතුවෙන් තමාට සිදු විය හැකි පාඩුව ගැන සලකා ගෙන ය. ඔහුගෙන් තමා ලැබූ ප්‍රයෝජන එතැන් සිට අඩුවේ ය යන සැකය ඇතිකර ගෙන ය. මෙසේ ලෝකයාගේ සැපය පිළිබඳ ව සිතා සතුටු විය හැකි

තත්ත්වයක් සිතේ නැති කමේ හේතුවෙන්, එවැනි ආරංචි රිදුම් දෙන අයුරින් පරිහරණය කිරීමට සිදු වන්නේ ය. මේ අයුරින් සිත ක්‍රියා කිරීමේ හුරුව නිසා, ජීවිතයේ වැඩි කොටසක් පීඩාවලින් රිදුම්වලින් යුක්තව පරිහරණය කිරීමට සිදු වී තිබේ. මිනිස් කමට සැපය හිමි ය. සැප සිතක් මතුකළ නො හැකි තත්ත්වයක සිටින්නේ තිරිසන් ආදී අභව්‍ය උපත් ලබා සිටින සත්ව කොටස් ය. මිනිසා සැප විඳීමේ හිමිකරුවකු ව සිටියදී දුක් විඳින්නේ ඊට අයත් ක්‍රියා හා පැවතුම් නො දත් කමේ හේතුවෙනි. එම දැනීම ලැබෙන තුරු දුක් විඳීමත්, දැනීම ලැබූ දට සැප විඳින්නකු වීමත්, මිනිස් කමේ ම අයිතියකි. මෙම දෙයාකාර අයිතිය, සිතේ කෙලෙස් ක්‍රියා කරන ප්‍රමාණවලට හා ක්‍රියා නො කරන ප්‍රමාණවලට අනුව සිදු වේ.

## කිසිවෙක් කිසිවකුට වංචා නො කරත්වා! (න පරෝ පරං නිකුබ්බෙථ)

වංචාව යනු රැවටීම ය. රැවටීම කෙලෙස් සහිත සිතෙන් බහුල ව කෙරෙන්නකි. තමා තුළ පවතින කෙලෙස් ගතිය අනෙකාව රිදවීමට විනා සැනසවීමට ඉදිරිපත් නො වන්නකි. කෙලෙස් නැති සිතට අන්‍යයන් දුකට හෙළීම රුචි නො වන්නේ ය. තමාගේ සිතේ කෙලෙස් නැති බැවින්, තමා විඳින සැපය අනෙකාට ද ලැබෙන අයුරින් සකස් වේවා යන මෛත්‍රී ප්‍රාර්ථනාව ඔහුගේ සිතේ නිතර ඇති වෙයි. කෙලෙස් සහිත පුද්ගලයා තමා විඳින දුක් ස්වරූපයට අනෙකාව ද පෙරළා ගත හැකි කුමක් හෝ කිරීමට පෙළඹෙයි. එයින් එක් ක්‍රමයක් වශයෙන් රැවටීමේ ක්‍රියාව සඳහන් කළ හැකි ය. කෙනකු කළ ක්‍රියාවකින් රැවටීමට ගොදුරු වූ තැනැත්තාට රිදුමක් වීම ස්වභාවයකි. ඔහු ද කෙලෙස් සහිත පුද්ගලයකු බැවින් ඒ ගැන අමනාපය මතුකර ගෙන පීඩා විඳියි. ඇතැමුන් විනෝදය තකා රැවටිලි ස්වරූපයේ ක්‍රියා කරන අවස්ථා තිබේ. කෙනකු රවටන්නේ එයින් මතුවන විනෝදය ලැබීම සඳහා විය හැකි ය. එහෙත් තමා විනෝද වන අවස්ථාවේ අනෙකා දුකින් පෙළෙන බව දක සංවේග වීමට බැරි කම කෙලෙස් වේගවල රෞද්‍ර කම ය.

## කෙනෙක් තව කෙනෙකුට අවඥ නො කරත්වා (නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි)

කෙනෙකු ලැජ්ජාවට පත් කිරීමේ ක්‍රියාව අවඥව වශයෙන් ගත හැකි ය. මෙය ද කෙලෙස් සහිත සිතකින් ම කෙරෙන්නකි. පුද්ගලයකු සමාජයෙන් කොන් කර පීඩාවට පත් කිරීමේ අදහස පදනම් කර ගෙන සමාජය විසින් පිළිකුල් කටයුතු යයි සම්මතයෙන් ඉවත් කර ඇති ක්‍රියා හා පැවතුම් පුද්ගලයන්ගෙන් සිදු වූ බව පෙන්වන අවස්ථා තිබේ. ඒ බව දැනගත්තා සමාජය ඔහුව කොන් කිරීම හා පහත් කොට සැලකීම ස්වභාවයකි. කෙනකුගෙන් සිදු විය හැකි එවැනි වරදක් පිළිබඳ ව සිහිපත් කරමින් ප්‍රසිද්ධියට පත් කිරීමේ උත්සාහය ද නො දියුණු සමාජයක ලක්‍ෂණයකි. එයින් ලැජ්ජාවට පත් වන්නාගේ සිතේ ඇති වන පීඩනයේ ප්‍රමාණය අසීමිත ය. ඇතැම් විට එවැනි සිද්ධීන් හේතුකොට ගෙන මරණය පවා සතුටින් පිළිගන්නා අවස්ථා ද ඇති වෙයි. මරණ භය අභිබවා යන මට්ටමේ පීඩනයක් කෙනකුගේ සිතට දීමට තරම් රුදුරු කෙලෙස් මතුකළ හැකි පුද්ගලයාගේ සිතේ මට්ටම තේරුම් ගැනීම අපහසු නැත. පිරිසිදු සිතකින් එවැනි තත්වයක් උදවීම කිසි සේත් නො වන සිද්ධියකි. ඔහුගේ සිතේ නිතර ඇති වන්නේ, එවැනි සිද්ධීන් කිසිවකුගෙන් කිසිවකුට සිදු නො වේවා යන මෛත්‍රී ප්‍රාර්ථනාව පමණි.

## කාය වාක් විකාරාදිය ඉදිරිපත් කර සිතේ අමනාප හැඟීම මතු නො කෙරේවා (බ්‍යාරොසනා පටිඝසඤ්ඤ)

විරුද්ධත්වය විවිධාකාරයෙන් ප්‍රකාශ කරනු ලැබේ. තමාට නුරුස්සන නිමිත්තේ ගැටීම පටිඝයයි. නිතර පටිඝය මතුකර ගෙන පීඩාවෙන් පෙළෙන පුද්ගලයෝ සමාජයේ බොහෝ වෙති. ඇතැම් විට අසරණයන් පෙළීමට පත් කිරීම සඳහා රෞද්‍ර ස්වරූපය මවාගන්නා පුද්ගලයෝ ද, අවස්ථා ද වෙති. කුමන නිමිත්තක් හෝ ඇසුරු කිරීමෙන් එවැනි ස්වරූප මතුවීමේ හේතුව ද්වේෂය සිත සමග මිශ්‍ර වීම ය.

මඩ වගුරේ ජීවත් වන්නා පරිහරණය කරන සියළු උපකරණ මඩ තවරා ගෙන ප්‍රයෝජනයට ගන්නා සේ කෙලෙස් මිශ්‍ර ජීවිතයක්

ඇති තැනැත්තාගේ සියළු ක්‍රියා කෙලෙස් මිශ්‍රණයෙන් යුක්ත ය. විනෝදය, සතුට, අනුකම්පාව, උපකාරය ආදි කිසිවක් කෙලෙස් නැතිව කිරීමේ හැකියාව ඔහු තුළ නැත. අඩු වශයෙන් කෙනකු සමග වැඩි කලක් හොඳ සිතකින් ඇසුර තබා ගැනීමේ හැකියාව ද ඔහු තුළ නැත්තේ කෙලෙස් මතුවීමේ වරදිනි. මෙම තත්ත්වයේ සිටින පුද්ගලයෝ වැඩි දෙනෙක් අන්‍යයන්ට රිදුම් දෙන තාලයෙන් ක්‍රියා කරන්නෝ ය. එබැවින් ඔවුන් සමාජයේ ප්‍රිය භාවයට වඩා අප්‍රිය භාවයට පත් වෙනවා ඇත. ඔවුන්ගේ ජීවිතය ද නිතර දහ ගතියෙන් යුක්ත ය.

කෙලෙස් ඉවත් කර සැනසිල්ල දෙන අත්ථ කුසලය සාදගත් පුද්ගලයාගේ පැවතුම් කිසිවක් අනෙකා රිදවන ස්වරූපයෙන් යුක්ත නො වන අතර, ඔහුගේ සිතේ ඇති වන්නේ කිසිවෙක් කිසිවකු පිළිබඳව පටිඝ සංඥාවෙන් යුක්ත නො වී සියල්ලන් කෙරෙහි මෛත්‍රී සිත පවත්වන්නෝ වෙත්වා යන සිතිවිල්ලයි. එයින් ඔහුගේ සිතට සතුටක් ලැබෙන අතර, ඔහුගේ සිතෙන් නිකුත් කරන සිසිල් තරංග ධාරා ලෝකය සනසනසුලු වෙයි. මේ කරුණු දෙස බලන විට කෙලෙස් ඉවත්කර ගත් සිතක ඇති වටිනා කම කොතෙක් ද යන්න සිතා ගැනීම අපහසු නැත. ඔහුගේ සියළු පැවතුම් ලෝකය සනසන තාලයෙන් ක්‍රියා කරන බව පැහැදිලි ය.

## කෙනකුගේ දුකෙහිදී තව කෙනකුගේ කැමැත්ත මතු නො වේවා (නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය)

සිතට කෙලෙස් එක්වූ අවස්ථාවක, ගාථාවෙන් දක්වෙන ස්වරූපය වන කෙනකුගේ දුකෙහිදී තව කෙනකුගේ කැමැත්ත මතු නො වේවා යන්න පහළ කිරීම කිසි සේත් කළ හැක්කක් නො වන බව කලින් කළ විස්තර ගැන සිතන විට වැටහෙනවා ඇත. දුකක් නිපදවමින් පීඩා විඳින අතර ලෝකය ද දුකින් පෙළෙනවා දකීමේදී සතුටු වන ස්වරූපය මතුවීම කෙලෙස් සහිත සිතක ස්වභාවයයි. එහෙත් කෙලෙස්වලින් මිදුණු සිතේ ස්වභාවය එසේ නො වේ. නිතර සිතෙන් සැප වින්දන මතුකරන අතර, සියල්ලන්ගේ ම සැප විහරණය ඇති වේවා යන පැතුම එම සිතේ පවතී. එබැවින් කෙනෙක් තව කෙනෙකුගේ දුක කැමති නොවෙත්වා

යන ප්‍රාර්ථනාව එම සිතේ සියළු සතුන් පිළිබඳ ව මතුවේ. මෙසේ සියළු සතුන්ගේ සැපයට බාධා කරන දේ සිදු නො වේවා යන ප්‍රාර්ථනාව අත්ථ කුසලය සකස් වූ සිතේ මතු වන්නේ ය. මතු දක්වෙන්නේ සියල්ලන්ගේ සැනසිල්ල මතු කිරීම සඳහා අවශ්‍ය එකී කරුණු සමාජයක සකස් විය යුතු අන්දමයි.

* * *

**මාතා යථා නියං පුත්තං**
**ආයුසා ඒක පුත්තමනුරක්ඛේ**
**එවම්පි සබ්බ භූතෙසු**
**මානසං භාවයේ අපරිමාණං**

මවක් තමාගේ ඖරස පුත්‍රයා දිවි ඇති තාක් යම් සේ රකින්නී ද, එමෙන් ම සියළු සත්වයෝ ද, එකිනෙකාගේ ආරක්ෂාවට හා සැනසිල්ලට උපකාර වන්නෝ වෙත්වා.!

# 8 වැනි පරිච්ඡේදය

කෙනකුගෙන් තව කෙනකුට ලැබෙන උපකාරය, රැකවරණය ආදියේ සීමාව දැක්වීම සඳහා මවක හා පුතකු අතර පවතින සම්බන්ධය නිදසුනට ගෙන තිබේ. මෙයින් දැක්වෙන්නේ මවක තුළ දරුවකු පිළිබඳව පවතින සෙනහසේ තත්ත්වය යි. තව කෙනකුගේ දුක කැමති නො වන තත්ත්වයට සිත පත් වූ කල්හි, දරුවා පිළිබඳව මවකගේ සිතේ ඇති වන ස්වරූපය මතුවීම මෛත්‍රියේ ලක්‍ෂණය යි. මෙම ගතිය ලෝකයේ සිටින සත්වයන් තුළ ඇති විය යුතු ය යන ප්‍රාර්ථනාව අත්ථ කුසලය සකස් වූ සිතේ මතුවන බව මෙහි සඳහන් වී තිබේ. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණක් ඇත. එනම් මෑණි කෙනකු තමාගේ දරුවා ගැන පවත්වන සිත් ස්වරූපය උසස් පෙළේ සිත් පිළිබඳ විස්තර පෙන්වීමේදී උදහරණ වශයෙන් ගැනීමට තරම් වැදගත් කමක් තිබෙන බව ය. එම තත්ත්වය මෑණිවරුන් තුළ තිබෙන බව නො වැටහෙන්නේ තිරිසන් ආදී සතුන්ට ය.

එම තිරිසන් තත්ත්වය ඇතැම් මිනිසුන් තුළත් තිබෙන බව දෙමාපියන් කෙරෙහි ඇතැම් පුද්ගලයන් පවතින ආකාරය පිළිබඳ ව බලන විට පැහැදිලි වේ. වයස්ගත ව දුර්වලත්වයට පත් වූ විට මවුපියන්ට සමහර දරුවෝ නො සලකති. එයින්

පෙනෙන්නේ මවුපියන් දරුවන් ගැන ගත් වෙහෙස, සෙනෙහස, විඳි දුක් කරදර ආදිය ගැන එම දරුවන්ට නො වැටහෙන බව ය. නො සිතෙන බව ය. උසස් ධර්ම ඇසුරු කිරීමේ තත්ත්වයට පත්වන තැනැත්තාට මවගේ හෝ පියාගේ ගුණය හඳුනාගෙන සැලකිලි සම්මාන කිරීමට හේතු වන්නේ දරුවකුගේ ජීවිතයට හිමි වී ඇති අයිතිවාසිකම් සියල්ල මවුපිය දෙදෙනාගෙන් හිමි වූවක් බව වැටහෙන බැවිනි. අත්‍ර්ථ කුසලය සකස් වූ සිතක ඇති වන ප්‍රධාන පැතුම මවක දරුවන් රකින්නාක් මෙන් සියල්ලෝ ම ඔවුනොවුන්ගේ දියුණුවට, ආරක්ෂාවට, සැනසිල්ලට උපකාර වෙත්වා යන්න ය. මවුපිය දෙදෙනා බ්‍රහ්මයා වැනි යයි බුදුපියාණන් වහන්සේ වදරා තිබේ. බ්‍රහ්ම ලක්‍ෂණ වශයෙන් සැලකෙන්නේ, මෙත්තා-කරුණා-මුදිතා-උපේක්ඛා යන උසස් ධර්ම ස්වරූප සතර ය. අන්‍යයන්ගේ සැපත පැතීම මෛත්‍රී ස්වරූපයට අයත් ලක්ෂණයකි. මෙය මවුපිය දෙදෙනා තුළින් දරුවන් පිළිබඳ ක්‍රියාත්මක වන්නකි. සැම විට ම දරුවන්ගේ සැපත පතා කළ හැකි දෙයක් කිරීමට මවුපියෝ නිතර සූදානම්ව සිටිති. දරුවන්ගේ සුභ සිද්ධියට අදල වන කරුණු මවුපිය දෙදෙනාගේ සිතිවිලි අතර නිතර පවති. එකී මෛත්‍රී අදහස් ක්‍රියාත්මක කිරීමට ඔවුන් ගන්නා යම් උත්සාහයක් වේ නම් ඒ සියල්ල කරුණාවට අයත් ක්‍රියා ලක්ෂණයක් වේ.

මෛත්‍රී සිතිවිල්ලක් ක්‍රියාවට පත් වන්නේ නම් එය කරුණාව වශයෙන් සැලකේ. දෙමාපියන් තුළ දරුවන් කෙරෙහි මුදිතා ලක්ෂණය ද නැතිවා නො වේ. දෙමාපියන්ට දරුවන්ගෙන් ලැබෙන යම් පාඩුවක්, අලාභයක් වේ නම් ඒ සියල්ල කෙරෙහි දැඩි ක්‍රියා මාර්ග නො ගනිති. දරුවන් විසින් දෙමාපියන්ට අයත් කුමක් හෝ විනාශ කර දැමුවේ නමුදු ඔවුන්ගෙන් පලි ගැනීමට නීතියේ උපකාර සෙවීමට දෙමාපියෝ ඉදිරිපත් නො වෙති. යම් හේතුවකින් නීතියේ බැම්මට දරුවන් අසු වීමේ ලකුණු පහළ වන්නේ නම් එයින් බේරා ගැනීමට ද මවුපියෝ ඉදිරිපත් වෙති. එසේ ම දරුවන්ගෙන් ලැබෙන අනුපකාරය හෝ හිරිහැරය ගැන අමනාප ඇතිකර ගෙන ඔවුන් සමග වෛර බැඳීමක් හෝ පලි ගැනීමක් හෝ නො කරති. ඒ උපෙක්ෂාවේ ලක්ෂණයකි. මෙම ස්වරූපය සැම කෙනකු තුළ ම ඇති වී සියල්ලන්ගේ ම සැනසීම සඳහා

සියල්ලෝ ම උදව් කාරයෝ වෙත්වා යන පැතුම අත්ථ කුසලය සදගත් සිතේ ඇති වන බව මෙහි දක්වේ. තව ද, දෙමාපියන් දරුවන්ට පූර්වාචාර්යවරුන් වශයෙන් ක්‍රියා කරන බව ද බුදුපියාණන් වහන්සේගේ දේශනාවේ සඳහන් වී තිබේ.

පූර්වාචාර්යවරුන් යනුවෙන් හැඳින්වෙන්නේ වරදක් සිදු වීමට මත්තෙන් එයින් බේරීම සඳහා කරුණු වටහා දෙන බැවිනි. මෙය දරුවන් පිළිබඳ ව දෙමාපියන්ගෙන් ඉටු වන්නකි. එම හේතුව උපකාර වී දරුවන්ගේ වැඩි වයස් සමයේදී ඔවුහු දෙමාපියන්ගෙන් ලබාගත් දැනීම උපයෝගී කොට ගෙන සමාජයෙන් පීඩා නොවිඳ ජීවත් වීමේ තත්ත්වයට පත් වෙති. අත්ථ කුසලය සකස් කර ගත් තැනැත්තාගේ සිතේ ඇති වන්නේ, සියල්ලෝ ම එකිනෙකාගේ සැනසිල්ලට උපකාර වන ලෙසින් අවවාද අනුශාසනා කෙරෙමින් ඔවුන් දුකින් මිදී සැනසිල්ලට පත් වෙන්නෝ වෙත්වා යන්න ය. මෙම ස්වරූපය කලකට පමණක් සීමා වූවක් නො වී තම තමන්ගේ දිවි ඇති තාක් කෙරෙන කෘත්‍යයක් බවට පත් වේවා. මෙම සිතේ තිබෙන ශාන්ත ස්වරූපය මෙයින් තේරුම් ගත හැකි ය. සිත කෙලෙස්වලින් මිදී පිරිසිදු තත්ත්වයකට පත් වූ බව මෙම ස්වරූපය සිතේ පහළ වීමෙන් තේරුම් ගැනීමට හැකි වේ. ඊට විරුද්ධ ව අදහස් සිතේ පහළ වන්නේ නම් එම සිතේ පවතින කටුක කෙලෙස් ගතිය පිළිබඳ ව සිතා ගැනීමට මෙම පැහැදිලි කිරීම උපකාර වෙයි. මෙම කරුණු ගැන සිතීමේදී කෙලෙස් සහිත හා රහිත සිතේ තිබෙන වෙනස තේරුම් ගැනීමට හැකි ය. කෙලෙස් සහිත සිතකින් සිතීමට අපහසු කරුණු යම් සිතක නිතර මතුවේ නම් එම සිත කෙලෙස් නැතිව ක්‍රියා කරන බවට ලකුණකි. මෙම ආකාරයෙන් ලෝකයාගේ සැනසිල්ල සඳහා තිබිය යුතු පැතුම් අත්ථ කුසලය සකස් වූ සිතෙහි රැඳී තිබේ. එම තත්ත්වයට සිත පත් වූ විට ඔහුට හිමි වන සැනසිලි අයිතිය සුළුපටු නො වේ.

සිතකට රිදුම් දෙන ප්‍රධාන කරුණු නම්, ලෝකයා සැප විඳිනවා දකීමට ඇති අකමැති කම හා සැප සියල්ල ම තමාට ලබා ගැනීමට බැරි කම වේ. ලෝකයාගේ සැනසිල්ල ඉතා මනාපයෙන් පිළිගෙන එයට සතුටු විය හැකි සිතක් තිබේ නම් ඔහුගේ සිතට සැනසිල්ල හා සැපය දෙන නිමිති සතර වටින් ම

හමු වේ. එබැවින් ඔහු හැම විට ම සතුටෙන් සිටින්නෙකි. සැප අපේක්ෂා කරන්නා විසින් කළ යුත්තේ කුමක් ද යන්න මෙයින් වටහා ගත හැකි ය. මෙසේ සිතේ ඇතිකර ගත් පිරිසිදු කමේ හේතුවෙන් පුහුදුන් කමට අයත් සිතිවිලි ඉවත් වී ලෝකයට සැනසිල්ල දීමේ අදහස ගැබ් වූ සිතිවිලි ඉතා ම උසස් තත්ත්වයෙන් පහළ වන සැටි මෙහි සඳහන් විය. මෙම සිතිවිලි පෙදෙසකට පමණක් සීමාවූවක් නො වේ. එය පැතිරී යාමේ ප්‍රමාණය මතු කියවෙන ගාථාවෙන් විස්තර වේ.

* * *

**මෙත්තං ච සබ්බලෝකස්මිං**
**මානසං භාවයේ අපරිමාණං**
**උද්ධං අධො ච තිරියඤ්ච**
**අසම්බාධං අවේරං අසපත්තං**

සම්බාධවලින් තොර ව, වෛරයෙන් තොර ව, උඩ-යට-සරස යන සියළු පෙදෙස්වල සිටින සියළු සතුන් කෙරෙහි මෛත්‍රිය වඩන්නේ ය.

# 9 වැනි පරිච්ඡේදය

## සියළු ලෝකයා කෙරෙහි මෙත් සිත පැතිරවීම (මෙත්තං ච සබ්බ ලෝකස්මිං)

සියළු ලෝකයා සබඳ කරගෙන පවතින මෙත් සිත සමග ඇසුරට වැටෙන හිත, අහිත, මධ්‍යස්ථ යන නිමිති කොටස් තුන ම සම ව පිළි ගන්නේ ය. සිසිල් ගතිය මතු කරමින් ක්‍රියා කරන මෙත් සිත ජීවිතය තුළ පවතින සියළු කොටස් නිවා ලන්නේ ය. සිරුර තුළ ධාවනය වන ලේ ධාතුව නිවීම මෙයට හේතුව යි. නොයෙක් හේතූන් මුල් කරගෙන සිරුරේ මතුවන දහ ගතිය සිසිල් වූ ලේවල ඇසුර ලබමින් නිවීමට පත්වන්නේ ය. ශරීරයේ පවතින දහ ගතිය ජීවිතයේ එක් ස්වභාවයක් ලෙසින් සිතා සිටින්නේ නමුදු එය සිරුරේ ස්වභාවය නොව සිතෙහි ඇති අමෛත්‍රියේ ස්වභාව සැටියෙන් තේරුම් ගත යුතු ය.

සියල්ලන් කෙරෙහි සාධාරණව මෛත්‍රිය ක්‍රියා කරන තත්ත්වයට පත් වූ විට ආනිසංස එකොළොසක් හිමි වන බව මෙත්තානිසංස සූත්‍රයෙහි සඳහන් වී තිබේ.

සැපසේ නින්දට පත් වීම, සැපසේ අවදි වීම, නපුරු සිහින නො පෙනීම මනුෂ්‍යයන්ට ප්‍රිය වීම, අමනුෂ්‍යයන්ට ප්‍රිය වීම, දිව්‍යරාජයින්ගේ රැකවරණය ලැබීම යන ආනිසංස සය මෛත්‍රී සමාධිය සකස් වූ සිතට හිමි ය.

ගිනිවලින් නො පිළිස්සීම, විෂ නො වැදීම, ආයුධ නො වැදීම, සිතේ පැහැපත් කම මතුවීම, මුහුණ පැහැපත් වීම, මුළාවෙන් තොර ව කාලක්‍රියා කිරීම, මරණින් මත්තෙහි බ්‍රහ්ම ලෝකයෙහි උත්පත්ති වීම යන පස මෛත්‍රී ධ්‍යානයෙන් නිපදවන ආනිසංසයෝ ය.

මේ ආකාර ආනිසංස එකොළොස ජීවිතය සමග එක්කරන ශක්තිය මෛත්‍රියේ පවතින බව මෙයින් පැහැදිලි ය. මෙම සිත් ස්වරූපය අඩංගු වී ක්‍රියා කරන සිත් තුළින් නිකුත් කරන තරංග ලෝකය නිවමින් පැතිරීම මෛත්‍රියෙන් සිදු වන බව තේරුම් ගත යුතු ය.

## මෙත් සිතේ ශක්තිය අසීමිත ව දියුණු කරන්නේ ය. (මානසං භාවයේ අපරිමාණං)

සිතක සකස් වූ ශක්තිය අනතුරු සිතට බෝවීම සිතේ ස්වභාවයකි. මෙත් ගතිය ද සිතේ දියුණු වී ක්‍රියා කරන්නේ එලෙසිනි. එම තත්ත්වයෙන් ක්‍රියා කිරීමේ හුරුව දියුණු වන සිත, යොමු වන කුමන පැත්තක් හෝ කුමන වස්තුවක් හෝ පිළිබඳ වෙනසක් නැති ව, සාධාරණ ව ක්‍රියා කිරීම දියුණු වූ මෛත්‍රියේ ලක්ෂණය යි.

## උඩ පෙදෙස, යට පෙදෙස හා අවට පෙදෙස්වල සිටින සත්වයෝ (උද්ධං අධෝච තිරියඤ්ච)

මෙසේ ප්‍රදේශ බෙදීම සිදු වන්නේ මෛත්‍රී සිත පවතින පුද්ගලයා සිටින ස්ථානයේ සිට ය. යමකු සිතන සිතිවිල්ල එල්ල වන පැත්තක් තිබේ. පුහුදුන් පුද්ගලයා සිතන්නා වූ සිතිවිල්ල යොමු වන පෙදෙසේ සිටින සියළු සතුන් කෙරෙහි සාධාරණය යොමු නො වේ. කෙලෙස් සහිත පුද්ගලයාගේ සිතේ හටගත් යම් අපේක්ෂාවක් වේ නම් එය සපුරා ගැනීම සඳහා ඔහු සියළු නිමිති ඇසුරු කරයි. ඔහුගේ සිතේ මතුවන අපේක්ෂා සපුරා ගැනීම සඳහා උපකාර වන සලකුණු තිබෙන හෝ නො තිබෙන තරමට අනුව නිමිත්ත පිළිබඳ ව සිතේ වෙනස් කම් ඇතිකර ගනී. සාධාරණ කම නැත්තේ එහෙයිනි. අපේක්ෂාවක් නැති සිතිවිල්ලක් පුහුදුන් සිතේ මතු නො වේ. සිතේ මතුවන සිතිවිලි සමග ක්‍රියා

කරන කෙලෙස් වේග නිසා මතුවන දහ ගතිය නිවා ගැනීමට නොයෙක් දේ කිරීම පුහුදුන් ජීවිතයේ ප්‍රධාන කෘත්‍යයයි. නිතර මතුවන කෙලෙස් දහය නිවා ගැනීම සඳහා ඊට කිසි සේත් නො ගැළපෙන නොයෙක් කාලයේ පුද්ගලයන් හෝ වස්තු හෝ ප්‍රදේශ හෝ නිමිති කර ගෙන ලෝභයෙන් හෝ ද්වේෂයෙන් හෝ මිශ්‍ර වූ සිතිවිලි පහළ කිරීම පුහුදුන් කමේ ලක්ෂණ බව කලින් කළ විස්තර වලින් පැහැදිලි විය. පුහුදුන් කමෙන් ඉවත් කරගත් සිතක ඇතිවන මෛත්‍රී ස්වරූපය ශක්තිමත් ව සකස් වූ විට එම සිතේ ඇතිවන මෛත්‍රී හැඟීම්, පැතිරී ක්‍රියා කරන අයුරු මෙම ගාථාවෙහි දක්වේ. එයින් අදහස් කෙරෙන්නේ නිතර උඩ-යට-සරස ආදී පෙදෙස් ගැන සිතමින් කාලය ගෙවීම නො වේ. එකී පෙදෙස්වල වාසය කරන කුමන සත්වයකු ගැන හෝ සිහියට නැගුණු විට එම සත්වයා ගැන මෛත්‍රියෙන් යුක්ත වූ සිතිවිලි ගොනුව මතුවන බවයි. එම සිතෙහි සකස් වී දියුණු වී ඇති මෛත්‍රියේ ප්‍රමාණය මෙයින් සිතාගත හැකි ය.

## කරදරවලින් මිදුණු බව, මෛත්‍රියෙන් යුක්ත ව හතුරා සිහි කිරීම සහ කිසිවකු කෙරෙහි අප්‍රසන්න කම නො තිබීම (අසම්බාධං අවේරං අසපත්තං)

මෙම ස්වරූපයේ අදහස් පහළ වන්නේ මෛත්‍රිය සකස් වූ සිතේ පමණි. එම මෛත්‍රිය සියළු පෙදෙස්වල සිටින සත්වයන් නිමිති කරගෙන මතුවන්නේ ඉහත කී හැඟීම් ඇතුලත්ව ය. මුලින් තිබූ අමෛත්‍රී ස්වරූපය වෙනස් වී මෙම තත්ත්වයට සිත පත් වන කල්හි එම සිත හිමිකරුට ලැබෙන සැනසිලිදායක වින්දනය ඉතා ශ්‍රේෂ්ඨ ය.

* * *

තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

සතර ඉරියව්වෙහි මෙත් ගතිය පැවතීම
බ්‍රහ්ම ස්වරූපය සිතේ සකස් වීමට හේතු
වී තිබේ.

# 10 වැනි පරිච්ඡේදය

## සිටීම-සක්මන-හිඳීම-සයනය කිරීම යන සතර ඉරියව්වෙන් (තිට්ඨං චරං නිසින්නෝවා සයානෝවා)

සතිපට්ඨාන සූත්‍රයේ දක්වා තිබෙන පරිදි සතර ඉරියව්වේදී ම මෛත්‍රිය පරිහරණයට ගතයුතු බවයි මෙම පාඨයෙන් දක්වෙන්නේ. විවිධ ඉරියව් පැවැත්වීමේදී ඊට අනුරූප ව චිත්ත වේග සකස් වීම සිතේ පවතින ගතිය යි. එම වෙනස් කම කුමක් වුව ද, සිතේ පවත්වා ගත් මෛත්‍රී ස්වරූපයේ වෙනසක් නො වේ. චිත්ත ශක්තිය මැනීමේ නො වරදින ක්‍රමය ද එයම ය. පිහිටුවාගත් චිත්ත ශක්තියේ හපන් කම මැනෙන්නේ මෛත්‍රිය වෙනස් කර නො ගෙන කුමන කරුණකට හෝ සම්බන්ධ විය හැකි කමේ පමණට ය. මෛත්‍රී ශක්තියේ සම්පූර්ණත්ත්වය ද මැනිය හැක්කේ නිමිත්ත හෝ ඉරියව්ව ඇසුරු කිරීමේදී සිත් ස්වරූපය නො වෙනස් ව පැවැත්විය හැකි ප්‍රමාණයෙනි.

## නින්දට යනතුරු (යාවතස්ස විගතමිද්ධෝ)

මේ ආකාරයෙන් විවිධ අවස්ථා දක්වා ඇත්තේ, මෙවැනි අවස්ථාවන්හිදී සිතිවිලිවල තත්ත්වය වෙනස් කිරීමට උපකාර වන හේතු, පුහුදුන් සිත සමග මිශ්‍ර වී තිබෙන බැවිනි. නිදිබර ගතිය ඇති වූ විට සිතේ තිබූ ඉතා ම වැදගත් කරුණු වුව ද රඳවා ගත නො හැකි දුර්වල තත්ත්වයට පත් වන බව අපි දනිමු.

නින්දට පත් වීමේදී සිදු වන්නේ සිත බාහිර අරමුණු ගැනීමෙන් තොර වූ තත්ත්වයකට පත් වීම ය. සියළු ක්‍රියා දුර්වල වන බව නිදිබර ගතිය මතුවීමේදී දනේ. උත්සාහයෙන් වුව ද, එය මග හරවා ගැනීමට නො හැකි ය. නින්ද පිළිබඳ ව විස්තරයක් මෙහිදී දක්වීම උචිත යයි සිතමු.

ජීවිතයාගේ පැවැත්ම සිතෙන් මතුකරන තේජස උපකාර කොට සිදු වන්නකි. සිත පහළ වීමේ ප්‍රධාන ස්ථානය "මනොවිඤ්ඤණ ධාතුව" යනුවෙන් බුදුපියාණන් වහන්සේ නම්කර තිබේ. මෙහි "මනෝවිඤ්ඤණ ධාතුව" යනුවෙන් දක්වෙන්නේ, සිතක් පහළ වීමට උපකාර වන නිමිත්තේ ඇති උස-මහත-වර්ණ වැනි ස්වරූප දක ගැනීමේ ශක්තිය පහළ වන ස්ථානයයි. එය හදවත යි. එසේ ම සිතෙන් දනගන්නා නිමිතිවල ස්වරූපවල සටහන් ධාරණය වන කොටස "මනොධාතුව" වශයෙන් නම්කර ඇත. මනොධාතුව යනු මොළයයි. මොළය ක්‍රියා කරන්නේ ඉන්ද්‍රිය සමග එක්වෙන නිමිතිවල පවතින ප්‍රමාණ ධාරණය කරගැනීම සඳහා ය. මෙම සිද්ධිය මොළය තුළ සකස් වී ඇති ස්නායු හෙවත් ඉතා සියුම් තන්තු සමූහයක් කරන ක්‍රියාවක ඵලයකි. ඇසට නිමිත්තක් හමු වීමේ අවස්ථාවේදී එම නිමිත්තෙන් විකාශනය වන තරංග ආලෝකය උපකාර කරගෙන ඇසේ ස්පර්ශ වන්නේ ය. එම ස්පර්ශයෙන් ඇසේ උපදවන තේජස තුළ පවතින විද්‍යුත් කාන්දම්වල ප්‍රමාණය සකස් වන්නේ ඇසේ පහළ වූ තේජස් ප්‍රමාණයට අනුව ය. විද්‍යුත්-කාන්දම් යන ශක්ති දෙවර්ගයෙන්, කාන්දම් ශක්තිය හදවතේ ලේවල ඇතුළත් අණු අතරින් එම කාන්දම පිළිගැනීමේ ශක්තියෙන් යුක්ත වූ අණුවක් තුළ පවතින කාන්දම් ශක්තිය සොලවා ලන්නේ ය. එම සෙලවීමේ කෘත්‍යය "විඤ්ඤණය" හෙවත් "දනීමය". මෙම දනීම පුද්ගලයකු විසින් කරන්නක් නො ව ශක්තියක් තවත් ශක්තියකින් පිළිගැනීම ය.

මෙහි සඳහන් විඤ්ඤණය පහළ වීම "පඤ්ච උපාදන ස්කන්ධ" නමින් හැඳින්වෙන කෘත්‍යයන් පහ සම්පූර්ණ වීමෙන් සිදු වේ. රූප-උපාදන-ස්කන්ධ යන වචන තුන රූපොපාදනස්කන්ධ වශයෙන් එක්වී තිබේ. එහි අදහස රූප්පනය, ඇලීම, මතුකරමින් සාමූහිකව ක්‍රියා කිරීම යනුයි.

## රූපොපාදනස්කන්ධ

ඇලීම මතුවිය හැකි ආකාරයෙන් රූප්පනය හෙවත් වෙනස් වීම රූපොපාදනස්කන්ධය යි. මෙම වෙනස් වීමත් සමග කෙරෙන කෘත්‍යයන් සියළු ඉන්ද්‍රියයන්ගෙන් ම සිදු වේ. නමුත් පැහැදිලි කිරීම පිණිස එක් ඉන්ද්‍රියයක් සමග කෙරෙන කෘත්‍යයක් මෙහි විස්තර කරමු. ඒ සඳහා චක්ඛු ඉන්ද්‍රිය ගනිමු. යම්කිසි වස්තුවක් ඇස හා සම්බන්ධ වීමේදී එම වස්තුව නිමිත්ත වේ. එම නිමිත්තෙන් නිකුත් කරන ආලෝක තරංග ඇසේ ස්පර්ශ වීමෙන් චක්ඛු ප්‍රසාදයේ තිබෙන අණු ක්‍රියාත්මක වේ. හෙවත් රූප්පනය වේ. එම ක්‍රියාවට භූමිය වූයේ චක්ඛු ප්‍රසාදයයි. චක්ඛු ප්‍රසාදය නිර්මාණය වී තිබෙන්නේ පරමාණු ගොනු වීමෙනි. ඇසේ පවතින එම පරමාණුවල සිදුවන රූප්පන සමූහය බුදුවදනෙහි සඳහන් වන්නේ රූප කලාප යනුවෙනි. පරමාණු තුළ තාප-විද්‍යුත්-කාන්දම්-රසායන යන ශක්ති කොටස් ගැබ් වී තිබේ.

## වේදනා ස්කන්ධය

ඉහත සඳහන් කළ පරිදි ඇසෙහි අණු රූප්පණය සිදු වීමේදී මතු වූ තේජස් සමූහය වේදනාස්කන්ධය යි.

## සංඥා ස්කන්ධය

හඳුනා ගැනීමට උපකාර වන ලකුණ සංඥාවයි. ඇසේ අණු වෙනස් වී මතුකළ තේජස තුළ විවිධ ප්‍රමාණවලට අයත් තේජස් අංශක තිබේ. එම තේජස් අංශක ගොණුව සංඥා ස්කන්ධ යයි.

## සංඛාර ස්කන්ධය

සංඛාර යනු සකස් වීම ය. ඉහත සඳහන් කළ ඇසේ උපන් තේජස ආශ්‍රිත ව තිබූ විද්‍යුත්-කාන්දම්-රසායන එක් ශක්ති ගොණුවක් වීම සංඛාර ස්කන්ධය යි. මෙහි ගොණු වූ කාන්දම් ශක්තිය සමග ක්‍රියා කිරීමේ හැකියාව පවතින්නේ හදවතේ ඇති ශුද්ධ ලේ ආශ්‍රිත පරමාණු තුළ ය.

## විඥ්ඥාණ ස්කන්ධය

කාන්දමේ ගමන් කිරීමක් නැත. කාන්දමකින් කාන්දමක්

සෙලවිය හැකි කම කාන්දමේ පවතින ස්වභාවික ශක්තියයි. ඇසේ මතුවූ කාන්දම් ශක්තිය හේතු කොට ගෙන හදවතේ ඇති පරමාණුව තුළ පවතින ඊට සමාන කාන්දම් ශක්තිය සෙලවේ. එම සෙලවීම විඤ්ඤාණ ස්කන්ධය යි.

මේ සියල්ල උපාදන වූයේ එකකට එකක් බඳවන කාන්දම් ශක්තිය මෙම අණුවල තිබූ බැවිනි. රහතන් වහන්සේලාගේ සිත්වල උපාදනය නැත්තේ උන්වහන්සේලාගේ සිත් පහළ කරවන අණුවල කාන්දම් ශක්තිය නොමැති නිසා ය. එම විස්තරය මතු දැක්වේ.

සොලවනු ලබන කාන්දම් පවතින අණුව අභිධම් විස්තරයේ පෙන්වන "වත්ථුරූපය" වේ. කාන්දම හදවතේ පවතින අණු සමඟ ක්‍රියා කිරීම සිත පහළ වීමට උපකාර වේ. ඇස හා මොළය සම්බන්ධ කර තිබෙන ස්නායු උපකාර කරගෙන නිමිත්තේ සටහන විද්‍යුත් උපකාරයෙන් මොළය කරා ගමන් කරයි. එම විද්‍යුත් වේගය මොළය තුළ තිබෙන සියුම් තන්තු එක්තරා රිද්මයකින් චලනය කරයි. එම රිද්මය, නිමිත්තේ සටහන මොළයේ තැන්පත් කරන මාධ්‍යයයි. නිමිත්තේ සටහන නැවත ලබා ගන්නේ එයට වෙන් වී ඇති චලන රිද්මය මතුවීමෙනි. නිමිත්ත ඇසුරු කර සිතක් පහළ වීමත්, එම නිමිත්තේ සටහන මොළයේ තැන්පත් වීමත්, මෙම ක්‍රමයට අනුව සිදු වේ. එසේම මොළයේ සිදු වන චලනවලට අයත් අදහස් හදවත කරා ගමන් කරවීම විද්‍යුත් හුවමාරුවෙන් සිදුවන්නකි. මොළයත් හදවතත් අතර පවතින මෙම විද්‍යුත් හුවමාරුව නැවතුණු විටක යමක් මතක් කර ගැනීම සිදු නො වන්නේ ය. සිහිය නැති වීම වශයෙන් අප සලකන්නේ ද මොළයෙන් හදවත කරා ගමන් කරන විද්‍යුත් නැවතුණු අවස්ථාව යි. එවැනි අවස්ථාවකට පත් වූ කෙනකුගේ දඟලීම් ආදී නොයෙක් ක්‍රියා සිදු විය හැකි ය. එහෙත් තමා කරන්නේ කුමක් ද යන්න ගැන දැනීමක් ඔහුට නැත. මෙම ක්‍රියා ස්වරූපය ජීවිතයක කෙරෙන සියළු ක්‍රියාවන්ට සාධාරණ ය. කලින් සඳහන් කළ පරිදි සිතිවිලි පහළ වීමේ අවස්ථාවල උපදවන තේජස් සමග ක්‍රියා කරන විද්‍යුත් වේග ද එම තේජසට අයත් උෂ්ණ අංශකය ම උඩුලනවා ඇත. ඊට සබඳ කාන්දම ද එසේම ය. පුහුදුන් සිත සැමවිට ම යම් කෙලෙස් ප්‍රමාණයකින් යුක්ත වී ක්‍රියා කර යි.

කෙලෙස් මිශ්‍ර සිත්වලින් නිපදවෙන විද්‍යුත් වේගවල පවත්නා තේජස වැඩි ය. එබැවින් මොළයේ පවතින සියුම් ස්නායු වටා තැවරී තිබෙන ද්‍රව කොටස් ක්‍රමයෙන් වියලීමට පටන් ගනී. ඒ ආකාරයෙන් දවස මුළුල්ලේ පහළ කරන සිත් උපකාර වී වේලෙන ද්‍රව කොටස් රාත්‍රී කාලය පැමිණෙන විට සෑහෙන ප්‍රමාණයකින් වියලී ස්නායු ක්‍රියා කිරීමේ අපහසුව මතුකරයි. වේලීම වැඩිවෙත් ම පඤ්චේන්ද්‍රියයන් සමග සබඳකම් ඇති ස්නායු දුර්වල වී, ක්‍රියාකාරි හැකියාව නැති වී යයි. ඉන්ද්‍රියයන් සමග සබඳ ස්නායු අක්‍රිය වීම ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්ත්වය නැවතීමට හේතුවකි. ඉන්ද්‍රියන්ගේ ක්‍රියා දුබල වීම නිසා අරමුණු ගන්නා ශක්තිය ක්‍රමයෙන් නැති වී යයි. නිදිමත යනුවෙන් අප විසින් තීරණය කෙරෙන්නේ එය යි. නිදිමත දියුණු වීමේ හේතුවෙන් කෙලින් සිටීමට හෝ ශක්තිය නැති වී සයනයට පත් වීමට සිදු වේ. යමකුට නිද ගත හැකි වන්නේ මොළයේ තිබී වියලී ගිය ද්‍රව කොටස් වැඩෙන තෙක් පමණි. නින්දේදී ලැබෙන විවේකය හේතු කොට ගෙන මොළයේ ද්‍රව කොටස් වැඩී මට ඉඩ ලැබේ. ක්‍රමයෙන් වැඩෙන ද්‍රව කොටස්, ස්නායු ක්‍රියා කරවිය හැකි අවශ්‍ය ප්‍රමාණයට වැඩුණු විට ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරිත්වය ඇරඹීමට සුදුසු අවස්ථාවට පත් වෙයි. එවිට පඤ්චේන්ද්‍රියයන් අතුරින් කුමන ඉන්ද්‍රියයකට හෝ ලැබෙන නිමිත්ත ඇසුරු කර, එම ඉන්ද්‍රිය ක්‍රියා කිරීමේ තත්ත්වයට පත් වී සිත් පහළ කිරීමට පටන් ගනී. එතැන් සිට නිදිබර ගතිය පහ වී අවදි වීම සිදු වේ. තමාට අවශ්‍ය වූ විටෙක නිද ගැනීමට හෝ නින්දට පත් වී සිටින අවස්ථාවක අවදි වීමට හෝ හැකියාවක් නො ලැබෙන්නේ මෙම න්‍යායට අනුව ය.

කෙලෙස්වලින් යුක්ත පුහුදුන් සිත මෙම අවස්ථාවට පත් වීමේදී ප්‍රකෘති සිහිය අඳුරු වී යන බව රහසක් නො වේ. නිදිබර වැඩි වූ අවස්ථාවල නොයෙක් තාලයේ නො ගැලපෙන වචන හා ක්‍රියා මතු වන්නේ ඒ හේතුවෙනි. එහෙත් අත්ථ කුසලය සකස් වෙමින් පවතින සිතක එවැනි සිහි නැති තත්ත්වයට පත් වීමේ දුර්වලකම් මතු නො වන බැවින් නින්දට පත් වන තුරු මෛත්‍රී ස්වරූපයෙන් සිත ඉවත් නො වේ. බෞද්ධ දර්ශනයේ උගන්වන "ජාගරිකානුයෝගය" නමැති තත්ත්වය කෙලෙස් නැති සිතට හිමිවන

අයිතියකි. ජාගරිකානුයෝගය හෙවත් නිදිමත දුරලන යෝගය යනුවෙන් දක්වෙන්නේ පුහුදුන් සිතේ මෙන් කෙලෙස් වේග හේතු වී මොළයේ ස්නායු වියලවන තත්ත්වයට පත් නො වීමයි. එබැවින් රහතන් වහන්සේලාට නිදිබර ගති මොන ම ලෙසකින් වත් මතු නො වේ. දිවා රෑ දෙක්හි ම රහතන් වහන්සේගේ සිත අවදියෙන් ම ක්‍රියා කරයි. උන්වහන්සේ රාත්‍රී කාලය සමාපත්ති සුවයෙන් ගත කරන සේක.

## මෙසේ නික්ලේශී ව සිත පැවැත්වීම වෙනස් නො කර සිටීමේදී සකස් වන සිතේ තත්ත්වය බ්‍රහ්ම විහාරය යි. (එතං සතිං අධිට්ඨෙය්‍ය බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු)

කෙලෙස්වලින් මිදුණු සිත "බ්‍රහ්ම" නමින් හැඳින්වෙයි. එම සිතේ කෙලෙස් සියල්ල පිසදැමී ඇති බව තේරුම් ගැනීමට උපකාර වන ධර්ම සතරකි. මෙත්තා-කරුණා-මුදිතා-උපේක්ඛා යනු එම ධර්ම සතර යි. එම ධර්ම සිතේ ගොඩනගා ගැනීම සඳහා පිළිවෙලින් සිත දියුණු තත්ත්වයට ගෙනා ආකාරය කලින් පැහැදිලි විය. හදගත් මෙත් ගතිය තුළ පවතින ශක්තිය හා ස්ථිර බව හා ශක්තිමත් වී ඇති ප්‍රමාණය පෙන්වන්නේ කරුණාව-මුදිතාව-උපේක්ඛාව යන ස්වරූප සිතේ ක්‍රියා කරන පමණට ය. කරුණාව යනු මෛත්‍රිය ක්‍රියාවට දැමීමේ උද්‍යෝගය සිතේ මතුවීමේ අවස්ථාවට පත් වීම ය. එසේ කරුණා ස්වරූපය මතු වූ විට දුකට පත් වූවන් මුද ගැනීමට උපකාර වන යහපත් අදහස් ක්‍රියාවට දැමීම සඳහා උපක්‍රම හා උත්සාහය යෙදේ. එසේ ක්‍රියා කිරීමට ලැබෙන අවස්ථාව ඉතා වැදගත් ය.

කෙනකුගේ විපතේදී තමාට පිහිට විය හැකි ඉඩක් නො වේ නම්, වෙන අයකු හෝ යොදවා එය කිරීමට කරුණාවෙන් යුක්ත පුද්ගලයා ඉදිරිපත් වන්නේ අවස්ථාවට උචිත ක්‍රමය එය වශයෙන් සලකා ගෙන ය. මෙම ගතිය ඇතැම් පුහුදුන් පුද්ගලයන් තුළ ද තිබෙන අවස්ථා ඇත. ඇතැම් විට ඔහු ආගමකට සබඳකම් ඇති කෙනෙක් ද නො විය හැකි ය. එහෙත් එවැනි පුද්ගලයන් තුළින් ද කරුණාවේ හැඩය පෙන්වන සිද්ධීන් දැකිය හැකි ය. සතකු පාර මැදට පනින විට රියැදුරු මහතා වාහනයේ වේගය අඩු කර සතාගේ ජීවිතය බේරා ගැනීමට උත්සාහ යොදන අවස්ථා

එමට ය. තමාගේ වාහනයට හෝ තමාට හෝ විය හැකි කරදරයකින් බේරීමේ අදහසින් තොර ව හුදෙක් සතා බේරන අදහසින් ම කෙරුණු සිද්ධියක් නම් එහි කරුණාව මිශ්‍ර වී තිබෙන බව පිළිගත යුතු ය. කෙනකු යමකුගේ අනාගත දියුණුව පතා ආත්ම ලාභයෙන් තොර ව උපකාරයක් වීමේ චේතනාවෙන් අවවාදයක් වුව ද, කරන්නේ නම් එහි ද කරුණාව මිශ්‍ර ය. අසරණයකු දුකින් මුදා ඔහුට සැනසිල්ලක් දීම පිණිස යම් ප්‍රමාණයක උත්සාහයක් යොදන්නේ නම් යොදන උත්සාහයේ පමණට කරුණාවේ ප්‍රමාණය තේරුම් ගත හැකි ය. ඇතැම් රටවල සීත කාලයේදී සතුන්ට කෑම සොයා ගැනීම අපහසු බව දන එම රටවල බොහෝ අය සතුන්ට කෑම සැපයීමේ නව මාර්ග යොදන බවට ආරංචි තිබේ. එය ද කරුණාව මිශ්‍ර ක්‍රියාවකි. පාර වැරදී මං මුළාවී සිටින කෙනකුට පාර සොයා ගැනීමට යම් උපකාරයක් කරයි නම් එය ද කරුණාවේ ලක්‍ෂණයකි. පුහුදුන් කමේ දෝෂය නිසා එවැනි ක්‍රියා දිගින් දිගට පවත්වා ගෙන යාමේ ශක්තිය නැති විය හැකි ය. ඊට හේතුව කෙලෙස් වේගවල බලපෑම යි. නමුත් යමෙක් කාරුණික ක්‍රියාවක් කිරීමට උත්සාහවත් වන්නේ නම් ඔහු සත්පුරුෂයෙකි. බෞද්ධකම වශයෙන් සැලකෙන්නේ ද සත්පුරුෂ ධර්ම ක්‍රියාවට දැමීමේ තත්ත්වයකි. එවැනි පැවතුම් බිඳක් හෝ නැති පුද්ගලයා බෞද්ධයකු වශයෙන් හැඳින්වීම අපරාධයක් වශයෙන් සැලකීම නිවැරැදි යයි සිතමු. ඊට හේතුව ඔහුගෙන් සමාජයට ලැබෙන ආදර්ශය අහිතකර වීම ය. කෙනකු ආගමක නමකින් පෙනී නො සිට හෝ මෛත්‍රී කරුණා ආදි ගුණවලින් යුක්ත ව ලෝකයාට උපකාර කරන්නේ නම් ඔහු සත්පුරුෂයකු වශයෙන් නොව බෞද්ධයකු වශයෙන් පිළිගැනීම ද නිවැරැදි ය.

අත්ථ කුසලය සකස් කරගත් තැනැත්තාගේ සිතේ කරුණාව මොන ම ලෙසකින් හෝ අඩු විය නො හැකි ය. කෙලෙස් නැතිකම එයට හේතුවයි. කෙලෙස් සහිත පුද්ගලයා කරුණා ස්වරූපයට අයත් හැඩයෙන් යමක් කරන්නේ වී නමුදු අවහිරයක් මතුවූ විට කලින් ගත් අදහස ඔවුන්ගෙන් වෙනස් වේ. එයට හේතුවන්නේ ද කෙලෙස්වල අවදි වීම ය. "මුදිතාව" යනු නො රුස්සන ගති සිතට නො එන අයුරින් නිමිත්ත සමග සිත පැවත්වීමේ

ශක්තියයි. ක්‍රියාවක යෙදීමේදී ඉදිරිපත් වෙන අවහිරකම් කිසිවක් නො පිළිගෙන තමා ගත් අදහස එලෙසින් ම ක්‍රියාවේ යෙදීම මුදිතාවේ ලක්‍ෂණයයි. කෙලෙස් සහමුලින් ඉවත් වී තිබෙන සිතකට අවහිර කම් වැද්ද නො දෙන බැවින් කරුණාව පවත්වා ගැනීමට අවශ්‍ය මුදිතා ස්වරූපය මතුවේ. පුහුදුන් සමාජයේ සිටින ඇතැමුන් තුළ යම් යම් ප්‍රමාණවලින් මෙම ධර්ම ස්වරූපයනට අනුව ක්‍රියා කිරීමේ සමත් කම නැතිවා නො වේ. යහපත් ක්‍රියාවක් කිරීමේදී පැමිණෙන සුළු සුළු අවහිර කම්වලට මුහුණ දී කටයුතු කළ හැකි වුව ද, අවහිරය බලවත් වන විට එය වෙනස් වන්නේ ය. එතරම් හෝ ශක්තියකින් ක්‍රියා කර ගැනීමට හැකි වන්නේ කෙලෙස් අඩු වී ඇති විටක ය. මෙත්තා-කරුණා-මුදිතා යන ධර්ම තුන සිතේ පවත්වා ගැනීමට උපකාර වන ධර්මය උපේක්‍ෂාවයි. "උපේක්‍ෂාව" යනු ලැබෙන සැප හා දුක් වින්දන පිළිබඳ ඇලීමක් හෝ ගැටීමක් නො වී විඳ ගැනීමේ ශක්තියයි. පුහුදුන් ගතිය රැඳී තිබෙන තාක් උපේක්‍ෂාව පවත්වා ගැනීම අපහසු ය. පුහුදුන් කමෙන් ඉවත් වූ බව තීරණය කළ හැක්කේ උපේක්‍ෂාව ක්‍රියා කිරීම අවදි වූ විට ය. මෙම ධර්ම සතර එසේ පත්වා ගෙන ක්‍රියා කිරීම "බ්‍රහ්ම විහරණය." යන ගරු නාමයෙන් හැඳින්වෙයි. සතර ඉරියව්ව ප්‍රධාන කොට ඇති සියළු හැසිරීම් මෙම බ්‍රහ්ම විහරණය මත සිදුවීම අර්හත් භාවයේ ලක්‍ෂණය යි. මෙසේ බ්‍රහ්ම විහරණයෙන් හෙවත් රහත් භාවයෙන් යුක්ත ව වාසය කිරීමේ තත්ත්වයට පත් වූ සිතක පවතින විශේෂ ලක්‍ෂණ ගොනුව පිළිබඳ විස්තරය අවසාන ගාථාවෙන් පෙන්වා දී තිබේ.

* * *

දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහිජාතු ගබ්භසෙය්‍යං පුනරේතී ති

වැරදි අවබෝධයට නො වැටී ධර්ම පිළිබඳ විස්තර දැකීමෙන් යුක්ත වී අරමුණුවල බැඳී පවත්වන ගතියෙන් මිදීමෙන් නැවත ගැබක පහළ වීම සිදු නො වන්නේ ය, යනු මෙහි අදහසයි.

# 11 වැනි පරිච්ඡේදය

මෛත්‍රා-කරුණා-මුදිතා-උපෙක්ඛා යන උසස් පෙළේ ධර්ම සතරක් සිතේ ගොනු කර රඳවා ගැනීම සඳහා ගත් ක්‍රියා මාර්ගය සූත්‍රයට අයත් මුල් ගාථාවේ සිට පිළිවෙළින් විස්තර විය. බ්‍රහ්ම සිත මතුවූයේ පුහුදුන් කමෙන් ඉවත් ව කෙලෙස්වලින් තොර වූ සිත් පරිහරණය කිරීමේ තත්ත්වයට පත් වීමෙන් ඇති වූ වෙනස නිසා බව පැහැදිලි ය.

## වැරදි අවබෝධයෙන් තොර ව (දිට්ඨිං ච අනුපගම්ම)

වැරදි දැකීම හරි දැකීම යනුවෙන් සම්මුතියෙන් තීරණය කර ඇති යම් ස්වරූපයක් තිබේ නම් ඒ එදිනෙද ජීවිත නඩත්තුවට උපකාර පිණිස පරිහරණයට ගන්නා දේ සම්බන්ධව ය. යමක් දෙස බැලීමේදී එහි නැති දෙයක් තිබෙන සැටියෙන් දර්ශනයට වැටේ නම් එම දර්ශනය වැරදි බව පිළිගත යුතු ය. ජීවිතයක් පාලනය කරමින් ක්‍රියා කරන යම් ධර්ම සමූහයක් වේ නම් ඒ ධර්මවල යථා තත්ත්වය පිළිබඳ ව ලබාගන්නා වූ නිවැරැදි වැටහීම හරි දැකීම යි. එම දර්ශනය ලබා ගැනීම පියවි ඇසින් කළ හැක්කක් නොව ප්‍රඥ ඇසින් කළ යුත්තකි.

## නිවැරදි දර්ශනයෙන් ඇතිවන හික්මීම (සීලවා දස්සනේන සම්පන්නො)

හරි දර්ශනයෙන් යුක්ත වී, ඊට අනුකූල ව ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාවල හික්මීම මතුකර ගැනීම සඳහා, බැලීම යොමු කළ යුතු කරුණු සතර සතිපට්ඨාන සූත්‍රයේ කාය-වේදනා-චිත්ත-ධම්ම යනුවෙන් දක්වා තිබේ. සිතේ සිදු වන ක්‍රියාව දෙස බැලීම කායානුපස්සනාව යි. සිතේ ක්‍රියා පදනම් කර ගෙන උපදින වේදනා ස්වරූප බලා හඳුනා ගැනීම වේදනානුපස්සනාව යි. එම වේදනා සිතෙන් පිළිගන්නා වූ ආකාර දැකීම චිත්තානුපස්සනාව යි. එම වේදනා සිතෙන් පිළිගන්නා තත්ත්වයන්ට අනුව සකස් වන ධර්ම ස්වරූපය දැකීම ධම්මානුපස්සනාව යි. මෙම කොටස් සතර දෙස විමසිල්ලෙන් බැලීම විදර්ශනාව නමින් හඳුන්වනු ලැබේ. බ්‍රහ්මවිහාරී තත්ත්වයට සිතක් පත් වන්නේ මෙම දර්ශනයේ යෙදී සිතේ මතුවන ධර්මවල පවතින අනිත්‍ය දුක්ඛ-අනාත්ම ලක්ෂණ දැකීමෙන් ලබන අවබෝධයට අනුව ය. එම වැටහීම සම්මාදිට්ඨි හෙවත් නිවැරදි අවබෝධය නම් වන්නේ ය. දිට්ඨිංච අනුපගම්ම යනු වැරදි දැකීමකට පත් නො වී සියළු සම්මුති පිළිගැනීම් අභිබවා යන පරමාර්ථය වූ ත්‍රි ලක්ෂණය වටහා ගැනීම සම්මා දිට්ඨිය මතුවීමේ අවස්ථාව යි.

පුහුදුන් සිත සැප අපේක්ෂාවෙන් පසුවන්නේ නමුදු සැපය ලබා ගැනීම සඳහා කළයුත්ත නො දනී. එසේ ම සැප ලැබීම සඳහා යොදන උත්සාහයන් සියල්ල අසාර්ථක වන බැවින් නැවත නැවත කුමක් හෝ කර සැපය ලබා ගැනීමට උත්සාහ වීම, ජීවිතය පැවැත්වීමේ ප්‍රධාන ක්‍රියාව වී තිබේ. මෙයට එක ම හේතුව ජීවිතය දුකට හෙළන ආකාරය නො පෙනීම ය. සැනසිල්ල ලැබීම සඳහා කරන ක්‍රියාවලින් නො සැනසිල්ලක් මතුකිරීමට හේතු වන්නේ සැනසීම මතුකළ හැකි අයුරින් නිමිත්ත සමග සිත යෙදිය යුතු ආකාරය නො දන්නා කම ය. එබැවින් එම ක්‍රමය සොයා ගැනීම සඳහා සිතේ ක්‍රියා දෙස බැලිය යුතු ය.

ජීවිත පීඩනයට හේතු වන කරුණු සෙවීම සඳහා සිත දෙස බැලීමේ කෘත්‍යයට යොමු වීමේදී එහිලා අවශ්‍ය වන අවබෝධය අවස්ථා දෙකකින් ලබාගත යුතු ය. ජීවත් වීම සැපවත් කර

ගැනීම සඳහා සිත පැවැත්විය යුතු ආකාරය දන ගැනීම එක් අවස්ථාවකි. "සමථ භාවනාව" යනු එම ක්‍රමය යි. එයින් ලැබිය හැක්කේ සදකාලික සැනසිල්ලක් නො වේ. එයින් ලබන සැනසිල්ල ජීවිතයාගේ අවසානය තෙක් විඳ, අනතුරු ව ලබන භවය ද උසස් ජීවිත මට්ටමකින් ලබා ගැනීමට හැකි ය. එහෙත් එහි ජාති-ජරා-මරණ-ව්‍යාධි-ශෝක-පරිදෙව-දුක්-දෙම්නස් ආදියෙන් සදකාලික ව මිදුණු තත්ත්වයක් නැත. සදකාලික සැනසිල්ල ලැබීම සඳහා සිත මෙහෙය විය යුතු ආකාරය දකීම තවත් අවස්ථාවකි. "විදර්ශනා භාවනාව" යනු එම ක්‍රමයයි. මෙම කොටස් දෙක අතුරින් සමථයට අයත් කොටස සම්පූර්ණ වන තුරු විදර්ශනාවට යොමු වීමට හැකියාවක් නැත. එයින් පෙන්වන්නේ විදර්ශනාවට ගැලපෙන තත්ත්වයට සිත සන්සුන් වන තුරු ජීවිතය පිළිබඳ සත්‍ය දක ගැනීම සඳහා සිහිය යොමු කිරීමෙන් වැඩක් නො වන බව යි. ලබාගන්නා වූ සැපය පවත්වා ගැනීමේ ඕනෑකම කා තුළත් තිබේ. එහෙත් එසේ කරගත හැකි තත්ත්වයක් තිබේ ද යන්න සෙවිය යුත්තකි. එම සෙවීම විදර්ශනාවයි. සතිපට්ඨාන සූත්‍රයේ පෙන්වන නිමිති සතර අතුරින් සිතේ ක්‍රියාව, එම ක්‍රියාවෙන් මතුකරන වේදනාව, එම වේදනාව අල්ලා සිත ක්‍රියා කරන ස්වරූපය යන කොටස් තුන දකීමේ ප්‍රගුණත්ත්වය මතුවන විට සිතේ සැනසිල්ල හා නො සැනසිල්ල සකස් කරන ධර්ම ස්වරූප සකස් වන සැටි දකගත හැකි ය.

විදර්ශනාවට ගැලපෙන චිත්ත ස්වරූපය සකස් වන්නේ අවස්ථා දෙකකිනි. සමාධියට සිත පත්කර ගැනීම හා ඉන්පසු එම සිත ධ්‍යානයට පත්කර ගැනීම එම අවස්ථා දෙක යි. මෙම අවස්ථා දෙක අතරින් පළමුවෙන් සිත සමාධියට පත්කර දෙවනුව ධ්‍යාන ස්වරූපය මතුකර ගත යුතු ය. "සමාධිය" නමින් හඳුන්වන්නේ සිතේ ලෝභ-දෝස-මෝහ යන කෙලෙස් යටපත් වී සන්සුන් ලෙසින් සිත නිමිති සමග ඇසුරට පත් කිරීමට ඇති හැකියාව ය. "ධ්‍යානය" යනු සිත අරමුණේ එකඟ වීම යි. සිත නො සන්සුන් බවට පත් වීම සඳහා මුල් වන්නේ අභිජ්ඣා-දෝමනස්ස යන ධර්ම කොටස් දෙක ය. නිමිත්තක් සමග සිත ක්‍රියා කිරීමේදී නිමිත්ත සමග සිත ඇලීම "අභිජ්ඣා" යනු වෙත් ද, එම ඇලීම හේතු කොට ගෙන උපදින දවන ස්වරූපය දෝමනස්ස

යනුවෙන් ද තේරුම් ගත යුතු ය. අභිජ්ඣා යනු ඇලීමේ ක්‍රියාවයි. ඊට අයත් ක්‍රියා ස්වරූප කීපයකි. එම අවස්ථා නම් කාම-තණ්හා-රති-රාග- ලෝභ හා මච්ඡරියයි. නිමිත්තේ ඇලෙන ශක්තිය සිතේ තැන්පත් වී තිබීම "කාමයයි". නිමිත්ත දෙසට සිත ඇදී යාම හෝ යොමු වීම "තණ්හා." නම් වේ. එම ඇදී යාමෙන් හෝ යොමු වීමෙන් හෝ නිමිත්තේ සිත රැඳවීම "රති" නම් වේ. එසේ රැඳී ඇලීම නැවත නැවත ක්‍රියාත්මක වීම හෙවත් නිමිත්තෙහි ම සිත ඉවත් නො වී පැවැත්ම "රාග" යයි. නිමිත්ත හා නිමිත්තෙන් ලැබෙන රසය ලබා ගැනීමට ඇති වුවමනාව "ලෝභය" වේ. ලබාගත් දෙය අන්සතු නො වී තබා ගැනීමේ අදහස "මච්ඡරිය" නම් වේ.

දොමනස්ස යනු ඉහත කී විවිධ ස්වරූපයන්ගෙන් යුක්තව උපදවන අභිජ්ඣාව නිසා සිතේ මතුවන දහයයි. අභිජ්ඣාවට හෙවත් ඇලීම්වලට පටහැනි ව මතුවන පටිඝය ඇති වන්නේ නිමිත්ත සමග ඇලීමේදී දහය වැඩි කරවන හේතු මතුවන නිසා ය. මෙම ස්වරූපයේ ද විවිධ අවස්ථා තිබේ. ව්‍යාපාද-ද්වේෂ-ක්‍රෝධ හා වෛර වශයෙන් එම අවස්ථා දක්වේ. නිමිත්තක උපකාරයෙන් ද්වේෂය මතුකළ හැකි ශක්තිය සිතේ තැන්පත් ව තිබීම "ව්‍යාපාද" යයි. එම ව්‍යාපාද ගතිය මතුවීම "ද්වේෂ" යයි. යම් නිමිත්තක මතුවන හෝ පවතින හෝ තමා අකමැති ස්වරූපවලට අනුව විවිධ ආකාරවලින් යුක්ත වී ද්වේෂය දියුණු වීම "ක්‍රෝධය" වේ. ද්වේෂය මතුවීමට හේතු වූ නිමිත්ත මතක් වන හැම විට ම ද්වේෂය සිතේ මතුවී ඒම "වෛර" යයි.

සමාධි සිත සකස් වන්නේ ලෝභ-ද්වේෂ හා මෝහ යන ධර්ම තුන සිතේ යටපත් වූ විට ය. නිශ්චල තත්ත්වයෙන් සිත පවතින බැවින් "සමාධිය" නමින් ද, සිත යහපත් අරමුණේ පවත්වන බැවින් "කුසල් සිත" නමින් ද, පිනවීම මතුකරන බැවින් "පින්සිත" නමින් ද හැඳින්වේ. බුදු දහම හේතු ඵල පෙන්වන න්‍යාය මත ගොඩනැගුණු දර්ශනයකි. බුදුපියාණන් වහන්සේ විසින් පෙන්වා දී ඇත්තේ සිතෙන් නිමිත්ත ඇල්ලීමේ ප්‍රමාණයට අනුව, යම් රත්වීම් ස්වරූපයක් මතු කරන බැවින් පළමු කොට තමාට ඉවසිය නො හැකි මට්ටමේ රත්වීම ඉවත් කිරීමේ කොටස

සම්පූර්ණ කර ගැනීම කළ යුතු බව ය. ඉවසීමේ අපහසුකම් ලබාදෙන සිතිවිලි සකස් කිරීමේ ප්‍රධාන ස්වරූප දෙක ලෝභය හා ද්වේෂය වේ. එම ධර්ම සිතේ යටපත් වූ අවස්ථාවේ පවතින සිත කුසල නමින් හැඳින්වේ. එම සිතෙහි මතුවන්නේ පිනවන ගතියයි. මෙම තත්ත්වයට පත් වූ සිත හඳුන්වන්නේ සමාධි සිත නමිනි. නිවැරැදි මගට නො වැටී නොයෙක් නිමිති උපයෝගී කරගෙන මෙම පිනවීම ලබා ගැනීමට උත්සාහ දරූ සෑම අවස්ථාවක ම අදහසේ පරිදි පිනවීමේ සම්පූර්ණත්වයක් ලැබීමට ඉඩක් ලැබී නැත. සුළුවෙන් හෝ යම් පිනවීමක් මතුවී නම් එය පවත්වා ගැනීමේ ක්‍රමය ගැන දැනීමක් ද නො තිබිණ. එයට හේතුවක් තිබේ. යමක් ලැබීම සඳහා යොමු වීමේ හේතුව සකස් වීම "ලෝභය" නම් වේ. එය ධනය, ගෞරවය හෝ වෙනත් දෙයක් හෝ සඳහා ද විය හැකි ය.

බලාපොරොත්තුව ඉටුවීමේදී යම් සතුටක් මතුවීම සිතේ උපන් ක්ලේශය තාවකාලිකව හෝ යටපත් වීමෙන් සිදු වන්නකි. එහෙත් එය පවත්වා ගැනීමේ හැකියාව නැති වන්නේ නැවත බලාපොරොත්තුවක් එම නිමිත්ත හෝ වෙන යම් කරුණක් හෝ පිළිබඳ ව ඇතිකර ගැනීමේ වරදිනි. මෙම සිද්ධිය පිළිබඳ වැටහීමක් නැතිකමේ වරදින් සැප ලැබීම සඳහා හැකි පමණ අළුත්දේ සෙවීමේ කෘත්‍යයට මිනිසා පෙළඹී සිටී. එහෙත් මෙම රහස මැනවින් තේරුම්ගත් විට බාහිර කිසිවක ආධාරයක් නැති ව සිතේ සැපය මතුකර ගැනීමට හැකි ය. එනම් ලෝභ-ද්වේෂවලින් සිත මුදවාගෙන නිමිති ඇසුරු කිරීම ය. එම හුරුව දියුණු කර ගත් විට තමා වෙත එළඹෙන කුමන තාලයේ නිමිත්තක් සමග හෝ සිත සැපෙන් තබා ගැනීමේ භාග්‍යවන්ත කම උද වන්නේ ය. මෙම කාරණය සපුරා ගැනීමෙහි ලා යොදන ක්‍රියා මාර්ගය සමථ භාවනාව වශයෙන් සලකනු ලැබේ. සිත සමථයට පත් වී සංසුන් වීමෙන් දැක්වෙන්නේ අලෝභ-අදෝස-අමෝහ යන ධර්ම තුන සිතේ පවතින බව ය. සිත සමාධියට පත් වූ අවස්ථාවක් වේ නම් එම අවස්ථාවේ සිතේ පවතින්නේ කුසල් ස්වරූපයකි.

වැඩි දෙනකු කුසලයක් කර ගැනීම සඳහා සුදුසු අවස්ථාව හා අවශ්‍ය මිලමුදල් සොයමින් ළතවෙන අවස්ථා තිබේ. එසේ

ළතවන්නේ කුසල් කර ගැනීමේ ක්‍රමය ඔවුන් නො දන්නා කමිනි. එහෙත් මෙහි දක්වා ඇති ක්‍රමයට අනුව සෑම අවස්ථාවක ම කුසල් කරමින් දවස ගෙවිය හැකි බව පැහැදිලි ය. තමාට හමු වන නිමිත්ත කුමක් හෝ වේවා එයින් යමක් ලබා ගැනීමේ ලෝභ සිතක් හෝ එහි තමාට නො ගැලපෙන ස්වරූප ප්‍රතික්ෂේප කිරීමේ ද්වේෂ සිතක් හෝ මතු නො කරමින් නිමිත්ත ඇසුරු කරන්නේ නම් එම අවස්ථාවේ සිදුවන්නේ කුසල් ය. එබැවින් කුසල් කිරීමට මුදල් අවශ්‍ය නො වන බව පැහැදිලි ය. ලෝභ-දෝස රහිත ව සිත පවතින තාක් එම සිතේ සමාධිය තිබේ. මෙසේ නිරන්තර ව පැවැත්විය හැකි සමාධිය ඇතිකර ගත් පුද්ගලයාගේ දර්ශනයේ නිවැරැදි කම තිබේ. එනම් ලෝභ-ද්වේෂ යන ධර්මවලින් සිත මුදවා ගැනීම සැපයට හේතු වන බව වැටහීම ය. කරදර පීඩා ආදියෙන් මිදී සැපවත් ව දිවිපෙවත ගෙනයාමේ භාග්‍යය මෙම හුරුව පරිහරණය කරන්නාට හිමි ය.

සැපයෙන් ජීවත් විය හැකි තත්ත්වයක් එහි ඇත්තේ වී නමුදු ජරා මරණ-ව්‍යාධි-සෝක පරිදේවාදි හිම්කම් එම සිතේ නැති වී නැත. ඒවායින් බේරී සදකාලික ව දුකින් මිදීමේ අවශ්‍යතාව යමකුගේ සිතේ මතුවන්නේ නම් එම දුක් ස්වරූප ජීවිතය සමග බඳවා තබන හේතු දකීමේ පැත්තට සිත යොමු කළ යුතු ය. මෙම ක්‍රියාවට බැසීම ජීවිතය තුළ සැඟවී තිබෙන රහස් සෙවීම සඳහා විශේෂයෙන් යොමු වීමක් බැවින් එය විදර්ශනාව නමින් හැඳින්වේ. සමථ භාවනාවෙන් සිදු වූයේ බාහිර ලෝකය සමග බැඳී විවිධ ආකාරවල පීඩන ලබාගන්නා ධර්මවලින් යුක්ත ව ක්‍රියා කළ සිත, ඒවායින් මුද ගැනීම ය. විදර්ශනාවේ යෙදෙන්නාගේ බලාපොරොත්තුව විය යුත්තේ අභ්‍යන්තරයේ ක්‍රියා කරන ධර්ම ස්වරූප සමග සිත බැඳෙමින් සංසාරික අයිතිය ලබාදීම සඳහා ක්‍රියා කරන ධර්ම දක ඒවා ක්‍රියා කරන ආකාර තේරුම් ගෙන මිදීමේ නිවැරදි මගට වැටීම ය. ඒ පිළිබඳ වැටහීම මැනවින් ලැබෙන විට ජරා මරණාදී සංසාරික දුක් සියල්ල නවතා සදකාලික සැනසිල්ල සාද ගත හැකි වන්නේ ය. මෙම දර්ශනය ලබා ගැනීම සඳහා සිතේ බලවත් නිශ්චලත්වයක් අවශ්‍ය බැවින් සමාධියෙන් ඇති කරන සංසුන් ස්වරූපය ප්‍රමාණවත් නො වේ. එහෙයින් වැඩි සංසුන් කමක් මතුකර දෙන ධ්‍යාන තත්ත්වයට සිත පත්

විය යුතු ය. සිත ධ්‍යානයට පත් වීමෙන් මතුකරන විශේෂය නම් විවිධ නිමිති කෙරෙහි යොමු වීමේ ක්‍රියා සියල්ල නැවතී කුසලාරම්මණයේ සිත නො සෙල්වී පවතින තත්ත්වය ශක්ති සම්පන්න වීම ය. එය සිදු වන්නේ බාහිර නිමිතිවල සම්බන්ධය ලබාගන්නා වූ ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරීත්ත්වය නැවතීම නිසා ය.

එතැන් සිට අභ්‍යන්තර ඉන්ද්‍රියය වන මනින්ද්‍රිය හෙවත් මොළය සම්බන්ධ කරගෙන සිත් ක්‍රියා කිරීම බලවත් වීම මෙහිදී සිදු වන විශේෂයයි. මේ ධ්‍යානයට පත් වූ අවස්ථාවයි. මෙම තත්ත්වයට සිත පත්වූ කල්හි සිතෙහි පවතින ස්වභාවික ක්‍රියා ස්වරූප දක ගැනීමට අවශ්‍ය වන නිශ්චලත්ත්වය මතුවේ. මෙහි අවස්ථා සතරකි. එම අවස්ථා නම් කෙරෙන්නේ ප්‍රථම ධ්‍යානය- දුතිය ධ්‍යානය-තෘතිය ධ්‍යානය හා චතුර්ථ ධ්‍යානය යනුවෙනි. සිතේ පවතින සියුම් ස්වරූප දන ගැනීමේ චිත්ත මට්ටම පවතින්නේ සතර වෙනි ධ්‍යාන අවස්ථාවේදී ය. එයින් ඔබ්බට සිත දියුණු කරන පුද්ගලයාට ලැබෙන්නේ අරූප ධ්‍යාන නමින් හඳුන්වන සිතේ සිදු වන ක්‍රියාව පැහැදිලි ව නො පෙනෙන හිස් කමකින් යුක්ත තත්ත්වයකි. එම තත්ත්වයට සිත පත් වූ විට සිතේ පවතින විවිධ ස්වරූප දකීමේ හැකියාව නො ලැබේ. රුප්පණය හෙවත් වෙනස පෙන්වන රූපාවචර ධ්‍යානවලදී විනා, රුප්පණය දකීමට ප්‍රමාණවත් නො වෙන මට්ටම වූ අරූපාවචර ධ්‍යානය පාදක කරගෙන විදර්ශනා වැඩීමේ හැකියාව නැත. එබැවින් විදර්ශනාවට පාදක කර ගන්නේ රූපාවචර ධ්‍යාන මට්ටම් සතරෙන් කුමක් හෝ තමාට අවශ්‍ය වන දර්ශනය ලබා ගැනීමට උපකාර වන ධ්‍යානය යි. මෙහිදී ප්‍රකාශ වූ රූපාවචර යන වචනයෙන් හඳුන්වන්නේ සිතේ ඇතිවන වෙනස දකිය හැකි ආකාරයෙන් හැසිරෙන පවතින සිත් ස්වරූපය යි. අරූපාවචර යනුවෙන් හඳුන්වන්නේ සිතේ ඇතිවන වෙනස දකීමට අපහසු වන තරමට සිතේ නිශ්චලත්ත්වය සකස් වී ඇති චිත්ත මට්ටමකි.

රූපාවචර ධ්‍යාන සතර අතුරින් කුමක් හෝ තමාගේ දර්ශනයට උපකාර වන ධ්‍යානය තෝරා ගැනීම "නෙපක්ක ප්‍රඥවේ" එක් කෘත්‍යයකි. අවස්ථාවට උචිත තීරණ ගැනීම නෙපක්ක ප්‍රඥවේ ලක්ෂණයයි. ධ්‍යාන සිත විදර්ශනාවට යොද ගැනීම,

විද්‍යාඥයකු රසායන ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීමට අන්වීක්ෂයකින් බැලීමේදී එහි නො පෙනෙන සියුම් කොටස් බැලීම සඳහා ඊට ගැලපෙන කාචය හෙවත් ලෙන්සය යොද ගැනීම වැනිය යි තේරුම් ගත යුතු ය. නො පෙනෙන සියුම් කොටස් බලා ගැනීමට කාචය (ලෙන්සය) වෙනස් කර බලන්නාක් මෙන් සිතේ සිදු වන ක්‍රියා ස්වරූපයන්ගේ විවිධ අවස්ථා තේරුම් ගැනීමට ධ්‍යාන සිත ප්‍රයෝජනයට ගැනීම යෝගාවචරයා සතු ය. අරූපාවචර ධ්‍යාන විදර්ශනාවට යොද නො ගන්නේ සිතේ ක්‍රියා කරන ධර්ම ස්වරූපවල විවිධත්වය තේරුම් ගැනීමට, එම සිතේ පවතින සියුම් කම නිසා අපහසු බැවිනි. මෙසේ ධ්‍යානය පාදක කරගෙන සිත විදර්ශනාවට යොමු වීමේදී කෙලෙස් යටපත් වීමේ හේතුවෙන් සිතේ සංසුන් කම හා පිනවීම මතු වන බව මොහු දකී. එය තාවකාලික සංසුන් කමකි. ධ්‍යානය පාදක කරගෙන විදර්ශනාවේ යෙදෙන්නාට දර්ශනය වන සෑම චිත්ත රැල්ලක ම මතුවන සැප සහගත වින්දන දෙවරක් විඳීමට නො ලැබෙන බව වැටහේ. සිතෙන් මතුවන වින්දන පිළිබඳ සිත සරාග, සදෝස ආදියෙන් තොර ව ක්‍රියා කිරීමේ ප්‍රමාණයට සැපයේ පැහැපත් භාවය මතුවන බව මොහුට අවබෝධ වන්නේ ය.

මෙම වැටහීම තුළින් මතුවන්නේ අපේක්ෂාව පදනම් කරගෙන නිමිත්ත ඇසුරු කිරීම, සැපය ගිලිහී යාමට හේතුවන බව ය. මෙය විමසිල්ලෙන් සිත දෙස බැලීමේ ප්‍රතිඵලයකි. මෙම තීරණය නිවැරැදි ය. එබැවින් එය ප්‍රඥවයි. මෙම දර්ශනයේදී උපකාර වන කොටස් පහකින් යුත් දර්ශන මාර්ගය බුදු පියාණන් වහන්සේ ධම්මචක්ක සූත්‍රයේදී ම පෙන්වා දුන් හ. එහි පිලිවෙළ මෙසේ ය. චක්ඛුං උදපාදි-ඤාණං උදපාදි-පඤ්ඤා උදපාදි-විජ්ජා උදපාදි-ආලෝකෝ උදපාදි-යනු කොටස් පහ ය. චක්ඛුං උදපාදි යනු දර්ශනයේ පැහැදිලි කම මතුවීම ය. ඤාණං උදපාදි යනු දර්ශනයට අසුවන කරුණුවල පවතින අර්ථ අනර්ථ දෙක පැහැදිලි බව ය. පඤ්ඤා උදපාදි යනු තෝරා ගන්නා ලද අර්ථ අනර්ථ දෙක පිළිබඳ ව ගත යුතු නිවැරැදි තීරණ ගැනීමේ ශක්තිය මතුවීම ය. විජ්ජා උදපාදි යනු ගත් තීරණයට අනුව අදහස් කරන අර්ථය මතුවන අයුරින් සිත මෙහෙයවීමේ නිවැරැදි ක්‍රියා මාර්ගයට වැටීම ය. ආලොකෝ උදපාදි යනු නිවැරැදි ක්‍රියා මාර්ගය සම්පූර්ණ

වීමෙන් ලැබෙන ප්‍රතිඵලයේ පැහැපත් කම ය. විදර්ශනාවේ යෙදෙන කාහටත් මෙම ක්‍රියා මාර්ගය ප්‍රයෝජනයට ගැනීමට සිදු වේ. මෙම කරුණු පස එක්වී පැහැදිලි වන දර්ශනයේ උපකාරය, ජීවිතය යොදවා සිදු වූ ක්‍රියා පිළිබඳ වැරදි මත බිඳී යාමට අවශ්‍ය කරුණු මතු කරන්නේ ය. සක්කාය දිට්ඨිය නමැති සංයෝජනය බිඳ ගන්නේ එම උපකාරය පදනම් කර ගෙන ය.

ජීවිතය ක්‍රියා ගොඩකි. ජීවත් වීම යනු ක්‍රියා ගොඩ රඳවා ගැනීම ය. එක් මොහොතක් හෝ ක්‍රියාවෙන් තොර අවස්ථාවක් ජීවිතය තුළ නැත. රුධිර ධාවනය වැනි අභ්‍යන්තරික ක්‍රියා නො නැවතී සිදු වේ. සිතට නික්ලේශී කම එක්වෙන විට පිනවීම මතුවන බවත්, කෙලෙස් එක් වූ විට පීඩා සහිත තත්ත්වයක් උදවන බවත් විදර්ශනාවෙන් ලබන මූලික අවබෝධය වේ. ක්‍රියා පිලිබඳ ව තිබෙන වැරදි වැටහීම නම් වන සක්කාය දිට්ඨිය දස සංයෝජනයන්ගෙන් පළමු වැන්න ය. සංයෝජනය යනු නො සැනසිල්ලට හා භව සම්බන්ධයට හේතු වන කරුණු සිතේ නැවත නැවත යෙදී ක්‍රියා කරමින් පවත්වා ගෙන යාමේ ශක්තියයි. සිතෙන් සිදු වන ක්‍රියා පිළිබඳ නිවැරැදි අවබෝධය හා තීරණය තහවුරු වන විට කලින් තිබූ අහිතකර වැරදි අවබෝධය මැකී යනවා ඇත. ඔහු එතැන් සිට නිමිත්තේ ඇසුර ලබන්නේ සිත පහළ වීමට උපකාරයක් වශයෙන් පමණි. සැප ලැබීම සඳහා නිමිත්ත ඇසුරු කිරීමේ අවශ්‍යතාවයක් මොහුට නැත. කුමන නිමිත්තක් හෝ ඇසුරෙන් සැපය් මතුකර ගන්නේ සැප තත්ත්වයෙන් සිත පවත්වන සැටි මොහු දන්නා බැවිනි.

මෙම තත්ත්වයට සිත පත් වූ විට ඔහු තුළ තිබූ සියළු සැක දුරු විය යුතු ය. අප ජීවිතය පරිහරණය කරන්නේ සැක පදනමක් මත සිටගෙන ය. නිතර ම සැනසිල්ලක් සොයා ඉදිරිපත් වන සිත නිමිත්තක ඇසුර ලබන්නේ එයින් සැපයක්-සැනසිල්ලක් ලබාගත හැකි ය යන ස්ථිර තීරණය ඇතිව නො වේ. සැනසිල්ල පිළිබඳ අනිස්ථිර හැඟීමකින් යුක්තව නිමිත්ත ඇසුරු කිරීමට අපට සිදු වී ඇත. ලැබෙන වින්දනයේ තත්ත්වය තේරුම්ගත හැක්කේ නිමිත්ත සමග සිත ඇසුරු කිරීම ඇරඹුවායින් පසුව ය. නිවැරැදි අවබෝධය ලබාගත් තැනැත්තා සැප ලැබීම සඳහා

නිමිත්ත ඇසුරු කළ යුතු ක්‍රමය දන්නා බැවින් සැනසීම පිළිබඳව තමාට කිසි ම සැකයක් නැති ව ඕනෑ ම නිමිත්තක් සැපයෙන් ඇසුරු කළ හැකි කම ඔහු තුළ තිබේ. එබැවින් ඔහුගේ සිතේ සැනසිල්ල ලැබීම පිළිබඳ ව සැකයක් පහළ වීමට කිසිදු ඉඩක් නැත. මෙහි සිදු වී ඇත්තේ විචිකිච්ඡා සංයෝජනය කැඩීමයි. මෙසේ සැකයෙන් තොර ව ජීවිතය පරිහරණය කිරීමේ අයිතිය ලැබූ නිසා සැනසිල්ල ලැබීම සඳහා උපයෝගී කරගත් සියළු වැරදි ක්‍රම මොහුගෙන් ඉවත් වේ. බැලීමෙන් සැප ලැබීම, ඇසීමෙන් සැප ලැබීම ආදි වැරදි ක්‍රම අනුගමනය කරමින් සැපය සෙවීමේ උපක්‍රම යොදා ඒවාට අනුව හික්මීමේ උත්සාහය යෙදීම සීලබ්බතපරාමාස සංයෝජනය නමින් හැඳින්වේ. මෙම සංයෝජනය ද මෙම සිතෙන් දුන් ඉවත් වී ඇත. මෙම තත්ත්වයට පත් වීම නිසා සතර අපායට අයත් දුක් විඳීමේ අයිතිය ලබා දෙන ලෝභ-දෝස-මෝහ නැවත මොහුගේ සිතට නො ලැබේ. මොහු සෝවාන් තත්ත්වයට පත් වූවෙකි.

සෝවාන් ඵලය මතුකර ගත්තාවූ ද, ජීවිතය තුළ සිදු වන සිදුවීම්වල හිතකර හා අහිතකර ධර්ම පිළිබඳ දර්ශනය ලබා ගත්තාවූ ද, නො නැසෙන සැප අයිතියක් එම තැනැත්තාට ලැබී තිබේ. මෙම දර්ශනය ලැබීම සඳහා දක්ෂ කම සකස් කරන පුද්ගලයාගේ සිතේ ධර්ම ස්වරූප සකස් වන ආකාරයේ දියුණුව පිළිබඳ විස්තරය මෙම සූත්‍ර විග්‍රහය ආරම්භයේ සිට පැහැදිලි කෙළෙමු. එම ධර්ම ස්වරූප ක්‍රමයෙන් දියුණු වී ස්ථිර තත්ත්වයට පත් වෙන අවස්ථාව සෝවාන් ඵලය ලැබීමේ අයිතිය බව පැහැදිලි විය. දස්සනේන සම්පන්නො යනුවෙන් දක්වා තිබෙන්නේ මෙම තත්ත්වයට සිත පත් කර ගැනීම සඳහා උපකාර වන දැකීම්වලින් යුක්ත වීම ය. එසේ සැනසිලි මගට වැටුණු සිත නැවත දුකට පත් වීමට අවස්ථාවක් නො ලබයි. සෝතාපත්ති ඵලයේ පවතින දියුණුව නැවත දර්ශනයට යොමු වී දියුණු තත්ත්වය උද කර ගැනීම සඳහා ක්‍රියාත්මක වෙයි. එය සකෘදගාමී මාර්ගයට පත් වීමේ අවස්ථාව ය.

එතැන් සිට ඔහුගේ දියුණුවේ මාර්ගය කලින් තරම් අපහසු තත්ත්වයකට පත් නො වේ. එම පහසුව ලැබීමට උපකාර වන හේතුව මොහු සෝවාන් ඵලයේදී ලබා ඇත. සෝවාන් තත්ත්වයට

පත්වීමට මත්තෙන් මොහු කෙලෙස්වලින් පිරී ඉතිරී තිබූ සිතක් පරිහරණය කළ කෙනෙකි. එම කෙලෙස් අනාදිමත් කාලයක් මුළුල්ලේ සිතේ රැඳී ආ ශක්තීන් ය. එබැවින් එම ශක්තීන් කැඩීමට දැඩි උත්සාහයක් යෙදිය යුතු ය. ඒ නිසා සෝවාන් මාර්ගයට අයත් ක්‍රියා සමූහය ඉතිරි මාර්ග අවස්ථාවනට අයත් ක්‍රියා සමූහයනට වඩා අපහසු ය. සත්ව සන්තානයේ කෙලෙස් තැන්පත් කරවන මූල ධර්ම ස්වරූපය කාමච්ඡන්දය වේ. කාම යනු යමක් කෙරෙහි ඇදී යන සිතේ මූල ශක්ති ස්වරූපයයි. ඡන්ද යනුවෙන් හඳුන්වන්නේ සිතේ කැමැත්ත මතුකරන්නා වූ නිමිති තෝරා ගැනීම ය. මේ සියල්ල තැන්පත් කරගන්නා අයිතිය මනොධාතුව හෙවත් මොළය සතු ය. මනොධාතුවේ මෙම තැන්පත් කිරීමේ කාර්යය කෙරෙන සැටි යාවතස්ස විගතමිද්ධො යන කොටස විස්තර කිරීමේදී පැහැදිළි කළෙමු. වර්ණය-හැඩය-සුවඳ-රසය ආදිය චලන රිද්මයක උපකාරයෙන් මනොධාතුවේ සටහන් වන එම ස්වරූපයන් නිසා නැවත එ වැනි දෙයක් ඉන්ද්‍රියකට ගෝචර වූ විට එයට අයත් මනොධාතුවේ සටහන් ක්‍රියාත්මක වේ. ඒ හේතුවෙන් නිමිත්ත කෙරෙහි ආසාවෙන් ඇදී යන කාම ස්වරූපයේ සිත් පහළ වේ. මේ ආකාරයෙන් සිත ක්‍රියා කරවන නිමිති යම් ප්‍රමාණයක් වෙන්කර ගෙන තිබේ ද එම වෙන් කරගෙන තිබීම හඳුන්වන්නේ කාමච්ඡන්ද නමිනි.

මෙය පැහැදිලි කර ගැනීම සඳහා උදහරණයක් ඉදිරිපත් කරමු. කිසි කලෙකත් අඹ ගෙඩියක් නුදුටු නො දත් පුද්ගලයකුට එහි රසය ගැන තේරුමක් නැත. ඔහුට රසවත් අඹයක් හමු වුව හොත් එය නො හඳුනන බැවින් අඹරස පිළිබඳ මොන ම අපේක්ෂාවක් හෝ මතු නො වේ. එය හා සම්බන්ධ කිසිදු හැඳිනීමක් නැති කම එයට හේතුව ය. කෙනකු විසින් කළ හැඳින්වීමක් නිසා ඔහු අඹයේ රස බැලූ විට එහි ඇති රසය දැනී එය පිළිබඳ ව ඇලීම ඇති වේ. අඹයේ පවතින සුවඳ පිළිබඳව ද ඇලීම ඇති වේ. මෙම කරුණු ගැන සිත එක්වී ඇලීමේ දියුණුව වැඩි වන පමණට ගෙඩියේ හැඩය හා වර්ණය ආදි කොටස් පිළිබඳ ප්‍රමාණ මනොධාතුවේ හෙවත් මොළයේ සටහන් වන්නේ ය. ධාරණය වන්නේ ය. ගෙඩියේ හැඩ වර්ණ ආදිය ධාරණයට ගත්තේ එය පහසුවෙන් නැවත අවස්ථාවක හඳුනා

ගැනීමට උපකාරයක් වශයෙනි. මෙහි ඇලීම පැති දෙකකි. අඹ ගෙඩියේ වර්ණය හා ප්‍රමාණය පිළිබඳ ඇලීම ද, රසය හා සුවඳ පිළිබඳ ඇලීම ද, යනු එම පැති දෙක ය. මෙහි ඉදිරිපත් කළ අඹ ගෙඩිය හඳුනා ගැනීම සඳහා වෙන් වූ කොටස් වස්තුකාම යනුවෙන් ද, එහි රසය හා සුවඳ ලබා ගැනීම සඳහා සකස් වූ කොටස ක්ලේශ කාම යනුවෙන් ද හඳුන්වනු ලැබේ. වස්තුකාම යනු යම් වස්තුවක් සමග පවතින ඇලීම් ස්වභාවයයි. ක්ලේශකාම යනු එම වස්තුවෙන් ලැබිය හැකි රසය පිළිබඳ ඇලීම් ස්වභාවය යි. අඹයට අයත් වර්ණය හා හැඩය පිළිබඳ ව ඇලීම මතුවන්නේ එහි පවතින රසය බැලීම සඳහා පවතින ඇලීම නිසා ය. අඹයේ උපමාව අනුව කාමච්ඡන්දය පැහැදිලි කිරීමේදී, අඹය ප්‍රයෝජනයට ගෙන එහි ඇති වර්ණ-ගන්ධ-රස ඇලීමෙන් යුක්ත ව භුක්ති විඳීම හේතු කොට ගෙන ඇති වූ ධාරණය කාමච්ඡන්දය බව තේරුම් කෙළෙමු. මේ ආකාරයෙන් කාමච්ඡන්දය සෑදී ඇති නිමිති අනන්ත ය. එම අනන්ත නිමිති සමස්තයක් වශයෙන් ගත් කල රූප-ශබ්ද-ගන්ධ -රස -ස්පර්ශ වශයෙන් බෙදේ. ඒවා පිළිබඳ ව පවතින කැමැත්ත කාමච්ඡන්දය යි.

කාමච්ඡන්දය විස්තර කළ අයුරින් ම ව්‍යාපාදය ද විස්තර කළ යුතු ව තිබේ. ඉහත ඉදිරිපත් කළ අඹයේ උපමාව ගනිමු. අඹය කැමේදී එහි ඇඹුල් ගතිය වී නම් එම ඇඹුල ඔහු මනාප වන රසය නො වේ යයි සිතමු. මනාප වින්දනය නො ලැබීම අමනාපයට හේතුව යි. එම අමනාපය විරුද්ධත්වය මතුවීමට හේතුයි. මෙම් චිත්ත ස්වරූපය ක්‍රියා කිරීමේදී එයට අනුව සිදුවන මොළයේ ස්නායු ක්‍රියාකාරීත්වය මෙම සටහන ධාරණය කරයි. මොළයේ ස්නායු ක්‍රියා කාරීත්වය ඇතුළත, දතකට අයත් ස්නායුවක් අඩු වුව හොත්, දත් හිරිවැටීම සිදු වේ. අමනාපය වර්ධනය වී පසුව එවැනි අඹ දකින විට පවා දත් හිරිවැටීම සිදු වේ. මෙසේ අඹයක් දකිනා විට කලින් අඹයෙන් සටහන් වූ ස්නායු පද්ධතිය ක්‍රියාවට වැටීම නිසා ඇති වන අඹය නමැති නිමිත්ත පිළිබඳව උපදින අකැමැත්ත ඉපදවිය හැකි ශක්තිය තැන්පත් ව තිබීම ව්‍යාපාදය යි.

සෝවාන් ඵලයට පත් වූ සිතේ ඉතිරි වන්නේ කාමරාග-ව්‍යාපාද-රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච-අවිජ්ජා යන සංයෝජන සත පමණි. මෙම ධර්ම පිළිබඳ දර්ශනය මෙ තැන් සිට ආරම්භ වන්නේ ය. එයට හේතු වන කරුණු දෙකකි. දර්ශනයට වැටී ක්‍රියා කිරීමෙන් ලැබූ චිත්ත සමාධියේ හා දර්ශනයේ හුරුව එකකි. එම දර්ශනය උපකාර වී මතුවූ අර්ථවත් ඵලවල පවතින වැදගත් කම අනික ය. මෙම හේතු දෙක ඉතිරි ව තිබෙන දියුණුව ලබා ගැනීම සඳහා ක්‍රියා කිරීමට අවධානය යොමු කරවන්නේ ය. මෙ තැන් සිට දියුණුව කරා ගමන් කරන සිතිවිලි උත්සාහයෙන් වුව ද නැවැත්විය නො හැකි ය. සෝවාන් වූ පුද්ගලයා ආත්ම සතක් කෙළවර වීමට මත්තෙන් සියළු කෙලෙස් නසා ලන්නේ එහෙයිනි. සෝවාන් ඵලයට පත් වූ පුද්ගලයාගේ සියළු කෘත්‍යයන් ලෝභ ද්වේෂ-මෝහ යන ධර්මවලින් මිදී ක්‍රියා කරන බැවින් ඔහුට සුගතිය විනා දුගතියක් නැත. එමෙන් ම එම සිතේ පවතින අහිතකර ධර්ම ස්වරූප දක ගැනීමට සිතේ සකස් වී තිබෙන සංසුන් කම උපකාර වේ. සිතේ ඉතිරි ව තිබෙන යම් කෙලෙස් කොටසක් වෙයි නම් එය දර්ශනය වන්නේ කාමරාග-ව්‍යාපාද යන ස්වරූපවලිනි. එම ස්වරූප සිතේ රැඳී තිබෙන්නේ කාමච්ඡන්ද-ව්‍යාපාද යන හේතුන් සිතේ පවතින බැවිනි. කාමරාග-ව්‍යාපාද යන කෙලෙස් ධර්ම පිළිබඳ වැටහීම, සකෘදගාමී මාර්ගයට වැටී සිටින බවට ලකුණකි. එම ධර්ම දර්ශනය වන්නේ නමුදු ඒවා ඉවත් කිරීමේ හැකියාව මොහුට නැත. එම ධර්ම ඉවත් වන තුරු දනෙන දේ හඳුනමින් සිටීම පමණක් මොහුට අයත් කෘත්‍යය වන්නේ ය.

ආරම්භයේ සිට මොහු අනුගමනය කළ ක්‍රියා මාර්ගය දනෙන දේ හඳුනමින් සිටීම පමණි. ඒකායන මාර්ගය වශයෙන් මෙය වෙන් වූයේ එබැවිනි. මෙසේ දනෙන සියළු දනීම් නුවණින් යුක්ත ව පරිහරණය කිරීම හේතු කොට ගෙන සිතේ පැවති කාමරාග-ව්‍යාපාද යන කෙලෙස් වේග දෙක හීනත්වයට පත් වන්නේ ය. ඒ හේතුවෙන් කලින් නො තිබූ සැනසිලි ස්වරූප උද වේ. එම ස්වරූප උද වීමේ සලකුණෙන් සකෘදගාමී ඵලය ලැබී ඇති බව වටහා ගන්නේ ය.

කලින් අයත් වූ සෝවාන් ඵලයේදී ඉවත් වූයේ කාමච්ඡන්දයට අයත් කාමරාගය ඉක්මවා ක්‍රියා කරන ලෝභය නමැති ලැබීමේ අදහස සකස් කරන ක්ලේශය හා ව්‍යාපාදය පදනම් කරගෙන සකස් වෙන සිත දූෂණය කිරීමේ ලක්ෂණයෙන් යුත් ද්වේෂය හා ඒවා නො පෙනෙන මෝහයයි. සකෘදගාමී ඵල අවස්ථාවේදී දුර්වල වූයේ ප්‍රිය නිමිත්ත ඇසුරේදී මතුවන ඇලී සිටීමේ කාමරාග නමැති කෙලෙස් ස්වරූපය යි. එය ද කාමය පදනම් කොට පහළ වන ගතියකි. ඒ සමග ම නිමිත්ත කෙරෙහි විරුද්ධ වන ගතිය වශයෙන් ක්‍රියා කරන ව්‍යාපාද ස්වරූපය සකෘදගාමී මාර්ග අවස්ථාවේදී ක්‍රියා කරන්නේ ද්වේෂ ස්වරූපයෙන් නො වේ. එහි ඇත්තේ නිමිත්ත කෙරෙහි රුචි නො වන ස්වභාවයක් පමණි. හීනත්වයට පත් වූ කාමරාගය මෙන් ම ව්‍යාපාදයෙන් මතු කරන්නා වූ අරුචි ස්වරූපය මෙහි තිබෙන ලක්ෂණය යි. සකෘදගාමී මාර්ගයේ දී දර්ශනයේ පැහැදිලි කම මතුවන ප්‍රමාණයට අනුව කාමරාග-ව්‍යාපාද යන සංයෝජන කොටස් දෙක හීනත්වයට පත් වී ගොස් සකෘදගාමී ඵලයේ හිමි කම ඇති වන්නේ ය.

කාම නැමති ධර්මය ක්‍රියා කරන්නේ උපාදන යන ඇලීම් ස්වරූපයෙනි. බුදුදහමේ උපාදන යනුවෙන් දක්වෙන්නේ කාන්දම් ස්වභාවය යි. මෙම ස්වභාවය සිතේ පවත්නා තාක් ඇලීමේ කෘත්‍යය නැවැත්විය නො හැකි ය. එම ඇලීම සිතෙන් පහ වූ බවට ලකුණු පහළ වන තුරු ආර්ය මාර්ගයට පිළිපන් සිත නො නැවතී ක්‍රියා කරයි. සකෘදගාමී ඵලයේදී කාමරාග-ව්‍යාපාද යන කෙලෙස් ශක්තිය දුබල විය. සෝවාන් ඵලයට පැමිණි අවස්ථාවේදී කාම ලෝකයට සත් වරක් ඒමට තිබූ අයිතිය සකෘදගාමී ඵලයට පත් වීමෙන් එක් වාරයකට සීමා විය. මෙ තැන් සිට ඉතිරි කෙලෙස් ඉවත් කර ගැනීම සඳහා දර්ශනයට යොමු වීම තවදුරටත් සිදු වේ. අමුතුවෙන් එහි කෙරෙන ක්‍රියා මාර්ග කිසිත් නැත. දනෙන දේ හඳුනමින් සිටීම පමණි. සිතේ කැළඹිලි ස්වරූපය ඉතා ම අඩු වී ඇති බැවින් මෙහිදී දර්ශනය පැහැදිලි ය. එබැවින් කාමරාග-ව්‍යාපාද ගතිවලින් ශේෂ ව රැඳී තිබෙන සියුම් කොටස් දක ගැනීමට හැකි ය. මෙම යොමු වීම අනාගාමී මාර්ගයට පත් වීම ය. අනාගාමී ඵලය යනු නැවත කාම භවයට සම්බන්ධ වීමේ ශක්තිය නැති කිරීමේ තත්ත්වය වේ. සෝවාන්-සකෘදගාමී-අනාගාමී

යන ඵල පිළිවෙලින් අයත් වීමෙන් සිදු වූයේ කාම භවය සමග තිබූ සබඳකම් සහමුලින් ඉවත් වීම ය. මෙතැන් සිට මොහුට හිමි වන්නේ ශුද්ධාවාස බ්‍රහ්ම ලෝක පමණි. එහි ද පැවැත්ම රැ දෙන්නේ සීමිත කාලයකට ය. එනම් රහත් ඵලය ලබා නිර්වාණයට පත් වෙන තුරු ය. මෙහිදී පැහැදිලි වන වැදගත් කරුණක් නම් සත්ව ජීවිතයේ රඳා පැවැත්ම කාම නමැති ශක්ති ස්වරූපය මත පවතින බවත්, හිමිකම කාමභවය බවත් ය. කාමය දෙදරුම් කැමෙන් පසු පැවතීමේ අයිතිය ද දෙදරුම් කන්නේ ය. සෝවාන් වීමෙන් ලබන්නා වූ කාම සුගතියේ පමණක් ජීවිත පැවැත්මේ අයිතිය අනාගාමී ඵලයට පැමිණීමෙන් පසු සම්පූර්ණයෙන්ම අත්හැරීමේ ස්වරූපයට පත් වීමෙන් මෙම කරුණ වඩාත් පැහැදිලි කෙරෙයි.

ලෝකයේ පැවැත්මට උපකාර වෙමින් පවතින මූල ශක්ති දෙක ධාතු-ධර්ම යන නම්වලින් හැඳින්වේ. එම ශක්ති දෙක එක්වී මතු කරන විවිධ ස්වරූපයන් හේතු කොට ගෙන විවිධ නිර්මාණ බිහි වෙයි. සත්වයා ද එයින් එක් නිර්මාණයකි. එම සත්ව ශක්තිය නිරුද්ධ කිරීමේ මාර්ගය ගැන විස්තර කිරීමේ දී අනාගාමී ඵල අවස්ථාවට පැමිණියෙමු. අනාගාමී ඵල අවස්ථාව නම් වන චිත්ත මට්ටම සත්වයාගේ පැවැත්ම හායන පක්ෂයට ගමන් කිරීමේදී මතුවන අවසාන සීමාව යි. මෙම සීමාවට පැමිණි ශක්තිය කාම භවය නමැති අයිතිය තුරන් කළ බව ද කීවෙමු. එයට හේතු වූයේ එම ජීවිතයේ තිබූ ධාතු-ධර්ම යන දෙකේ තිබූ සත්ව යන ඇලීම් ශක්තිය පැවැත්වීම සඳහා තිබූ බලය එක්තරා සීමාවකට පත් වීම ය. අනාගාමී ඵලයට පත් වූ සිතේ ඉතිරි වන්නේ රූපරාග-අරූපරාග-මාන-උද්ධච්ච අවිජ්ජා යන සංයෝජන හෙවත් බැඳීම් ශක්ති පස ය. මෙම ධර්ම ශක්ති පසේ පැවැත්මට හිමි වන්නේ ශුද්ධාවාස බ්‍රහ්ම ලෝකවල පවතින ධාතු ශක්තීන් පමණි.

මෙහිදී ධාතු ධර්ම යනු කුමක්දැයි පැහැදිලි විය යුත්තකි. ධාතු යනු දරන ශක්තියයි. ධර්ම යනු එම දරන ශක්තිය විසින් දරනු ලබන ශක්ති ස්වභාවය යි. දැනට ලෝකයේ සොයාගෙන තිබෙන සියුම් වස්තුව පරමාණුව යි. පරමාණුව කොටස් දෙකකින්

යුක්ත ය. එනම් එයට අයත් ශක්තිය හා එම ශක්තිය උසුලා දරා සිටීම ය. ශක්තිය දරා සිටීමේ සීමාව හා එම සීමාව සකස් වීම සඳහා සිදුවන කෘත්‍ය ස්වරූපය ධාතුව වශයෙන් ගැනේ. එම සීමාව තුළ එම කෘත්‍ය ස්වරූපයට යටත් වී පවතින ශක්ති ස්වරූපය ධර්ම නම් වේ. දළ වශයෙන් කියතොත් වතුර භාජනයක් ගත් කල භාජනයේ තිබෙන ජලය ධර්මය ලෙසද, භාජනය ධාතුව ලෙස ද ගත හැකි ය.

අනාගාමී ඵල සිතේ තැන්පත් වී ශේෂ ව තිබෙන රූපරාග ආදි සංයෝජන පිළිබඳ ව ඉහත සඳහන් කෙළෙමු. රූපරාග යනු රූපී බ්‍රහ්ම ලෝකය සිතට අරමුණු වන තත්ත්වයක් නො වේ. රූප යනු රූප්පණය හෙවත් වෙනසට පත් වීම ය. රාග යනු ඇලී සිටීම ය. අනාගාමී ඵලයේ සිටින තැනැත්තා රහත් මාර්ගයට පත් වන්නේ, එම තැනැත්තාගේ සිතේ මතු කරන විවිධ සැප වින්දන කෙරෙහි සිත ක්‍රියා කරන අයුරු දර්ශනය වන අවස්ථාවේදී ය. සිතෙහි කෙලෙස් නැති කිරීමේ අවධානයට යොමු වෙමින් මෙම දර්ශනය ලබන්නාගේ නුවණට සිතෙන් මතු වන වින්දනයන්ගේ වෙනස් වීමට හෙවත් රූප්පණයට තම සිත බැඳී පවතින බව දනෙනවා ඇත. රූපරාග යනු මෙම බැඳීම් ස්වරූපය වේ.

මෙම දර්ශනයට වැටී සිටින්නාගේ සිතට, සිතේ ඇති වන වේදනාවල වෙනස හෙවත් රූප්පණය නො දනෙන තත්ත්වයට පත් වන අවස්ථා තිබේ. එයට හේතුව සිත සියුම් තත්ත්වයට පත්වීමේ වැඩි කම යි. රූප්පණය නො දනෙන තත්ත්වයේ සිත පවත්නා අවස්ථාවේදී අරූප හෙවත් වෙනස නො දනීම හොඳ වශයෙන් ගෙන ඇලීම් ස්වරූපය මතුවන්නේ නම් එය අරූප රාගය නම් වේ. ඒ හැර අරූපී බ්‍රහ්මලෝකයක් සිතට අරමුණු වන තත්ත්වයක් එහි නො වේ. මෙම ස්වරූපය ලෞකික ධ්‍යාන සිතෙහි පවත්නා විටෙක යමකු චුත වුව හොත් ඔහුගේ සිතෙහි පවත්නා රූපරාග හෝ අරූපරාග යන චිත්ත මට්ටම් සමග සම්බන්ධ වන බ්‍රහ්ම ලෝකයක ඔහුගේ උපත සිදු වේ. අනාගාමී පුද්ගලයා රූපරාග-අරූපරාග යන චිත්ත ස්වරූපයන් දකීමේ අවස්ථාවේදී නුවණ ඉදිරිපත් වී එම සිතේ පවත්නා අනර්ථකාමී

අයිතිවාසිකම් වැටහෙන්නේ ය. එනම් සසරට බඳවන ශක්තිය එම සිතේ ද පවතින බව වැටහීම ය. එතැන් සිට ඔහු සිත එයින් මුදවා ගැනීමට යුහුසුලු වන්නේ ය. දැනෙන දේ හඳුනමින් සිටීම මෙහිදී ද අනුගමනය කරන එක ම මාර්ගය වේ. එම හේතුවෙන් ඇලීම් ස්වරූපය ඉවත් වේ. නිමිත්ත හඳුනමින් සිටීමේ තත්වයට පමණක් සිත පත්වන්නේ ය. දැනෙන නිමිත්ත හැඳිනීමට පමණක් සීමා වූ මෙම සිතේ සසරට බඳවන සංයෝජන වශයෙන් සැලකෙන මාන-උද්ධච්ච-අවිජ්ජා යන ධර්ම ස්වරූප තුන ද පවතී. දැනෙන වින්දන හැඳිනීමෙන් පමණක් යුක්තව සිටින නිසා ඔහුට එම වින්දනවල පවතින අනිත්‍ය-දුක්ඛ-අනාත්ම යන ස්වභාවයන් මතුවී පෙනේ. මෙහි අනිත්‍ය යනු දැනෙන වින්දන ස්වරූපය ඒ ආකාරයෙන් ම නැවත හමු නො වීම හා අනතුරුව දැනෙන වින්දනය අන්‍ය ස්වරූපයකින් මතුවීම ය. මෙහි දුක්ඛ යනු මතුවන සියළු වින්දනවල තිබූ තත්ත්වය වෙනස් වී නැති වී යාම යි.

දැනෙන සෑම වින්දනයක් පාසා ම මෙම ස්වරූපය ක්‍රියාත්මක වන බව වැටහීම දුක්ඛ ලක්ෂණ තේරුම් ගැනීම ය. ආත්ම යනු දැනෙන්නා වූ එක ද වින්දනයක් හෝ තමාට අවශ්‍ය ලෙසින් පරිහරණය කිරීම සඳහා පවත්වා ගැනීමට බැරි කම ය. මෙම වැටහීමට අනුව සිතේ මතුවන තීරණය මාන-උද්ධච්ච-අවිජ්ජා කැඩීමට හේතු වේ. "මාන" යනු මිම්ම සෙවීම යි. සිතේ මතුවන වින්දනවල ප්‍රමාණ සෙවීමෙන් ප්‍රයෝජනයක් නොමැති බව මොහුගේ සිත තීරණය කරනු ඇත. එයට හේතුව තමා බලාපොරොත්තු වන වින්දනය එසේ ම පවත්වා ගැනීමට නො හැකි බව ය. එ බැවින් මානය නමැති මිම්ම සෙවීම ඉතුරු නො වේ. "උද්ධච්ච" යනු සැප සෙවීම සඳහා විවිධ නිමිතිවලට සිත පැනීම ය. කුමන නිමිත්තකට පැන්නේ වී නමුදු ලැබෙන්නා වූ වින්දනය පවත්වා ගැනීමට නො හැකි බැවින් සැපයට හේතු වන නිමිති සෙවීම නිරර්ථක බව මොහු වටහා ගනී. උද්ධච්ච බිඳී යාම මෙහි සිදු වී ඇත. "අවිජ්ජා" යනු සැප වින්දනය සොයමින් ඒවා පවත්වා ගැනීම සඳහා උපක්‍රම හා උත්සාහය යෙදීම ය. බලාපොරොත්තු වන සැප වින්දන පවත්වා ගත හැකි තත්ත්වයක නො පවතින බව වටහා ගැනීම නිසා දුක නැති කර ගැනීම සඳහා සැප වේදනා සෙවීම ඔහුගෙන් තුරන් වේ. ඒ අවිජ්

ජාව නැති වීම ය. මෙම සංයෝජන ධර්ම පස එලෙසින් කැඩී යාම නිසා සිත නික්ලේශී තත්ත්වයට පත් වී ඇත. එම නිසා මෙම සිත රහත් සිත නමින් හැඳින්වේ.

## කාමයන් කෙරෙහි ඇලීම අත්හළ බව (කාමේසු විනෙය්‍ය ගේධං)

ලබන ලද දර්ශනයේ උපකාරයෙන් කාම-රූප-අරූප යන භවත්‍රය කෙරෙහි ඇලෙන යම් කාමයක් තිබුණි නම් එකී සියල්ල මෙහිදී නැති වී තිබේ. මෙම සිද්ධිය හේතු කොට ගෙන මෙම සිතට ලැබෙන අයිතිය පෙන්වන්නේ "නහිජාතු ගබ්භසෙය්‍යං පුනරේති" යනුවෙනි. එයින් අදහස් කෙරෙන්නේ නැවත ගැබක පිළිසිඳ නො ගන්නා බවය. මෙතෙක් කළ විස්තරයෙන් සිතේ තිබූ කෙලෙස් සියල්ල ඉවත් කර ලෝකීය සම්බන්ධයෙන් ඉවත් වී සියළු ගේධයන් නැති කළ බව පැහැදිලි විය. ගේධයන් නැති කළ හේතුව නිසා නැවත ගැබක පිහිටීමේ ශක්තිය අවසන් වූ බව මෙහි සඳහන් වී තිබේ. මෙහි ගැබ වශයෙන් කියවෙන්නේ මවු ගැබ පමණක් නො වේ. ගැබ යනු සීමාවකි. ප්‍රතිසන්ධිය ගන්නා සත්වයා කුමන හෝ ගැබක පිළිසිඳ ගත යුතු ය. අණ්ඩජ-ජලාබුජ-සංසේදජ-ඕපපාතික යනුවෙන් පිළිසිඳ ගැනීම් ක්‍රම සතරකි. මෙම සතර ක්‍රමයේදී ම ගැබක් හෙවත් සීමාවක් ඇසුරු කොට සිදු විය යුතු ය. මෙම සීමාව පෙන්වන්නේ පරමාණුව හෙවත් රූපකලාපයකිනි. පරමාණුව තුළ රූප්පණ ගොඩක් ක්‍රියාත්මක වන බැවින් එය රූප කලාපය නමින් හැඳින්විය යුතු ය. පරමාණු සම්බන්ධයන් තුරන් වූ නිර්මාණයක් තුන්ලෝකයේ ම නැත. විශ්වයේ විවිධ සීමා තුළ පවතින ලෝකවල තිබෙන පරමාණු තුළ ක්‍රියා කරන ශක්ති විවිධ ය. පරමාණුවක පවතින ශක්ති කොටස් හතරකි. තාප-විද්‍යුත්-කාන්දම්-රසායන යනු එම ශක්ති සතර ය. පරමාණුවල විවිධත්වය ඇති කරන්නේ ඒවා තුළ ගැබ් වී තිබෙන ශක්ති ස්වරූප සතරේ අඩු වැඩිකම්වලට අනුව ය. සතර අපාය වශයෙන් වෙන් වූ කොටසේ පවතින පරමාණුවල තාපශක්තිය වැඩි බැවින් විද්‍යුත්-කාන්දම්-රසායන ද එම ප්‍රමාණය අනුව ම ගනී. සුගති වශයෙන් සැලකෙන මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම යන ස්ථාන සැපයෙන් යුක්ත ස්ථාන වශයෙන් පිළිගෙන තිබේ. එයට හේතුව එම පෙදෙස්වල පවතින පරමාණුවල තාප ශක්තිය

අඩු කම ය. සත්ව සන්තානයේ පවතින උපාදන නමැති ක්‍රියා ස්වරූපය හේතු කොට ගෙන භවයෙන් භවයට සංසරණය වන්නා වූ උපත් පරම්පරාවක හිමිකම ලැබී තිබෙන බව බුද්ධ දේශනාව යි.

උපාදන යනු කාන්දම් ශක්තිය බව කලින් ද සදහන් කෙළෙමු. තුන් ලෝකයේ ම පවතින සියළු පරමාණු තුළ එක්තරා ප්‍රමාණයකින් මෙම කාන්දම් ශක්තිය ගැබ් වී තිබෙන බව තේරුම් ගත යුතු ය. කාන්දමකින් එයට සමාන කාන්දමක් සොලවා ලීම එහි ස්වභාවය යි. කෙලෙස් සහිත පුද්ගලයාගෙන් කෙරෙන්නා වූ පාපී ක්‍රියා හේතු කොට ගෙන ඔහු අපායට යන බව දේශනාවේ සදහන් වේ. එම යාම ඔහුගෙන් සිදු වෙනවා නොව එම පුද්ගලයාගේ සිතේ සකස් වී ඇති උපාදන හෙවත් කාන්දම් ශක්තියට අනුව අපායේ පවතින සමාන කාන්දම් ශක්තියක් සම්බන්ධ වී ක්‍රියාව ඇරඹීම ය සිදු වන්නේ. දුගතියේ පවතින කාන්දම් ශක්තියට සමාන උපාදනය සකස් වන්නේ ලෝභ-ද්වේෂ-මෝහ සිතට එක්වීමෙනි. සත්වයකුගේ ආයුෂ හීන වී මරණාසන්න අවස්ථාවට පැමිණි විට ඔහුගේ සිත ක්‍රියාත්මක වන්නේ මනින්ද්‍රිය පමණක් ඇසුරු කර ගෙන ය. ඉන්ද්‍රියයක් උපකාරි වී සිතක පහළ වීමේ න්‍යායය පංචස්කන්ධ විස්තරයේදී පැහැදිලි කෙළෙමු. මනින්ද්‍රිය උපකාර වී සිතේ පහළ වීම සිදු වන්නේ ද ඒ අයුරින්ම ය. මරණාසන්න අවස්ථාවේ ඇති වන චුති චිත්තය ලෙස සලකන්නේ ජීවිතයක අන්තිම සිත පහළ වූ අවස්ථාව යි. එවිට එම ජීවිතයේ නැවත සිත් පහළ වීම කරවන ශක්තිය අවසාන ය. එම සිත අවසන් වූ අවස්ථාවේ නැවත සිතක් පහළ කිරීමට අවශ්‍ය ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය චුති චිත්තය උපන් වේගය පදනම් කරගෙන මනෝධාතුවේ රූප-වේදනා-සංඥ-සංඛාර යන අවස්ථා සතරකින් ක්‍රියාත්මක වේ. ජීවිතයේ කරන ලද කුසලාකුසල ක්‍රියාවල උපකාරයෙන් තැන්පත් වී තිබුණා වූ උපාදනයේ "සාමාන්‍යය" (ඇවරේජ්) මෙහි සකස් වන සංඛාර ශක්තිය තුළ ඇතුළත් ය. එම සංඛාර ශක්තිය විඤ්ඤාණ වීම සඳහා එම සිරුර තුළ පරමාණු නැති බැවින් ඊට සමාන ශක්තිය ඇති පෙදෙසක තිබෙන පරමාණුවක් තුළ පවතින කාන්දම් ශක්තිය සෙලවේ. එම සෙලවීම "ප්‍රතිසන්ධි විඤ්ඤාණ" නම් වන්නේ ය. මෙම ප්‍රතිසන්ධිය ලැබුවේ ගැබක ය. එනම් පරමාණු ගැබක ය.

සන්තාන ගත ව තිබූ අකුසල් ධර්ම ශක්තිය අපාය නමැති ස්ථානයේ තිබූ තේජසින් වැඩි ශක්ති සමග සම්බන්ධ වූයේ සිතේ තිබූ උපාදන බලයේ සම්බන්ධතාව නිසා ය. මෙය පරමාණුවක පවතින ඉහළ තේජස් මට්ටමක් ප්‍රයෝජනයට ගැනීමේ අවස්ථාවකි. එය අකුශල ශක්තියකින් ම සිදුවන්නකි. උපාදන ශක්තියේ පවතින වැඩි තේජස් මට්ටම් අපායට හිමි වන අතර තේජස අඩු වී සකස් වන උපාදනයට අනුව සුගති වශයෙන් නම් කෙරෙන ස්ථානවල පවතින පරමාණු සමග සම්බන්ධතා ඇතිවන්නේ ද මෙ ලෙසිනි. මෙකී සියලු අයිතිවාසිකම් රැඳී තිබෙන්නේ සිතක සකස් වන උපාදන ශක්තිය මත ය. දර්ශනයේ උපකාරයෙන් කාරණය තේරුම් ගත් තැනැත්තා සෝවාන්-සකෘදගාමී-අනාගාමී-අරහත් යන අවස්ථා සතරකදී උපාදනය මූලෝච්ඡින්න කරයි. මෙහිදී නැති වූයේ ලෝකීය අයිතිවාසිකම් සමග සම්බන්ධකම් පැවත්වෙන කාන්දම් හෙවත් උපාදනය යි. කාන්දමෙන් තොර වූ ශක්තියක් පිළිගැනීමට කාන්දමින් යුක්ත වූ පරමාණුවකට හැකිකමක් නැත. එබැවින් මෙම සිත ගැබක් සමග සම්බන්ධ වීමක් නො කෙරේ. "නහිජාතු ගබ්භසෙය්‍යං පුනරෙති" යනුවෙන් සඳහන් වූයේ එහෙයිනි.

මෙතෙක් විස්තර වූයේ දුක් නිවා ලන චිත්ත මට්ටම වූ අත්ථ කුසලය සකස් කිරීමේ හා එයින් මතුවන අර්ථවත් ඵල පිළිබඳ විස්තරයකි. භාවනාවේ යෙදී කෙලෙස් තැවීම සඳහා වනගත වූ භික්ෂූන් වහන්සේලා පිරිසකට පැමිණි බාහිර උවදුරු වනසා ලීම සඳහා එම පිරිසට බුදුපියාණන් වහන්සේ සජ්ඣායනා කිරීම සඳහා කරණීය මෙත්ත සූත්‍රය උගන්වන ලදී. සූත්‍රය සජ් ඣායනා කිරීමේදී භික්ෂූන්ට කරදර පැමිණවූ අමනුෂ්‍යයෝ එය අසා සියළු විරුද්ධකම් අත්හිටුවා භික්ෂූන් පිළිබඳ තිබූ සියළු සැක දුරුකර ගත්හ.

සූත්‍රය සජ්ඣායනා කළ පමණින් එවැනි චිත්ත පරිවර්තනයක් වීමට ප්‍රමාණවත් කරුණු එහි අඩංගු වී ඇති බව එයින් පැහැදිලි ය. සිතක පවතින දුර්ගුණ ඉවත් කර ජීවිතය සනසන උසස් ගති සිතට පිළිවෙලින් එක් කරන අයුරු එහි ඇතුළත් වීම සූත්‍රය අසන්නාගේ ද චිත්තමෝදනයට හේතුවන ලක්ෂණයකි.

එහි ඇතුළත් ධර්ම පිළිවෙල ඉගෙන ගෙන ඊට අනුව පිළිවෙත් පිරූ භික්ෂු පිරිස කෙලෙස් නසා සදකාලික නිවීමට පත් වූ බව සඳහන් වේ. එද එම ප්‍රතිඵල මතුකිරීමට සමත් වූ කරුණු එම සූත්‍රයේ කිසිදු අඩුවක් නැති ව අදත් පවතින බව විමසිල්ලෙන් විස්තරය බැලීමෙන් වටහාගත හැකි ය.

එහෙත් එද ධර්මය ඇසීමට මිනිසුන් උනන්දු වූයේ පරිහරණය කර ප්‍රයෝජනය ගන්නා අදහසිනි. එම අදහස අද සිත් තුළ මැකී තිබෙන බව ඔවුන් ධර්මයෙන් ගන්නා ප්‍රයෝජන දෙස බලන විට පැහැදිලි ය. බුදු දහම කීමට හා ඇසීමට පමණක් අද සීමා වී තිබෙන බව පැහැදිලි කරුණකි.

ජීවිතය ධර්ම ගොඩකි. ධර්ම ගොනුවේ ක්‍රියා වේගය නො නැවතී පැවතීම ජීවත් වීම යනුවෙන් නම් කරයි. එයින් ලබන ප්‍රතිඵල සතුටුදායක වී නැති බව ජීවිතවලින් විඳවන පීඩාවන් දෙස බලන විට පැහැදිලි ය. බුදු දහමේ උගන්වන්නේ පීඩාවන්ගෙන් තොර වූ සැප වින්දනය ලබා ගැනීම සඳහා ධර්ම පරිහරණය කිරීමේ මාර්ගයකි. එම මාර්ගය තේරුම් ගෙන ධර්මය පරිහරණය කරන්නා බුදු දහමේ අධ්‍යාත්මය හෙවත් එහි ඇති අර්ථවත් කොටස ප්‍රයෝජනයට ගන්නා කෙනෙක් වන්නේ ය. කෙලෙස් දහය නිවා ජීවිතය පරිහරණය කරන්නෙක් වන්නේ ය. සදකාලික නිවීමට පත්වන්නේ ය.

ISBN 955 – 8414 – 04 – 2

මිල රු. 75/-

ශ්‍රී කල්‍යාණධම් ග්‍රන්ථකාර මණ්ඩලය

417, බෞද්ධාලෝක මාවත,

කොළඹ - 7.

දු: ක:- 696494